# කතෝලික ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 10 ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)




ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

# කතෝලික ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 10 ශ්‍රේණිය

(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

කතෝලික ධර්මය

10 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015

C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: ......................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය :
මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** :
- ගරු කාල්ටන් ද සිල්වා පියතුමා
  කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
- ගරු රෙක්ස් කොන්ස්ටන්ටයින් පියතුමා
  සහකාර ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය** :

- ශාස්ත්‍රපති ගරු ජූඩ් දසනායක පියතුමා, (කථිකාචාර්ය, බිංගිරිය විද්‍යා පීඨය)
- ශාස්ත්‍රපති එස්. ජී. කේ. ඩී. එල්. සී. ප්‍රසාද් මහතා
  (ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම)
- දුෂ්මන්ති ද සිල්වා මෙනෙවිය (ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මීනුවන්ගොඩ)
- ඩී. අයි. ජෝසප් මෙනෙවිය (ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කොළඹ)
- ශාස්ත්‍රවේදී ටී.අයි. රන්ගනායගම් මහතා
  (ගුරුසේවය - ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලය, කොළඹ 03)
- ඒන්ජල් මේරි මෙනෙවිය (ගුරුසේවය -ශාන්ත අන්තෝනි දෙමළ විද්‍යාලය, කොළඹ 14)
- ඩබ්. කේ. එම්. අයි. එස්. කේ. ප්‍රනාන්දු මහත්මිය (විශ්‍රාමික ගුරු උපදේශිකා)
- ශාස්ත්‍රවේදී ටී. ජේ. පෝල් ඇන්තනි මහත්මිය (විශ්‍රාමික විදුහල්පතිනිය)
- ශාස්ත්‍රවේදී එන්. එෆ්. රාජයෝගිනි මෙනෙවිය
  (ගුරුසේවය - සියලු සාන්තුවරයින්ගේ බාලිකා විද්‍යාලය, කොළඹ 10)

**කතෝලික උපදේශක මණ්ඩලය :**

- අති උතුම් මැක්ස්වෙල් සිල්වා රදගුරුතුමා
  සභාපති - අධ්‍යාපන, ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම
- අති උතුම් ජෝශප් පොන්නයියා රදගුරුතුමා
  උපසභාපති - අධ්‍යාපන, ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම
- අතිගරු අයිවන් පෙරේරා පියතුමා කතෝලික පාසල් පිළිබඳ ජාතික අධ්‍යක්ෂ
- ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා බයිබල් හා ධර්මෝපදේශ පිළිබඳ ජාතික අධ්‍යක්ෂ
- ආචාර්ය ගරු හෙන්රි සිල්වා පියතුමා කථිකාචාර්ය, ක්‍රිස්තියානි සංස්කෘතික දෙපාර්තමේන්තුව, කැලණිය විශ්වවිද්‍යාලය
- ආචාර්ය ගරු ඥාණමුත්තු හෙක්ටර් පිලේන්ද්‍රන් පියතුමා ප්‍රධානි - බටහිර සම්භාව්‍ය සංස්කෘතික හා ක්‍රිස්තියානි හා ඉස්ලාමීය සංස්කෘතික දෙපාර්තමේන්තුව, යාපනය විශ්ව විද්‍යාලය
- ගරු ග්‍රෙගරි එල්. ප්‍රනාන්දු පියතුමා සහකාර අධ්‍යක්ෂ - ආගමික අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

කතෝලික ධර්මයට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගනිමින් පාසල් අධ්‍යාපනය හරහා එම නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසමින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් හිස පුරවාගෙන දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථ ලබා ගැනීම පමණක් නොසෑහේ. හිස පමණක් පෝෂණය කරන අධ්‍යාපන ක්‍රමයක් සාර්ථක අධ්‍යාපන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකිය. අධ්‍යාපනය තුළින් හදවත හා අත ද පෝෂණය කළ යුතුය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය පෙළ පොතට හා විෂය නිර්දේශයට අනුරූපව ලියා ඇත. එබැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම සීමාවන් නොඉක්මවා කටයුතු සංවිධානය කර ගැනීමට වගබලා ගත යුතුය.

- පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබාදෙමින් එය හොඳින් සිදු කරන්න.
- පාඩමට ප්‍රවේශවීමට හා පාඩම සංවර්ධනය සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් පරිශීලනය කරන්න.
- සුදුසු පරිදි කණ්ඩායම් කර කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට උනන්දු වන්න.
- මෙහි දක්වා ඇති ඉගෙනුම් පලවලින් සිසුන්ගේ ජීවිත පොහොනි කරලීමට කටයුතු කරන්න.
- සිසුන්ගේ විශ්වාසය වර්ධනය කිරීමට කටයුතු කරන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකිය. එහෙත් නිපුණතාව හා නිපුණතා මට්ටමෙන් බැහැර නොවිය යුතුය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ක්‍රිස්තියානි ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදුකළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතුය. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී එකවිට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙන හෙයින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයුම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස්කර ගන්න. ඇගයීම් සිදුකිරීමේ දී ලකුණු ලබා දෙන නිර්ණායක පිළිබඳ කල්වේලාසන සිසුන් දැනුවත් කරන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදුකිරීමට යෝජිත ය. ඒ සඳහා උපදෙස් විද්‍යුත්පති මගින් ද , විෂය භාර ගුරු භවතා පංති කවවලදී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතුය.

**කථිකාචාර්ය, කාල්ටන් ද සිල්වා පියතුමා**
**ව්‍යාපෘති නායක**

| පටුන | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | i |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශය | vi – xxv |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 – 84 |
| විවිධ සහාය | 85 |

# විෂය නිර්දේශය

## විෂය හැඳින්වීම

ආගම යනු ජීවිතයයි. එහෙයින් ජීවිතයෙන් ආගම වෙන් කළ නොහැකිය. සෑම ආගමකම පරමාර්ථය සදාචාරසම්පන්න ගුණගරුක සමාජයක් ගොඩ නැගීමයි. එම අරමුණත් පෙරදැරි කරගෙන නව විෂයමාලා ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන් අතර එහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ සිසුන් තුළ නිපුණතා ගොඩනැගීමයි. නිපුණතාවක් යනු දැනුම, ආකල්ප කුසලතා හා අන්තර් පුද්ගල හැකියා ඒකරාශී කරගත් ජීවිත පුරුද්දකි. අධ්‍යාපන දාර්ශනිකයන් අන්තර් පුද්ගල හැකියා යනුවෙන් අර්ථ දක්වනුයේ වෙන කිසිවක් නොව කිතුණු අප "ප්‍රේමය" යනුවෙන් හඳුන්වනු ලබන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මූලික ඉගැන්වීමයි. එබැවින් උත්තම ගුරු දේවයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබා, කිතුණු ආකල්ප සංවර්ධනය කරගෙන, කුසලතා වලින් පරිපූර්ණ වී, ප්‍රේමය මත ගොඩනැගුණු ජීවිත පුරුද්දක් ඇති කිරීම කතෝලික විෂයෙහි මෙම නව සංස්කරණ මගින් ඉලක්ක කෙරේ.

කිතුණු ඉගැන්වීම්වල පදනම ශුද්ධ බයිබලයයි. මන්ද යත් කිතුණු විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය ශුද්ධ බයිබලීය ඉගැන්වීම් මත පදනම් වී ඇත. එබැවින් මෙම කතෝලික විෂය නිර්දේශයෙහි පළමු තේමාව වන්නේ ශුද්ධ බයිබලයයි. තවද භාග්‍යවත් දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසින් නිර්දේශිත විශේෂ කමිටුවක් විසින් සම්පාදනය කරනු ලැබූ " කතෝලික සභාවේ ධර්මෝපදේශය" (Catechism of the Catholic Church) නමැති ග්‍රන්ථයෙහි තේමාවන්ට අනුකූලව ඉතිරි තේමා 4 ගොනුකර ඇත. ඒ අනුව මෙම විෂය නිර්දේශයේ පහත සඳහන් තේමා පහ ඇතුළත් කර ඇත.

1. ශුද්ධ බයිබලය
2. ත්‍රිත්වික දෙවියන් වහන්සේ
3. විශ්වාසයේ ජීවිතයට ශක්තිය
4. විශ්වාසයේ ජීවිතය ක්‍රියාත්මක කිරීම
5. යාච්ඤාවේ ජීවිතය

එම තේමා පහ අනුව නිපුණතා පහක් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා විෂය නිර්දේශයෙන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

කතෝලික විෂය නිර්දේශයේ දක්වා ඇති නිපුණතා සාක්ෂාත් කර ගනිමින් අනාගතයේ දී වැඩිහිටි කතෝලික නිපුණයෙකු ලෙස ක්‍රියාකාරී වීමට වර්තමාන දරුවා ගොඩනැගීම අවශ්‍ය වේ. ඒ සඳහා 6-9 ශ්‍රේණිවල දී මූලික ජීවිත පුරුද්දක් ඇති කර 10-11 ශ්‍රේණිවල දී පූර්ණ කතෝලික බැතිමතෙකු ලෙස තිබිය යුතු නිපුණතා ගොඩනැගීම මෙයින් අපේක්ෂා කෙරේ. මන්ද 12- 13 ශ්‍රේණිවල කලා විෂය ධාරාවෙන් ක්‍රිස්තියානි ධර්මය හෝ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය තෝරා ගන්නා අතළොස්සක් හැර ඉතිරි කතෝලික බහුතරයේ ආගමික දැනුම අ.පො.ස. (සා/පෙළ) විෂය නිර්දේශයට බොහෝවිට සීමා වන බැවිනි.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කරමින්, අදාළ නිපුණතා සිසුන් තුළ ගොඩනැගීමට ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාකාරකම් නිර්මාණය කිරීම, සම්පත් දායකයෙකු ලෙස කටයුතු කරන ගුරුවරයාගේ වගකීමයි.

ආගම විෂය උගන්වන ගුරුවරයා විශේෂයෙන් එම ධර්මතා පිළිඹිබු කරන කැඩපතක් විය යුතු ය. එහෙයින් පළමුව ගුරුවරයා සදාචාර සම්පන්න ජීවිතයක් ගත කරන, ආගමික සංකල්ප තමන් තුළ ප්‍රගුණ කරගත් පුද්ගලයෙකු බව ශිෂ්‍යයාට අවබෝධ විය යුතුය.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

### ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුම්වත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත්වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වු ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## පොදු නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**
   ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. **ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**
   පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

6. **ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**
   සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. **ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**
   සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂයයේ අරමුණු

1. තම ජීවිතය ගොඩනගා ගැනීමට ශුද්ධ බයිබලය පිටිවහලක් කර ගනියි.

2. මැවිල්ලේ උතුම්ම මැවිල්ල වන මනුෂ්‍යයාගේ මැවුම්කරුවාණන්, දෙවියන් වහන්සේ බව හඳුනා ගනියි.

3. ක්‍රිස්තුන් වහන්සේගේ දූත කාර්යය හා උත්ථානයේ අත්දැකීම පිළිගෙන පරිනත කිතුණු ජීවිතයක් ගත කරයි.

4. දේව වාක්‍යය, ප්‍රසාද නිධාන හා ජනවන්දනාව තුළින් පෝෂණය ලබා සමාජය තුළ සාක්ෂි දරයි.

5. ධර්මය ඉගෙනීම හා ජීවත්වීම එකම ක්‍රියාවලියක් බව අවබෝධ කර ගනියි.

6. දේව පණත් හා කන්ද උඩ දේශනය තුළ ගැබ්ව ඇති කිතුණු සදාචාරමය ඉගැන්වීම් පදනම් කරගෙන ජීවත් වෙයි.

7. යාච්ඤාවේ බලයෙන් ශක්තිමත් වී දේව වරප්‍රසාද අත්දකියි.

8. ක්‍රිස්තුන් වහන්සේගේ අසීමිත ප්‍රේමය සමාජය තුළ පතුරුවාලීමට ක්‍රියා කරයි.

9. තමා අවට ස්වභාවික පරිසරය දෙවියන් වහන්සේ ගෙන් ලද තිළිණයක් බව පිළිගෙන එය සුරැකීමටත් සංවර්ධනය කිරීමටත් අවශ්‍ය හැකියාව හා දැනුම වර්ධනය කරගනියි.

10. සාරධර්ම සුරකිමින් මානව සබඳතා ගොඩනගන අතර, කිතුණු අනන්‍යතාවය තුළ සහජීවනයෙන් යුතු සමාජයක් බිහිකරලීමට දායක වෙයි.

11. කිතුණු විශ්වාසය රැක ගනිමින්, සෑම ආගමකටම ගරු කිරීමට පුරුදු වෙයි.

12. ශ්‍රී ලාංකික පුරවැසියකු වශයෙන් තම රට කෙරෙහි ආදරයක් හා ගෞරවයක් ජනිත කර ගනියි.

## විෂය අදාළ නිපුණතා

1. ශුද්ධ බයිබලය පිළිබඳව අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේදී ඵලදායීව භාවිත කරයි.

2. දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

3. දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී පූර්ණ කිතුණු ජීවිතයකට සාක්ෂි දරයි.

4. දේව පණත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

5. යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමඟ ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායීව භාවිත කරයි. | 10.1.1 එදිනෙදා ජීවිත සිදුවීම් විශ්වාසයේ ඇසින් අර්ථකථනය කරයි. | **1 පාඩම - පුරාණ ගිවිසුමේ පොත් වර්ගීකරණය**<br>• **ජීවන සහා සම්ප්‍රදාය**<br>• පොත් 46 කි.<br>• කොටස් 05 කි.<br>1 නීති පොත් 05<br>උත්පත්ති, නික්මයාම, ලෙවී, ගණන් කථාව, ද්විතීය නීති සංග්‍රහය<br>• පංච පුස්තකයට කියන වෙනත් නම් (ව්‍යවස්ථාවලිය, මෝසෙස්ගේ ව්‍යස්ථාව, ටෝරා)<br>2 ඉතිහාස පොත් 16<br>ජෝෂුවා, වීරාවලිය, රූත් කථාව, 1 සාමුවෙල්, 2 සාමුවෙල්, 1 රාජාවලිය, 2 රාජාවලිය, 1 වංශාවලිය, 2 වංශාවලිය, එස්රා, නෙහෙමියා, තෝබිත්, ජූඩිත්, එස්තර්, 1 මකබි, 2 මකබි<br>3 ප්‍රඥා සාහිත්‍යය පොත් 07<br>ජෝබ්, ගීතාවලිය, හිතෝපදේශය, ධර්මදේශකයා, ප්‍රේම ගී, ප්‍රඥාව, සිරාක්<br>4 දිවැසිවර ග්‍රන්ථ 17<br>යෙසායා, ජෙරමියා, විලාප ගී, බාරුක්, එසකියෙල්, හොසියා, ජෝවෙල්, ආමොස්, ඔබදියා, ජෝනා, මීකා, නාහුම්, හබකුක්. ශෙපනියා, හග්ගායි, සෙකරියා, මලාකි<br>5 එළිදරව්ව සාහිත්‍ය පොත් 01 - දානියෙල් පොත<br>- ඉතිහාස පොත්<br>- ඉතිහාස පොත්වල ඇත්තේ ගැලවීමේ/ ආගමික ඉතිහාසයකි.<br>- ආගමික ඉතිහාසය යනු කුමක්ද ?<br>- ගිවිසුමට පක්ෂපාතීවීම තුළ දේව ආශිර්වාදය ද ගිවිසුමට පිටුපෑම තුළ වැටීම හෝ නැගීම ද (පුද්ගලයෙකුගේ හෝ ජාතියේ) දක්නට ලැබේ.<br>- රූත් හා එස්තර් කාන්තාවන්ගේ නමින් ඇති පොත් 2කි. | • පුරාණ ගිවිසුමේ පොත් නිවැරදි ව වර්ගීකරණය කරයි.<br>• දස පණත අනුව දිවි ගෙවිය යුතු බව පිළිගනියි.<br>• පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත් පිළිබඳව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• එදිනෙදා ජීවිත සිද්ධීන් තුළින් දෙවියන් වහන්සේව අත්දකියි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා සහයෝගය ලබා දෙයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.1.2 අපෝස්තලික සභාවේ ලක්ෂණ අනුකරණය කරයි. | 2 පාඩම - නව ගිවිසුමේ පොත් වර්ගීකරණය<br>• පොත් කාණ්ඩ 03කි.<br>• සුබාරංචි පොත් 4 හා ක්‍රියා පොත ( මතෙව්, මාක්, ලූක්, ජුවාම්, ක්‍රියා)<br>• හසුන් 21 (හසුන් 21 නම් කරන්න)<br>• එළිදරව් සාහිත්‍යය 01 (එළිදරව් පොත)<br>• ක්‍රියා පොත<br>• කෙටි හැඳින්වීම (කතුවරයා, පිළිගැන්වීම)<br>• කාලය හා ස්ථානය<br>• ක්‍රියා පොතේ සැකිල්ල | • නව ගිවිසුමේ පොත් නිවැරදි ව වර්ගීකරණය කරයි.<br>• දෙවියන් වහන්සේගේ මිතුරෙකු විය යුතු බව පිළිගනියි.<br>• අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත පිළිබඳ ව ඉදිරිපත් කිරීමක් කරයි.<br>• සුබාරංචිය අන් අය වෙත ගෙනයයි.<br>• කණ්ඩායම තුළ ප්‍රේමයෙන් කටයුතු කරයි. | 02 |
| | 10.1.3 තම ලේඛන හැකියාවන් ශුභාරංචිය අන් අය වෙත ගෙන යාමට භාවිත කරයි. | 3 පාඩම - සංදේශ වර්ගීකරණය<br>• ප්‍රධාන කාණ්ඩ 2 කි.<br>1. පාවුලුතුමාගේ ලිපි<br>2. වෙනත්<br>• පාවුලුතුමාගේ ලිපි කොටස් 3කි.<br>1. පාවුලුතුමා විසින්ම ලියූ ලිපි - (7)<br>(1 තෙසලෝනික, පිලිප්පි, 1 කොරින්ති, 2 කොරින්ති, ගලාති, රෝම, පිලමොන්)<br>2. ද්විතීය පාවුලු ලිපි - (2)<br>(කොලොස්සි, එපීස)<br>3. ආරූඪ කතෘත්වය - (4)<br>2තෙසලෝනික, තිතස්, 1 තිමති, 2 තිමති<br>(වර්ගීකරණය පමණක් දැනගැනීම ප්‍රමාණවත් වේ.) | • නව ගිවිසුමේ හසුන් වර්ගීකරණය කරයි.<br>• ශු. පාවුලු තුමාගේ ලේඛන දායකත්වය අගය කරයි.<br>• සන්දේශ පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් එළිදක්වයි.<br>• තම ලේඛන හැකියාවන් භාවිත කරමින්, ශුභාරංචිය අන් අය වෙත ගෙන යයි.<br>• කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.1.4 කිතුනු සංකේතවල වටිනාකම් අගය කරයි. | **4 පාඩම - එළිදරව් සාහිත්‍යය**<br>එළිදරව් සාහිත්‍යය යනු කුමක්ද ?<br>• එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ<br>1. ද්විත්ව වාදය<br>2. යුගාන්ත වාදය<br>3. සංකේත භාවිතය<br>4. දර්ශන මගින් පණිවිඩ ඉදිරිපත් කිරීම<br>• අරමුණු හා අධ්‍යාත්මිකත්වය (සරල විස්තරයක් පමණි) | • එළිදරව් සාහිත්‍යය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• සන්නිවේදනයේ දී සංකේතවල ඇති වටිනාකම අගය කරයි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ආගමික සංකේත ගෞරවයෙන් භාවිත කරයි.<br>• කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | 02 |
| | 10.1.5 ප්‍රඥාවෙන් සපිරි දැහැමි ජීවිතයක් ගත කරයි. | **5 පාඩම - ප්‍රඥා සාහිත්‍යය**<br>• ප්‍රඥා සාහිත්‍යය යනු කුමක්ද?<br>• ප්‍රඥාවේ ප්‍රභේද<br>• ඉදිරිපත් කර ඇති ආකාරය<br>• සාහිත්‍යමය ස්වරූපයන්<br>• අරමුණු හා අධ්‍යාත්මිකත්වය | • ප්‍රඥාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• යහපත් දෙය පමණක් තෝරා ගනිමින් ප්‍රඥාවන්ත ව කටයුතු කළ යුතු බවට තර්ක කරයි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ප්‍රඥාවන්ත ව කටයුතු කරයි<br>• ප්‍රඥාවන්ත ව කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වෙයි | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි. | 10.2.1 එදිනෙදා ජීවිතය තුළ පාස්කු අභිරහසට පංගුකාර වෙමින් නවඅහසක් හා නව පොළොවක් දිනා ගැනීමට කටයුතු කරයි. | **6 පාඩම - පාස්කු අභිරහස**<br>• ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය (ලූක් 22/54 - 23/25)<br>• ජේසුස් වහන්සේගේ උකුත්වීම (ලූක් 23/26 - 56)<br>• ජේසුස් වහන්සේගේ උත්ථානය (ජුවාම් 20/1 - 18)<br>• ජේසුස් වහන්සේගේ දර්ශනය වීම්<br>- ශ්‍රාවකයන්ට (ජුවාම් 20/19 - 29)<br>- එම්මාවුස් ගමන (ලූක් 24/13 - 35)<br>- ක.ස.ධ 571 - 573, 595 - 597, 624 - 628, 631 - 635<br>• නව අහස හා නව පොළොව (උත්පත්ති 1/1, එළිදරව්ව 21/1, එළිදරව්ව 22/13, ක.ස.ධ 1042 - 1050 ) | • පාස්කු අභිරහස පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ක්‍රිස්තුස් වහන්සේ මෙන් අපත් යම් දිනක උත්ථාන වන බව පිළිගනිමු.<br>• එම්මාවුස් ගමන පිළිබඳ ව තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• එදිනෙදා ජීවිත සිද්ධීන් තුළින් පාස්කු අභිරහසට පංගුකාරයෙක් වෙයි.<br>• අන් අයගේ දුකේ දී සහය වෙයි. | |
| | 10.2.2 ශුද්ධාත්ම වරමින් පූර්ණව කිතුණු දිවියට සාක්ෂි දරයි. | **7 පාඩම - මුල් කිතුනු සභාව**<br>• පෙන්තකොස්තය (ක්‍රියා 2/1 - 13) (අපෝස්තුලුවරුන්ට ශුද්ධාත්ම වරම්)<br>• පෙන්තකොස්ත දිනයේ පේදුරුතුමාගේ දේශනාව හා එහි ප්‍රතිඵල (ක්‍රියා 2/14-41)<br>• කොරනේලියස්ගේ ගෙදර දී (ක්‍රියා 10/1-8,44-48) (විජාතීන්ට ශුද්ධාත්ම වරම් ලැබීම)<br>• මුල් කිතුණු සභාවේ ලක්ෂණ (ක්‍රියා 2/42-47, ක්‍රියා 4/32-37)<br>• උපස්ථායකයන් පත් කිරීම. (ක්‍රියා 6/1-7)<br>• ශු. ස්තේපන්තුමාගේ සාක්ෂිය (පළමු ප්‍රාණ පරිත්‍යාගීවරයා) (ක්‍රියා 6/8, 7/54-60)<br>• ශුද්ධවූ මහා ජාකොබ්තුමා (අපොස්තුලුවරුන් අතරින් පළමු ප්‍රාණ පරිත්‍යාගීවරයා) (ක්‍රියා 12/1-2) | • මුල් කිතුණු සභාවේ ලක්ෂණ විස්තර කරයි.<br>• ශුද්ධාත්මයාණන් අප ව නිවැරදි මාර්ගයේ ගෙන යන බව පිළිගනියි<br>• '' උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දරූ පළමු ප්‍රාණ පරිත්‍යාගීවරයා'' යන මැයෙන් නිර්මාණයක් ඉදිරිපත් කරයි.<br>• කිතුණු ජීවිතයට සාක්ෂි දරයි.<br>• තමන් සතු දේ දුප්පතුන් සමඟ බෙදා ගනියි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.2.3 සැබෑ සිත් හැරීම තුළ ශුභාරංචියේ පණිවුඩකරුවෙක් වෙයි. | **8 පාඩම - ශුද්ධවූ පාවුලු තුමා**<br>• කැඳවීමට පෙර (ක්‍රියා 8/1 - 3)<br>• ශුද්ධවූ පාවුලු තුමාගේ කැඳවීම (ක්‍රියා 9/1 - 19)<br>• ශුද්ධවූ පාවුලු තුමාගේ ධර්මදූත චාරිකා<br>• පළමු ධර්මදූත ගමන<br>• දෙවන ධර්මදූත ගමන<br>• තෙවන ධර්මදූත ගමන (පාවුලු තුමාගේ ධර්මදූත ගමන්වල දී ගමන් කළ වැදගත් නගර පමණක් දැන ගැනීම සෑහේ.)<br>• ශුද්ධවූ පාවුලු තුමාගේ ජීවිතයේ අවසාන කාලය | • ශුද්ධ වූ පාවුලු තුමා පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ධර්මදූතවරයෙක් වීමට පරිත්‍යාගයක් අවශ්‍ය බව පිළිගනියි.<br>• ශුද්ධ වූ පාවුලු තුමා දමස්කයට යාමේ සිද්ධිය නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි.<br>• තම හැකියාවන් ශුද්ධ වූ සභාවේ දියුණුව සඳහා භාවිත කරයි.<br>• දිව්‍ය පූජාව හා දහම් පාසල් නොයන මිතුරන්ට එහි ඇති වැදගත්කම පහදා දෙයි. | 03 |
| | 10.2.4 ශුද්ධවූ සභා ශ්‍රේෂ්ඨයන්ට ගරු කරයි, කීකරු වෙයි. | **9 පාඩම - ශුද්ධවූ පේදුරු තුමා**<br>• ශුද්ධවූ පේදුරු තුමාගේ කැඳවීම (ලූක් 5/1 - 11)<br>• ශුද්ධවූ පේදුරු තුමාගේ මහා ප්‍රකාශනය (මතෙව් 16/13 - 20)<br>• පේදුරු තුමාට පැවරූ තුන්ප්‍රකාර භාරය (ජුවාම් 21/15 - 19, ක.ස.ධ. 551 - 553, 765,816, 862)<br>• පළමු වන ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා පිළිබඳ විස්තරයක් | • ශුද්ධ වූ සභාවේ නායකත්වය අඛණ්ඩ ව පවතින ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• දේව කැඳවීමට ප්‍රතිචාර දැක්විය යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි.<br>• ශුද්ධ වූ සභාවේ ශ්‍රේෂ්ඨයන්ට කීකරු වෙයි.<br>• ශුද්ධ වූ සභාවේ ශ්‍රේෂ්ඨයන්ට ගරු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.2.5 අපෝස්තුලුවරුන්ගෙන් පැවත එන එකම ශුද්ධවූ කතෝලික සභාවේ ක්‍රියාකාරී සාමාජිකයෙක් වෙයි. | **10 පාඩම - ශුද්ධවූ සභාවේ ලක්ෂණ**<br>1. ඒකත්වය (ක.ස.ධ. 813 - 822)<br>2. ශුද්ධත්වය (823 - 829)<br>3. කතෝලිකත්වය (830 - 831)<br>4. අපෝස්තලිකත්වය (857,861, 862)<br>• ශුද්ධවූ සභාව ක්‍රිස්තුන් වහන්සේගේ අතීන්ද්‍රීය ක්‍රිස්තු දේහය ලෙස<br>(1 කොරින්ති 12/12 - 30, ජාතීන්ගේ ආලෝකය- අංක 9) | • ශුද්ධ වූ සභාවේ ලක්ෂණ ගොනු කරයි.<br>• ශුද්ධ වූ සභාවේ සාමාජිකයන් කිසිදු භේදයකින් තොර ව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.<br>• ශුද්ධ වූ සභාව අති ඉන්ද්‍රීය ක්‍රිස්තු දේහය ලෙස ක්‍රියා කළ යුතු ආකාරය නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි.<br>• අති ඉන්ද්‍රීය ක්‍රිස්තු දේහයේ සාමාජිකයන් ලෙස තම වගකීම් ඉටු කරයි.<br>• අසල් වැසියන්ගේ අවශ්‍යතාවල දී උදව් කිරීමට ඉදිරිපත් වෙයි. | 01 |
| | 10.2.6 ශ්‍රී ලාංකික කතෝලික අනන්‍යතාව සුරකිමින් ක්‍රියාශීලී ජාතික ඒකාබද්ධතාව, අනන්‍යතාව හා ජාතික සමගිය ගොඩනැගීමට දායක වෙයි. | **11 පාඩම - ශ්‍රී ලාංකික කතෝලික සභාව**<br>• පෘතුගීසීන් පැමිණීමට පෙර යුගය<br>• පෘතුගීසි යුගය<br>• ලන්දේසි යුගය<br>• භාග්‍යවන්ත ජුසේවාස් පියතුමා<br>• ගෞරවනීය ගොන්සාල්වේස් පියතුමාගේ සේවය<br>• බ්‍රිතාන්‍ය යුගයේ ආගමික නිදහස හා නිදහස් යුගය<br>• ලංකාවේ පදවි හා රදගුරුතුමන්ලා | • ශ්‍රී ලංකාවේ කතෝලික සභාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ශ්‍රී ලංකාවේ කතෝලික අනන්‍යතාවය සුරැකිය යුතු බව පිළිගනියි.<br>• ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• විවිධ අභියෝග හමුවේ කතෝලික විශ්වාසය සුරකියි.<br>• ජාතික සමගිය ගොඩනැගීමට දායක වෙයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී පූර්ණ කිතුණු ජීවිතයකට සාක්ෂි දරයි. | 10.3.1 ක්‍රිස්තු ජීවයෙන් පෝෂණය වීම සඳහා නිතර නිතර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව ලබා ගනියි. | **12 පාඩම - දිව්‍ය සත්ප්‍රදසාද වහන්සේ**<br>• ලක්ෂණ<br>1. දේව ප්‍රසාද නිධානයක්<br>2. භෝජනයක් (ජුවාම් 6/53 - 56)<br>3. යාගයක් (ලූක් 22/19 - 20)<br>4. ගිවිසුමක් (ජෙරමියා 31/31-34, නික්මයාම 24/4 8, හෙබ්‍රෙව් 9/14 - 22,1 කොරින්ති 11/25)<br>5. ස්තුති කිරීමක් (ලූක් 22/17 , 22/19)<br>6. පරිශ්‍රමණයක් (ලූක් 22/19 , 1 කොරින්ති 11/24)<br>දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම්<br>1. පූප කැඞීම (ලූක් 24/35, ක්‍රියා 2/42)<br>2. ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය (1 කොරින්ති 11/ 20)<br>3. නව පාස්කු මංගල්‍යය (1 කොරින්ති 5/8)<br>4. ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ සහභාගිකම (1 කොරින්ති 10/16)<br>• දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු<br>– මෙල්කිසදෙක් ( උත්පත්ති 14/18 - 20)<br>– මන්නා භෝජනයෙන් පෝෂණය (නික්මයාම 16)<br>– නුමුහුන් පූප අනුභවය හා කුසලානයෙන් පානය කිරිම (නික්මයාම 12/15 - 20)<br>– පූප වැඩිකිරීමේ ප්‍රාතිහාර්යය (ලූක් 9/12 - 14)<br>– ජීවනදායක භෝජනය පිළිබඳ ඉගැන්වීම් (ජුවාම් 6/26-27,35) | • දිව්‍ය සත්ප්‍රසාදයීය ලක්ෂණ විස්තර කරයි.<br>• දිව්‍ය සත්ප්‍රසාදය තුළ ක්‍රිස්තුන් වහන්සේගේ ජීවමාන ව වැඩ සිටින බව පිළිගනියි.<br>• දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දිව්‍ය පූජාවට උනන්දුවෙන් සහභාගි වෙයි.<br>• දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමානව වැඩ සිටින ක්‍රිස්තුන් වහන්සේට තම මිතුරන් හා එක්ව යාච්ඤා කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.3.2 ස්වාමීන් වහන්සේගේ සේවකත්වයේ භෝජනයට පංගුකාර වෙමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි. | **13 පාඩම - පාස්කු භෝජනය**<br>• පුරාණ ගිවිසුමේ පාස්කු භෝජනය (නික්මයාම 12/1 - 14)<br>• අන්තිම රාත්‍රී භෝජනය හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම (ලූක් 22/19 - 20, 1 කොරින්ති 11/23 - 26)<br>• දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ආත්මික හා ශාරීරික සූදානම ( 1 කොරින්ති 11/27 - 30)<br>• පාද දෝවනය හා ප්‍රේමයේ පණත ( ජුවාම් 13/1-20 , ජුවාම් 13/34) | • පුරාණ ගිවිසුමේ පාස්කු භෝජනය පිළිබඳ ව විස්තර කරයි.<br>• නිසි සූදානමකින් යුතුව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව ලබා ගත යුතු බව පිළිගනියි.<br>• අන්තිම රාත්‍රී භෝජනය අවස්ථාව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• බැගෑපත් නායකයෙකු ලෙස පන්තිය තුළ ක්‍රියා කරයි.<br>• දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ආත්මික ව හා ශාරීරික ව සූදානම් වීමට මිතුරන්ට උදව් වෙයි. | 02 |
| | 10.3.3 එදිනෙදා ජීවිතය තුළ අන් අය වෙනුවෙන් යාග වෙයි. | **14 පාඩම - කල්වාරි යාගය**<br>• පුරාණ ගිවිසුමේ විවිධ යාග<br>• යාගවල පරමාර්ථ<br>• යාග වර්ග ප්‍රධාන කොටස් 2කි.<br>1. දවන පූජා (කොබෙයියන්, පරෙවියන්)<br>2. නොදවන පූජා (ධාන්‍ය, මිදියුෂ, තෙල්වර්ග, පූප)<br>• දවන පූජා කොටස් 4කි.<br>i. සම්පූර්ණයෙන් දවන<br>ii. සහභාගිකමේ පූජා<br>iii. පාප පූජා<br>iv. වන්දි ගෙවීමේ පූජා<br>• දවන පූජාවට භාවිත කළ සතුන්<br>• ගවයන් (ලෙවි 1/3 - 9)<br>• බැටලුවන් හා එළුවන් (ලෙවි 1/10 - 13)<br>• කුරුල්ලන් (ලෙවි 1/14 - 17)<br>• කල්වාරි යාගය | • පුරාණ ගිවිසුමේ විවිධ යාග වර්ග විස්තර කරයි.<br>• එදිනෙදා ජීවිතයේ දී යාග විය යුතු බව පිළිගනියි.<br>• පුරාණ ගිවිසුමේ යාග හා කල්වාරි යාගය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• පාපයක් කළ විට තම වරද වටහා ගෙන පාප පූජාවක් ලෙස පාපොච්චාරණය කරයි.<br>• අන් අයගේ වේදනාවේ දී සංවේදී වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.3.4 පරිත්‍යාගශීලී ආදර්ශවත් ජීවිත චරිතායනය කරයි. | **15 පාඩම - පරිත්‍යාගශීලී ජීවිතාදර්ශයන්**<br>• ශු. 11 ජුවාම් පාවුලු මුණිතුමා<br>• භාග්‍යවන්ත තෙරේසා මව්තුමිය<br>• ශු. මැක්ෂිමිලියම් කෝල්බේ මුණිතුමා<br>• ගරු. මයිකල් රුද්‍රිගු පියතුමා | • නම් කර ඇති පුද්ගලයන්ගේ ජීවිත කතා පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් සකසයි.<br>• තම දෙමව්පියන් ද පරිත්‍යාගශීලී ජීවිතයක් ගත කරන බව පිළිගනියි.<br>• සකස් කරන ලද වාර්තාව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• අන් අයගේ අභිවෘද්ධිය සඳහා පරිත්‍යාගශීලි ව කටයුතු කරයි.<br>• සැමට ප්‍රේම කරයි. | 02 |
| 4.0 දේව පණත් පිළිපදිමින් ප්‍රේමයේ | 10.4.1 මුලු හෘදයෙන්ද මුලු ආත්මයෙන්ද මුලු වීර්යයෙන්ද මුලු බුද්ධියෙන්ද දෙවියන් වහන්සේට ප්‍රේම කරයි. | **16 පාඩම - දේව ප්‍රේමය**<br>• දේව ප්‍රේමය හා දේව ධර්මගුණ (විශ්වාසය, බලාපොරොත්තුව, ප්‍රේමය) (ක.ස.ධ. 2087 - 2094)<br>• දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම සඳහා කළ යුතු දේ (වන්දනාව , යාච්ඤාව, යාගය , පොරොන්දු හා භාරහාර ) (ක.ස.ධ. 2095 - 2103)<br>• දේව නාමය ගරුත්වයෙන් භාවිතය හා කිතුණු නම් භාවිතයේ වැදගත්කම (ක.ස.ධ. 2150- 2159)<br>• ඉරුදින දිව්‍ය පූජාවේ වැදගත්කම (ක.ස.ධ. 2178 - 2179) | • දේව ප්‍රේමය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• දේව නාමය ගෞරවයෙන් භාවිත කළ යුතු බව පිළිගනියි.<br>• දේව ප්‍රේමයට ප්‍රතිප්‍රේමය දක්වන ආකාරය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• මුළු හෘදයෙන් ද, මුළු ආත්මයෙන් ද, මුළු වීර්යයෙන් ද, මුළු බුද්ධියෙන් ද දෙවියන් වහන්සේට ප්‍රේම කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.4.2 එකිනෙකා කෙරෙහි අඛණ්ඩවූත්, ගැඹුරුවූත් සැලකිල්ලක් දක්වමින් ප්‍රේමයේ සමාජයක් ගොඩ නගයි. | **17 පාඩම - ප්‍රේමයේ සමාජයක්**<br>• දරුවන්ගේ යුතුකම් (ක.ස.ධ. 2214 - 2220)<br>• දෙමාපියන්ගේ යුතුකම් (ක.ස.ධ. 2221 - 2231)<br>• රාජ්‍ය පාලකයන්ගේ යුතුකම් (ක.ස.ධ. 2235 - 2237)<br>• පුරවැසියන්ගේ යුතුකම් (ක.ස.ධ. 2238 - 2243) | • හතරවන පණතට අනුව එක් එක් පුද්ගලයන්ගේ වගකීම් හා යුතුකම් ගොනු කරයි.<br>• තම යුතුකම් නිසියාකාර ව ඉටු කළ යුතු බවට තර්ක කරයි.<br>• හතරවන පණතට අනුව ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• එකිනෙකා කෙරෙහි අඛණ්ඩ වූත්, ගැඹුරුවූත් සැලකිල්ලක් දක්වයි.<br>• නායකයා සේවකයා වී ක්‍රියා කිරීමට අන් අය ව ද යොමු කරවයි. | 02 |
| | 10.4.3 දේව ස්වරූපය හා සමානකම දරන මිනිස් ජීවිතය සුරැකීමට කැපවෙයි. | **18 පාඩම - මානව සම්පත සුරකිමු**<br>• මිනිසාගේ උතුම්කම - දේව ස්වරූපය හා සමානකම (උත්පත්ති 1/27 - 28)<br>• ජීවන හුස්ම ලැබීම (උත්පත්ති 2/7)<br>• ජීවිතයට ගරු කිරීමේ වැදගත්කම (ක.ස.ධ. 2259 - 2262)<br>• තම ජීවිතය සුරැකීම - මත්ද්‍රව්‍ය, මත්පැන්, දුම්වැටි (ක.ස.ධ. 2288 - 2291)<br>• පස්වන පණතට විරුද්ධව ක්‍රියාකරන අවස්ථා මිනිස් ඝාතන ,වාර්ගික සමූල ඝාතන, ගබ්සාව ,සියදිවි නසා ගැනීම , මානසික හා ශාරීරික වධ හිංසා ,සිරගත කිරීම, රටින් පිටුවහල් කිරීම, දරුවන් හා ස්ත්‍රීන් විකිණීම, ගණිකා වෘත්තිය, වහල්භාවය , ශ්‍රමය සූරාකෑම, චරිත ඝාතනය<br>• ගබ්සාව (ක.ස.ධ. 2270 - 2275)<br>• සියදිවි නසා ගැනීම (ක.ස.ධ. 2280 - 2283) | • පස්වන පණතට අනුව ඉටු කළ යුතු හා පිටුදැකිය යුතු දෑ වගුගත කරයි.<br>• මිනිස් දිවිය දෙවියන් වහන්සේට පමණක් අයිති බව පිළිගනියි.<br>• පස්වන පණතට අනුව ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි<br>• මිනිස් දිවිය සුරකියි.<br>• අන් අයගේ ජීවිතවලට ගරු කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.4.4 සිතින් හා කයින් නිර්මල දිවි පෙවෙතක් ගත කරයි. | **19 පාඩම - නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝය**<br>• ව්‍රත ශුද්ධිය (ක.ස.ධ. 2337 - 2345)<br>• ව්‍රත ශුද්ධියට විරුද්ධ ක්‍රියාවන්<br>1. රාගය (ක.ස.ධ. 2351)<br>2. ස්වයං වින්දනය ( ක.ස.ධ. 2352)<br>3. කාම මිත්‍යාචාරය (ක.ස.ධ. 2353)<br>4. අසභ්‍ය පතපොත හා දර්ශන , අසභ්‍ය වචන භාවිතය (ක.ස.ධ 2354)<br>5. ගණිකා වෘත්තිය (ක.ස.ධ. 2355)<br>6. ස්ත්‍රී දූෂණ (ක.ස.ධ. 2356)<br>7. සමලිංගික සේවනය (ක.ස.ධ. 2357 - 2359)<br>8. විවාහ පොරොන්දු සුරැකීම (ක.ස.ධ. 2364 - 2365) | • භය හා නවය පණත් අනුව ජීවත් වන ආකාරය ගොනු කරයි.<br>• භය හා නවය පණත් ආරක්ෂා කර ගැනීමට සිත පාලනය කර ගත යුතු බව පිළිගනියි.<br>• භය හා නවය පණත් අනුව ජීවත් වන ආකාරය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• සිතින් හා ක්‍රියාවෙන් පිරිසිදු ජීවිතයක් ගත කරයි.<br>• අන් අයට ශුද්ධවන්ත පිවිතුරු ජීවිතයක් ගත කිරීමට උදව් කරයි. | 02 |
| | 10.4.5 ජාතියේ සමාජීය හා ආර්ථික වර්ධනයට රුකුලක් වන මානව සම්පත් සංවර්ධනයේදී පෞද්ගලික දේපල කාර්යක්ෂමව භාවිත කරයි. | **20 පාඩම - පෞද්ගලික දේපල ස්වර්ගීය සම්පත් සඳහා**<br>• පෞද්ගලික දේපල පිළිබඳ කිතුණු සභා ඉගැන්වීම් (ක.ස.ධ. 2402 - 2406)<br>• අන් අයගේ දේපළ සුරැකීම (ක.ස.ධ. 2408 - 2414)<br>• දුප්පතුන්ට ප්‍රේම කිරීම (ක.ස.ධ 2443 - 2449 1 ජොහාන් 3/17, ක.ස.ධ. 2534) | • පෞද්ගලික දේපල පිළබඳ ව ශුද්ධ වූ සභා ඉගැන්වීම් ගොනු කරයි.<br>• මිනිසා දේපල සඳහා නොව දේපල දෙවියන් වහන්සේ ලබා දී ඇත්තේ, මිනිසාට සේවය කිරීම සඳහා බව පිළිගනියි.<br>• ශුද්ධ වූ සභා ඉගැන්වීම් අනුව, පෞද්ගලික දේපල නිවැරදිව පරිහරණය කිරීම හා එහි ආදීනව පිළිබඳ ව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• පෞද්ගලික දේපල පරිහරණය කිරීමේ දී පරාර්ථකාමී ව ක්‍රියා කරයි.<br>• පෞද්ගලික දේපලවලින් අන් අයට උදව් කරයි. | 01 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.4.6 සත්‍යයට සාක්ෂි දරමින් සදාචාර සම්පන්න ජීවිතයක් ගත කරයි. | **21 පාඩම - සත්‍යගරුකව ජීවත් වෙමු**<br><br>• සත්‍යය තුළ ජීවත්වීම (ක.ස.ධ 2465 - 2470)<br>• සත්‍යයට සාක්ෂි දැරීම (2471 - 2474)<br>• 8 වන පණතට විරුද්ධ පාපයන් (ක.ස.ධ. 2475 - 2487)<br>• රහස් රැකීමේ අවශ්‍යතාවය (ක.ස.ධ. 2491) | • සත්‍යගරුක සමාජයක් ගොඩනැගීම සඳහා දායක විය හැකි ආකාර පිළිබඳ තොරතුර ගොනු කරයි.<br>• සැමවිට ම සත්‍යවාදී විය යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• සත්‍යයට සාක්ෂි දරයි.<br>• අන් අයගේ රහස් රකියි. | 01 |
| 5.0 යාච්ඤාවෙන් පෝෂණය ලබා දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි. | 10.5.1 ජනවන්දනා වර්ෂය තුළ සමරන දේව අභිරහස් ජීවත් කරවයි. | **22 පාඩම - ජනවන්දනා වර්ෂය**<br><br>• ජනවන්දනා සමයේ එක් එක් කාලයන් විස්තර කිරීම<br>• එක් එක් සමයට අයිති වර්ණ හා ඒවායේ අර්ථ පැහැදිලි කිරීම. | • ජනවන්දනා වර්ෂය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ජනවන්දනා චක්‍රයේ ඇති මංගල්‍යයන් අර්ථවත් ව පැවැත්විය යුතු බව පිළිගනියි.<br>• ජනවන්දනා වර්ෂය තුළ අඩංගු මංගල්‍යයන් වගුගත කර, නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ජනවන්දනා වර්ෂය තුළ දේව අභිරහස් අර්ථවත් ව සමරයි.<br>• කණ්ඩායම් තුළ ප්‍රේමයෙන් කටයුතු කරයි. | 01 |
| | 10.5.2 දිව්‍ය පූජාව කිතුනු ජීවිතයේ කේන්ද්‍රය කර ගනියි. | **23 පාඩම - දිව්‍ය පූජාව**<br><br>• දිව්‍ය පූජාවේ එක් එක් පිළිවෙතේ අනුකොටස් වල අර්ථ විස්තර කිරීම. | • දිව්‍ය පූජාවේ පිළිවෙත් හතර පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• දිව්‍ය පූජාවට නිසි සූදානමකින් සහභාගිවීමට කැමැත්ත පළ කරයි.<br>• දිව්‍ය පූජාවේ එක් එක් පිළිවෙතේ අනු කොටස් පිළිබඳ ව සකස් කරන ලද වාර්තාව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දිව්‍ය පූජාවට භක්තියෙන් සහභාගි වෙයි.<br>• කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.5.3 කිතුනු සභා සමගිය වෙනුවෙන් කැපවෙයි. | **24 පාඩම - උත්තම පූජක යාච්ඤාව**<br>• ජුවාම් 17 පරිච්ඡේදය<br>• උත්තම පූජක යාච්ඤාව තුළින් ජේසුස් වහන්සේගේ දූත සේවාව කැටිකර ඇත.<br>• උත්තම පූජක යාච්ඤාවේ කොටස් 3කි.<br>1. කොටස - තමන් වහන්සේ වෙනුවෙන් යාච්ඤාව (ජුවාම් 17/1 - 5)<br>2. කොටස - ශ්‍රාවකයන් වෙනුවෙන් යාච්ඤාව (ජුවාම් 17/6 - 19)<br>3. කොටස - අනාගත සභාවේ එකමුතුකම වෙනුවෙන් යාච්ඤාව (ජුවාම් 17/ 20 - 26)<br>• කිතුනු සභා එකමුතුව සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාව<br>• පිළිගත් සභා 7හි නම්<br>• දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ප්‍රකාශන 2ක් කිතුනු සභා සමගිය වෙනුවෙන් නිකුත් කර ඇත.<br>• කිතුනු සභා සමගි සතිය (ජනවාරි 18 - 25)<br>• කිතුනු අපේ අරමුණු එකම සභාවක් ගොඩනැගීමයි. | • උත්තම පූජක යාච්ඤාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• කිතුනු සභා සමගිය වෙනුවෙන් කැපවිය යුතු බව පිළිගනියි.<br>• කිතුනු සභා සමගිය පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් එළි දක්වයි.<br>• පිළිගත් සභා සමග සමගියෙන් කටයුතු කරයි.<br>• එක ම සභාවක් ගොඩනැගීමට ක්‍රියා කරයි. | 02 |
| | 10.5.4 යාච්ඤාවෙන් සවිය ලබා දුර්පරීක්ෂා ජය ගනියි. | **25 පාඩම - මල් උයනේ යාච්ඤාව**<br>• මාර්ක් 14/32 - 42<br>• ගෙත්සෙමනෙහි පිහිටීම.<br>• මල් උයනේ යාච්ඤාවේ කරුණු 3ක් පෙන්නුම් කරයි.<br>1. ජේසුස් වහන්සේගේ සැබෑ මනුෂ්‍යත්වය<br>2. දෙවියන් වහන්සේ හා ක්‍රිස්තුන් වහන්සේ අතර ඇති සබැඳියාව<br>3. උන්වහන්සේගේ දුක් ප්‍රාප්තිය<br>• ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤාව තුළින් අභියෝග ජයගැනීමට ශක්තිය ලබාගත් සේක. නමුත් අපෝස්තුලුවරු යාච්ඤාවෙන් ශක්තිය ලබා නොගත් නිසා පරීක්ෂාවට වැටීම. (පලායාම, කණ කපා දැමීම, නාඳුනන බව පැවසීම) | • මල් උයනේ යාච්ඤාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤාව තුළින් අභියෝග ජය ගැනීමට ශක්තිය ලබාගත් බව පිළිගනියි.<br>• යාච්ඤාවෙන් සවිය ලබා දුර්පරීක්ෂාවෙන් ජය ගන්නා ආකාරය පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් කරයි.<br>• ජීවිතයේ සෑම අවස්ථාවක දී ම යාච්ඤාවෙන් සවිය ලබා ගනියි.<br>• කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වේ. | 02 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 01 වන පාඩම

## පුරාණ ගිවිසුමේ පොත් වර්ගීකරණය

**නිපුණතාව 1.0** : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායීව භාවිත කරයි.

**නිපුණතා මට්ටම 10.1.1** : එදිනෙදා ජීවිතයේ සිදුවීම් විශ්වාසයේ ඇසින් අර්ථකථනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03 යි.

**ඉගෙනුම් පල** :

- පුරාණ ගිවිසුමේ පොත් නිවැරදි ව වර්ගීකරණය කරයි.
- දස පණත අනුව දිවි ගෙවිය යුතු බව පිළිගනියි.
- පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත් පිළිබඳ ව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- එදිනෙදා ජීවිත සිද්ධීන් තුළින් දෙවියන් වහන්සේව අත්දකියි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා සහයෝගය ලබා දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1** :

ඇමුණුම 2 ක්‍රියාත්මක කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.

- පුරාණ ගිවිසුමේ පොත් ගණන 46
- ඒවා කොටස් 5කට බෙදිය හැකි බව
    - නීති පොත්
        - පහයි
        - ඒවායේ නම්
    - ඉතිහාස පොත්
        - දාසයයි
        - ඒවායේ නම්
    - ප්‍රඥා සාහිත්‍යය
        - හතයි
        - ඒවායේ නම්
    - දිවැසිවර ග්‍රන්ථ
        - දාහතයි
        - ඒවායේ නම්
    - එළිදරව් සාහිත්‍යය
        - එකයි
        - එහි නම

(මිනිත්තු 30)

**පියවර 2 :**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකටම ඇමුණුම 1 හා ඇමුණුම 4 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න.

(මිනිත්තු 50)

**පියවර 3 :**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
    - පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත් ගණන
    - ඒවායේ නම්
    - පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත්වල අඩංගු වන්නේ, ආගමික හෙවත් ගැලවීමේ ඉතිහාසයක් බව
    - ආගමික හෙවත් ගැලවීමේ ඉතිහාසයක් යනු
    - සීනයි ගිවිසුමට (දස පණතට) පක්ෂපාත වීම තුළ දේව ආශිර්වාදය ලැබෙන බව
    - එයට පිටුපෑම තුළ විපාක ලැබෙන බව
    - ශුද්ධ බයිබලයේ කාන්තාවන් නමින් ඇති පොත්
    - එදිනෙදා ජීවිත සිද්ධි ඇසුරෙන් දෙවියන් වහන්සේ අත් දැකිය හැකි බව (එදිනෙදා ජීවිත සිද්ධීන් තුළින් ගුරුවරයා දෙවියන් වහන්සේ අත් දකින ලද අවස්ථාවක් ඉදිරිපත් කරන්න)
    - සිසුන් එලෙස අත්දැක ඇති අවස්ථා විමසන්න (මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :**

- ඇමුණුම 2හි දක්වා ඇති බ්‍රිසල් බෝඩ් එක
- ඇමුණුම 2හි දක්වා ඇති අඟල් 1×3 ප්‍රමාණයේ පුරාණ ගිවිසුමේ පොත්වල නම් ලියන ලද කොළ (වර්ණ අනුව)
- ගම්
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න.
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව ඔබේ කණ්ඩායමේ සියලු දෙනාට ඇසෙන පරිදි, එක් අයෙකු, ශබ්ද නගා කියවන්න. සෙසු අය එයට හොඳින් සවන් දෙන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු හා නිර්මාණය කළ පෝස්ටරය පදනම් කරගෙන, "පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත්" පිළිබඳ ව ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (ඉදිරිපත් කිරීම සඳහා බුද්ධි මණ්ඩල සාකච්ඡා, නාට්‍ය, විරිදු, පෝස්ටර් යනාදි ක්‍රම භාවිත කළ හැකි ය.)

**ඇමුණුම 2**

- පෙර සූදානම
    - නිල් පාටින් අඟල් 1×3 ප්‍රමාණයේ කොළ 5ක් කපා, ඒවායේ වෙන වෙන ම,(1) උත්පත්ති, (2) නික්මයාම, (3) ලෙවී ව්‍යවස්ථාව, (4) ගණන් කතාව, (5) ද්විතීය නීති සංග්‍රහය යනුවෙන් ලියන්න.
    - කොළ පාටින් අඟල් 1×3 ප්‍රමාණයේ කොළ 16ක් කපා, ඒවායේ වෙන වෙන ම, (1) ජෝෂුවා, (2) විනිශ්චයකාරයෝ, (3) රූත් කතාව, (4) 1 සාමුවෙල්, (5) 2 සාමුවෙල්, (6) 1 රාජාවලිය, (7) 2 රාජාවලිය, (8) 1 වංශාවලිය, (9) 2 වංශාවලිය, (10) එස්රා, (11) නෙහෙමියා, (12) තෝබිත්, (13) ජුඩිත්, (14) එස්තර්, (15) 1 මකබි, (16) 2 මකබි යනුවෙන් ලියන්න.
    - රෝස පාටින් අඟල් 1×3 ප්‍රමාණයේ කොළ 7ක් කපා, ඒවායේ වෙන වෙන ම, (1) ජෝබ්, (2) ගීතාවලිය, (3) හිතෝපදේශය, (4) ධර්මදේශකයා, (5) ප්‍රේම ගී, (6) ප්‍රඥාව, (7) සිරාක් යනුවෙන් ලියන්න.
    - කහ පාටින් අඟල් 1×3 ප්‍රමාණයේ කොළ 17ක් කපා, ඒවායේ වෙන වෙන ම, (1) යෙසායා, (2) ජෙරමියා, (3) විලාප ගී, (4) බාරුක්, (5) එසකියෙල්, (6) හොසියා, (7) ජෝවෙල්, (8) ආමොස්, (9) ඔබදියා, (10) ජෝනා, (11) මීකා, (12) නාහුම්, (13) හබක්කුක්, (14) ශෙපනියා, (15) හග්ගායි, (16) සෙකරියා, (17) මලාකි යනුවෙන් ලියන්න.
    - රතු පාටින් අඟල් 1×3 ප්‍රමාණයේ කොළයක් කපා, එහි, (1) දානියෙල් යනුවෙන් ලියන්න.
    - සුදු බ්‍රිසල් බෝඩ් එකක පහත ආකෘතිය ඇඳ දක්වන්න.



- ඉහත ආකෘතියේ "නීති පොත් (5)" යන්න "නිල් පාට" කොළයක ද, "ඉතිහාස පොත් (16)" යන්න "කොළ පාට" කොළයක ද, "ප්‍රඥා සාහිත්‍යය (7)" යන්න " රෝස පාට" කොළයක ද, "දිවැසිවර ග්‍රන්ථ (17)" යන්න "කහ පාට" කොළයක ද, "එළිදරව් සාහිත්‍යය (1)" යන්න "රතු පාට'' කොළයක ලියා අලවන්න.

- පන්තිය ආරම්භයේ දී
    - බ්‍රිසල් බෝඩ් එක පංතියේ සුදුසු ස්ථානයක එල්ලන්න.
    - (පංතියේ සිසුන් 5කට වැඩිය සිටී නම්) සිසුන් 5ක් ඉදිරියට කැඳවන්න.
    - එක් එක් සිසුවාට පාටක් නියම කර, පාට අනුව අංක පිළිවෙලට ඉහත ආකෘතියේ එකක් යටින් එකක් අලවන ලෙස උපදෙස් දෙන්න.
    - තම පාට අලවා නිම වූ විට, අන් අයට උදව් වන ලෙස, උපදෙස් දෙන්න.
- පන්තිය අවසානේ දී
    - නිර්මාණය කරන ලද පෝස්ටරය පන්තියේ අඛණ්ඩ ව ප්‍රදර්ශනය කර තැබීමට සලස්වන්න.

**ඇමුණුම 3**

**ගවේෂණ පත්‍රිකාව**

**ශුද්ධ බයිබලයේ ඉතිහාස පොත්**

ශුද්ධ බයිබලයේ ඉතිහාසය අන්තර්ගත වේ. එහෙත් එහි ඇත්තේ, හුදු ඓතිහාසික සිද්ධි වාර්තාකරණයක් නොවේ. මන්ද යත්, ශුද්ධ බයිබලය යනු, ඉතිහාස පොතක් නොවේ. එහි පරමාර්ථය, දේව විශ්වාසය වර්ධනය කිරීම ය. එබැවින් එහි ඇත්තේ, විශ්වාසයේ ඇසින් අර්ථකථනය කළ ඉතිහාසයකි. එනම්, විවිධ සිදුවීම් තුළින්, ඉශ්‍රායෙල් ජාතිය දෙවියන් වහන්සේ අත්දුටු ආකාරයයි. එම නිසා, ශුද්ධ බයිබලයේ ඇත්තේ, ආගමික ඉතිහාසයකි; ගැලවීමේ ඉතිහාසයකි.

ශුද්ධ බයිබලයේ ඉතිහාස පොත් 16ක් ඇති ඒවා නම්, ජෝෂුවා, වීරාවලිය, රූත් කතාව, 1 සාමුවෙල්, 2 සාමුවෙල්, 1 රාජාවලිය, 2 රාජාවලිය, 1 වංශාවලිය, 2 වංශාවලිය, එස්රා, නෙහෙමියා, තෝබිත්, ජුඩිත්, එස්තර්, 1 මකබී හා 2 මකබී වේ. ජෝෂුවා සිට 2 රාජාවලිය දක්වා පොත් කියවන විට පෙනී යන්නේ, සීනයි ගිවිසුමට පක්ෂපාතීව කටයුතු කරන තරමට, නායකයෙකුගේ හෝ ඉශ්‍රායෙල් ජාතියේ නැගීම හෝ වැටීම සිදු වන බව ය. එබැවින් සිනයි ගිවිසුමට හෙවත් දස පණතට අප විශ්වාසවන්ත වන තරමට, දේව ආශිර්වාදය  අපට හිමි වේ.

**ගෙදර පරිසරයෙන්** :

1. එදිනෙදා ජීවිත ප්‍රශ්නවලට පිළිතුරු ශුද්ධ බයිබලයෙන් සොයන්න.

## 02 වන පාඩම

## නව ගිවිසුමේ පොත් වර්ගීකරණය

**නිපුණතාව** 1.0 : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා, එදිනෙදා ජීවිතයේ දී ඵලදායීව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 10.1.2: අපෝස්තලික සභාවේ ලක්‍ෂණ අනුකරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- නව ගිවිසුමේ පොත් නිවැරදි ව වර්ගීකරණය කරයි.
- දෙවියන් වහන්සේගේ මිතුරෙකු විය යුතු බව පිළිගනියි.
- අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත පිළිබඳ ව ඉදිරිපත් කිරීමක් කරයි.
- සුබාරංචිය අන් අය වෙත ගෙන යයි.
- කණ්ඩායම් තුළ ප්‍රේමයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර** 1 :

මෙම ක්‍රියාකාරකමට දින කීපයකට පෙර, සිසුන් දෙදෙනෙකුට ඇමුණුම 2 ලබා දෙන්න. එය රඟපෑමට පුහුණු වන ලෙස, සිසුන් දෙදෙනා ව දැනුවත් කරන්න. නියමිත දිනට පෙර, පෙර හුරුවක් ද තබන්න. ඇමුණුම 2හි දෙබස, පුහුණු කරන ලද සිසුන් දෙදෙනා ලවා, පාඩම ආරම්භයේ දී ඉදිරිපත් කරවා, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.

- නව ගිවිසුමේ පොත් ගණන
- එම පොත් 27 කාණ්ඩ 3කට බෙදිය හැකි බව
  1. සුබාරංචි හතර හා ක්‍රියා පොත
  2. හසුන් (21)
     i. පාවුලුතුමාගේ හසුන් 13: රෝම, 1 කොරින්ති, 2 කොරින්ති, ගලාති, එපීස, පිලිප්පි, කොලොස්සි, 1 තෙසලෝනික, 2 තෙසලෝනික, 1 තිමති, 2 තිමති, තීතස් හා පිලෙමොන්
     ii. වෙනත් හසුන් 08: හෙබ්‍රෙව්, ජාකොබ්, 1 පේදුරු, 2 පේදුරු, 1 ජොහන්, 2 ජොහන්, 3 ජොහන් හා ජූද්
  3. එළිදරව් සාහිත්‍යය (1): එළිදරව්ව පොත

(මිනිත්තු 15)

පියවර 2 :

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා 3 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න.

(මිනිත්තු 35)

පියවර 3 :

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මල නිර්මාණය කර ඇති බ්‍රිසල් බෝඩ් එකේ, සිසුන්ගේ නිර්මාණ ක්‍රමවත් ව සිසුන් ලවාම අලවන්න. (පාඩමෙන් පසු එය පංති කාමරයේ අඛණ්ඩ ව ප්‍රදර්ශනය කරන්න) ගුරුවරයා, පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
  - අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත
  - කතෘ
  - පිළිගැන්වීම
  - කාලය
  - ස්ථානය
  - ක්‍රියා පොතේ සැකිල්ල
  - අපොස්තලික සභාවේ ලක්ෂණ

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය (ලූක් 1/1-4, ක්‍රියා 1/1-2, 1/8, 2/42)
- ඩිමයි කොළ, ප්ලැටිග්නම්
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න.
  (පෙර ක්‍රියාකාරකමේ නායකත්වය නොගත් අයෙකුට අවස්ථාව ලබා දෙන්න)
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව, ඔබේ කණ්ඩායමේ සියලු දෙනාට ඇසෙන පරිදි, එක් අයෙකු, ශබ්ද නගා කියවන්න. සෙසු අය එයට හොඳින් සවන් දෙන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.

- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කරගෙන, "අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත" පිළිබඳ ව ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (ඉදිරිපත් කිරීම සඳහා බුද්ධි මණ්ඩල සාකච්ඡා, නාට්‍ය, විරිදු, පෝස්ටර් යනාදි ක්‍රම භාවිත කළ හැකි යි)

**ඇමුණුම 2**

ශු. පාවුලු තුමා ජේසු පිහිටයි! ලූක් තුමෙනි,

ශු. ලූක් තුමා ජේසු පිහිටයි! පාවුලු තුමෙනි, අපි නැවත මුණ ගැසුනේ අවුරුදු 2000කට පමණ පස්සේ නේ ද?

ශු පාවුලු තුමා ඔව්, ඔව්, මටත් හරි සතුටුයි, ඔබතුමා ව හමුවීම ගැන. ඒක නෙමේ, ඔබතුමා මේ කොහෙ යන ගමන් ද?

ශු. ලූක් තුමා මම අද යනවා (ඔබ පාසලේ නම) 10 ශ්‍රේණියේ සිසුන් ව බලන්න.

ශු. පාවුලු තුමා මොකද හදිස්සියෙන් ම ඒ පැත්තේ යන්න හිතුනේ?

ශු. ලූක් තුමා මට ඒ පන්තියේ සිසුන්ගෙන් ආරාධනයක් ලැබිලා තියෙනවා, ඒ පන්තියට එන්න කියලා.

ශු. පාවුලු තුමා ඇයි අද ඒ පාසලේ උත්සවයක් වත් තියෙනවා ද?

ශු. ලූක් තුමා නෑ, නෑ ඒ පන්තියේ ළමුන්, අද, මගේ දෙවන කෘතිය වන, "අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත" පිළිබඳ අධ්‍යයනයක් කිරීමට යනවාලු

ශු. පාවුලු තුමා ඔබතුමාත්, ශ්‍රී මතෙව් තුමාත්, ශු.මාක් තුමාත්, ශු. ජොහන් තුමාත් සුබාරංචි හතරක් ලියපු නිසා, ඒ දරුවෝ, අප ගැලවුම්කාර ජේසු සමිඳාණන්ගේ ජීවිතයේ බොහෝ තොරතුරු එයින් දැන ගන්නවා.

ශු. ලූක් තුමා ඒ විතරක් නොවෙයි, ඔබතුමාගේ හසුන් 13ත් ඒ දරුවන්ට ගොඩක් ප්‍රයෝජනවත් පොඩ්ඩක් ඉන්න, මට ඒවායේ නම්, කට පාඩමින්, කියන්න පුලුවන් ද කියලා බලන්න. රෝම, 1 කොරින්ති, 2 කොරින්ති, ගලාති, එපීස, පිලිප්පි, කොලොස්සි, 1 තෙසලෝනික, 2 තෙසලෝනික, 1 තිමති, 2 තිමති, තීතස් හා පිලොමොන්.

ශු. පාවුලු තුමා හරියට ම හරි මගේ හසුන් 13ට අමතර ව තව හසුන් 8ක් ම තියෙනවා නේ? එව්වා තමයි, හෙබ්‍රෙව්, ජාකොබ්, 1 පේදුරු, 2 පේදුරු, 1 ජොහන්, 2 ජොහන්, 3 ජොහන් හා ජුද්

ශු. ලූක් තුමා ශු ජොහන්තුමා සුබාරංචියටයි, ලිපි තුනටයි අමතර ව එළිදරව්ව පොතත් ලීවානේ.

ශු. පාවුලු තුමා එතකොට නව ගිවිසුමේ පොත් 27යි. මේ පොත්, කාණ්ඩ තුනකට අද ශුද්ධ ලියවිලි විශාරදයන් බෙදනවා. මුල් ම කාණ්ඩය තමා, සුබාරංචි හතර හා ක්‍රියා පොත.

ශු. ලූක් තුමා දෙවන කාණ්ඩය තමා හසුන්. හසුන් 21ක් තියෙනවා.

ශු. පාවුලු තුමා තෙවන කාණ්ඩය තමා, එළිදරව් සාහිත්‍යය.

**ඇමුණුම 3**

**ගවේෂණ පත්‍රිකාව**

**අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත**

අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ කතෘ වන්නේ, ශු ලූක් තුමා ය. ලූක් සුබාරංචිය ලියා ඇත්තේ ද, එතුමා ය. මෙය ලූක් සුබාරංචියේ දෙවන කාණ්ඩය ලෙස ද, සැලකිය හැකි ය. එතුමා ඉතිහාසඥයෙකි; චිත්‍ර ශිල්පියෙකි; වෛද්‍යවරයෙකි. එතුමා ශු පාවුලු තුමා සමග දෙවන හා තෙවන ධර්මදූත ගමන්වලට සහභාගි වී ඇත.

ශු ලූක්තුමා තම සුබාරංචිය හා අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත පිළිගන්වා ඇත්තේ, තියෝපිලස් නමැත්තෙකුට ය.(ශුද්ධ බයිබලයෙන් ලූක් 1/1-4 හා ක්‍රියා 1/1-2 කියවන්න) "තියෝපිලස්" යන්නෙහි අර්ථය, "දෙවියන් වහන්සේගේ මිත්‍රයා" යන්න ය. අප ද, දෙවියන් වහන්සේගේ මිතුරන් වී, එම සුබාරංචිය අප ජීවිත තුළ ක්‍රියාත්මක කිරීමට, අප එක් එක්කෙනාට, ශු ලූක් තුමා ආරාධනා කරයි. ලූක් සුබාරංචියේ දී, තියෝපිලස් නමැත්තා ආමන්ත්‍රණය කිරීමේ දී "ශ්‍රීමත්" යනුවෙන් භාවිත කරයි. එබැවින් එතුමා, උසස් නිලයක් දැරූ අයෙකු විය හැකි ය.

ශු ලූක් තුමා අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත ක්‍රි. ව. 80-90 අතර කාලයේ ලියා ඇත. එය ග්‍රන්ථාරූඪ කර ඇත්තේ, ග්‍රීසියේ අක්කායා නම් ස්ථානයේ දී විය හැකි ය.

ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පරිපූර්ණ වූ අපෝස්තුලුවරු, ජේසුස් වහන්සේගේ අවසාන ආඥාවෙන් බැඳී (ක්‍රියා 1/8 කියවන්න), සුබ අස්න ලොව පුරා රැගෙන යමින්, ධර්මදූත සේවයෙහි යෙදුන ආකාර, මෙම ග්‍රන්ථයෙහි ගැබ් වී ඇත. ඒ අනුව, ජෙරුසලෙමෙන් හා ජුදයාවෙන් සුබ අස්න දේශනා කිරීම ආරම්භ කර, සමාරියට හා අන්‍ය ජාතීන් වෙතටත්, අවසානේ දී පොළොවේ සීමාන්ත දක්වාත් සුබ අස්න දේශනා කිරීම, මෙහි අන්තර්ගත වේ.

අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ සැකිල්ල මෙසේ යඃ

i. ධර්මදූත සේවයට සූදානම (ක්‍රියා 1)
ii. ජෙරුසලමෙහි සාක්ෂි දැරීම (ක්‍රියා 2-7)
iii. ජුදයේ හා සමාරියේ සාක්ෂි දැරීම (ක්‍රියා 8-12)
iv. පාවුලුතුමාගේ ධර්මදූත සේවය (ක්‍රියා 13-28)

**ගෙදර පරිසරයෙන්** :

1. නිවස තුළ දිනපතා යාච්ඤාවේ දී අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙන් කොටසක් කියවන්න.

## 03 වන පාඩම

## සන්දේශ වර්ගීකරණය

**නිපුණතාව** 1.0 : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා එදිනෙදා ජීවිතයේ දී ඵලදායී ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 10.1.3 : තම ලේඛන හැකියාවන් ශුභාරංචිය අන් අය වෙත ගෙන යාමට භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- නව ගිවිසුමේ හසුන් වර්ගීකරණය කරයි.
- ශු. පාවුලු තුමාගේ ලේඛන දායකත්වය අගය කරයි.
- සංදේශ පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් එළිදක්වයි.
- තම ලේඛන හැකියාවන් භාවිත කරමින්, ශුභාරංචිය අන් අය වෙත ගෙන යයි.
- කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

ඇමුණුම 2හි ඇති ලිපිය, ලිපි ලියන කොළයක ලියා, ලියුම් කවරයක දමා, පංතියට රැගෙන යන්න. පංතිය ආරම්භයේ දී, ළමුන්ට ලිපියක් ලැබී ඇති බව කියන්න. පංතියේ සිසුවකු ඉදිරියට කැඳවා, ලියුම් කවරයේ බහා ඇති ලිපිය දෙන්න. එය එළියට ගෙන, කියවන ලෙස, සිසුවාට කියන්න. (අවශ්‍යය යයි හැගේ නම්, තවත් සිසුවකු ලවා ද, එම ලිපිය නැවත කියවන්න) අනතුරු ව, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.

- ශු පාවුලුතුමා හසුන් (ලිපි) ලිවීමේ පරමාර්ථ
  1. කාර්ය බහුලත්වය නිසා කිතුනු සංඝ බැහැදැකීමට යාමේ අපහසුව
  2. සිරගත ව සිටීම නිසා කිතුනු සංඝ බැහැදැකීමට යාමේ නොහැකියාව
- ශු. පාවුලු තුමාගේ හසුන් (ලිපි ) ගණන
- හසුන් 13හි නම්

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා 3 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න.

(මිනිත්තු 35)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව, විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- නව ගිවිසුමේ හසුන් ප්‍රධාන කාණ්ඩ 2
  1. ශු පාවුලු තුමාගේ හසුන්
  2. වෙනත් හසුන්
  3. ශු. පාවුලුතුමාගේ හසුන් 13 යි.
- ඒවා කොටස් තුනකට බෙදිය හැකි බව
  1. ශු. පාවුලු තුමා විසින් ම ලියන ලද හසුන් (7)ඃ 1 තෙසලෝනික, පිලිප්පි, 1 කොරින්ති, 2 කොරින්ති, ගලාති, රෝම හා පිලොමොන්
  2. ද්වීතීය පාවුලු හසුන් (2)ඃ කොලොස්සි සහ එපීස
  3. ආරුඪ කතෘත්වය (4)ඃ තෙසලෝනික, තීතස්, 1 තිමති හා 2 තිමති
- වෙනත් හසුන් 8යිඃ හෙබ්‍රෙව්, ජාකොබ්, 1 පේදුරු, 2 පේදුරු, 1 ජොහන්, 2 ජොහන්, 3 ජොහන් හා ජුද්
- තම ලේඛන හැකියා සුබ අස්නේ ව්‍යාප්තිය සඳහා යෙදිය යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය,
- බ්‍රිසල්බෝඩ් / ඩිමයි, ජ්ලැටිග්නම්
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න. (පෙර ක්‍රියාකාරකමේ නායකත්වය නොගත් අයෙකුට අවස්ථාව ලබා දෙන්න)
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව, ඔබේ කණ්ඩායමේ සියලු දෙනාට ඇසෙන පරිදි, එක් අයෙකු, ශබ්ද නගා කියවන්න. සෙසු අය එයට හොඳින් සවන් දෙන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු, තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කරගත් කරුණු පදනම් කරගෙන, "නව ගිවිසුමේ දක්නට ඇති සංදේශ" පිළිබඳ ව ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (ඉදිරිපත් කිරීම සඳහා බුද්ධි මණ්ඩල සාකච්ඡා, නාට්‍ය, විරිදු, පෝස්ටර් යනාදි ක්‍රම භාවිත කළ හැකි ය.)

**ඇමුණුම 2**

ශු පාවුලු මුනිතුමා,
ජේසුස් වහන්සේ බාරේ,
ස්වර්ගය.
.......................................(ගිය සතියේ දිනයක්)

ජේසු පිහිටයි!

ආදර සිසු දරු දරියෙනි,

මට ඔබ ව, පෞද්ගලික ව මුණ ගැසීමට, මේ අවස්ථාවේ පැමිණීමට නොහැකි වීම ගැන, මම ඉතා කණගාටු වෙමි. ඒත් ඔබ වැනි දරු කැළක් ශු සභාව සතු වීම ගැන, මම ඉතා ආඩම්බර වෙමි. ඔබට මා මේ ලිපිය ලිවීමට අදහස් කළේ, ඔබේ විශ්වාසය ශක්තිමත් කර, ඔබ දිරි ගැන්වීමේ අභිලාශයෙනුයි.

නව ගිවිසුම සමයේ දී, මම විවිධ ස්ථානවලට යමින් දේශනා කළා; කිතුනු සභාවන් පිහිටෙව්වා අනතුරු ව, තවත් තැනකට ගොස්, පෙර පරිදි ම කළා. අද මෙන් එදා, ප්‍රවාහන පහසුකම් තිබුණේ නෑ ඒ නිසා, මා විසින් පෙර දිනක දී, පිහිටුවන ලද සභාවකට, යම් පණිවිඩයක් දීමට සිදු වූ විට, නැවත එම ස්ථානයට, එසැණින් යාමට හැකියාවක් තිබුණේ නෑ. අනෙක් අතට, මට යාමට අවශ්‍ය වුවත්, මම සිරගත ව හෝ, කාර්ය බහුල වී හෝ, සිටියා. ඒ නිසා, ඔබට මම, මෙලෙස ලියා එවන වාක් මෙන්, මම පිහිටුවා තිබූ සභාවලට ද, ලිපි ලියමින්, මාගේ පණිවිඩ ඔවුනට දැන්වුවා. නව ගිවිසුම තුළ ඇති මාගේ ලිපි, ලියැවුණේ ඒ ආකාරයටයි. ඒ ලිපි කියවා, අපෝස්තලික යුගයේ කිතුනු සභාවල අවශ්‍යතා හඳුනා ගැනීමට, මම ඔබට ආරාධනා කරමි. යම් දිනයක දී, ඔබ වත් ස්වර්ගයේ දී මුණ ගැසීමේ අභිලාෂයෙන්, මාගේ මෙම කෙටි ලිපිය අවසන් කරමි.

ස්තුතියි.

මෙයට,
ඔබ වෙනුවෙන් දිනපතා
දෙවිඳුන් යදින,
ශු. පාවුලු මුනිතුමා.

## ඇමුණුම 3
## ගවේෂණ පත්‍රිකාව
## නව ගිවිසුමේ දක්නට ඇති හසුන්

නව ගිවිසුමේ දක්නට ඇති කෘතින් 27න් 21ක් ම හසුන් වේ. මෙම සංදේශ 21න් 13ක කතෘත්වය ශු. පාවුලු තුමාට හිමි වේ. එම හසුන් 13හි කතෘත්වය ශු. පාවුලු තුමාට හිමි වීම තුළ, ඒවා ශු. පාවුලු තුමා විසින් ම ලියූ බවක් අදහස් නොකෙරෙයි. එහෙත් එම සෑම හසුනක් ම, යම් ආකාරයකට, ශු. පාවුලු තුමාට සම්බන්ධතාවක් ඇත. එම සම්බන්ධතාව සැලකිල්ලට ගනිමින්, එම හසුන් පහත සඳහන් අයුරින්, වර්ග කළ හැකි ය.

1. ශු. පාවුලු තුමා විසින් ම ලියන ලද හසුන්

   ශු. පාවුලු තුමා විසින් ම ලියන ලද සන්දේශ හතකි. ඒවා නම්:

   i. රෝම
   ii. 1 කොරින්ති
   iii. 2 කොරින්ති
   iv. ගලාති
   v. පිලිප්පි
   vi. 1 තෙසලෝනික හා
   vii. පිලොමොන් වේ.

2. ද්වීතීය පාවුලු හසුන්

   i. එපීස සහ
   ii. කොලොස්සි

   යන හසුන් දෙක මෙම වර්ගයට අයත් වේ.

3. ආරූඪ කතෘත්වය

   මෙම කොටසට අයත් හසුන් ගණන හතරකී ඒවා නම්,

   i. 2 තෙසලෝනික
   ii. 1 තිමති
   iii. 2 තිමති හා
   iv. තීතස් වේ.

ශු පාවුලුතුමාගේ හසුන් හැරුණවිට, තව හසුන් 8ක්, නව ගිවිසුමේ ඇත. ඒවා නම්,

i. හෙබ්‍රෙව්
ii. ජාකොබ්
iii. 1 පේදුරු
iv. 2 පේදුරු
v. 1 ජොහන්
vi. 2 ජොහන්
vii. 3 ජොහන් හා
viii. ජූද් වේ.

මේවා කතෝලික සංදේශ, විශ්ව සංදේශ, සාමාන්‍ය හසුන් යනාදි නම්වලින් ද හඳුන්වනු ලැබේ.

**ගෙදර පරිසරයෙන්** :

ශුද්ධ වූ පාවුලු තුමාගේ ලිපියක් කියවන්න.

## 4 වන පාඩම

## එළිදරව් සාහිත්‍යය

**නිපුණතාව** 1.0 : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා, එදිනෙදා ජීවිතයේ දී ඵලදායී ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 10.1.4: කිතුනු සංකේතවල වටිනාකම් අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- එළිදරව් සාහිත්‍යය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- සන්නිවේදනයේ දී සංකේතවල ඇති වටිනාකම අගය කරයි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ආගමික සංකේත ගෞරවයෙන් භාවිත කරයි.
- කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

විවිධ වර්ගයේ සංකේත කීපයක් (කුරුසියක්, බොරලික්කමක්, ධර්ම චක්‍රයක්, මාර්ග සංඥා, චන්ද සලකුණු යනාදිය) සිසුන්ට පෙන්වා, ඒවායේ අර්ථ / පණිවිඩ විමසන්න. අනතුරු ව, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡාවක් කරන්න.

- සෑම සංකේතයකට ම / සලකුණකට ම අර්ථයක් තිබෙන බව
- සලකුණක අර්ථය නොදන්නා විට එහි පණිවිඩය නොතේරෙන බව
- සලකුණක පණිවිඩය නොදන්නා විට එයට ප්‍රතිචාර දැක්විය නොහැකි බව (උදාහරණ :- මාර්ග සංඥා)
- සන්නිවේදනයේ දී සංකේතවල ඇති වැදගත්කම
- කිතුනු ආගමික සලකුණු කිතුනු අපට වැදගත් වන බව
- ඒවා පරිහරණය කළ යුතු ආකාරය

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා ඇමුණුම 2 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දි භාවිත කරන්න.

(මිනිත්තු 35)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
  ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කරගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.
- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- එළිදරව් සාහිත්‍යය යනු
- එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ
    1. ද්විත්වවාදය
    2. යුගාන්තවාදය
    3. සංකේත භාවිතය
    4. ආරූඪ නාමයකින් ඉදිරිපත් කිරීම

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය (එළිදරව් 6/2, 6/4-5, 6/8)
- විවිධ වර්ගයේ සංකේත (කුරුසියක්, බොරලික්කමක්, ධර්ම චක්‍රයක්, මාර්ග සංඥා, චන්ද සලකුණු යනාදිය)
- බ්‍රිසල්බෝඩ් / ඩිමයි, ප්ලැටිග්නම්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න.
  (පෙර ක්‍රියාකාරකමේ නායකත්වය නොගත් අයෙකුට අවස්ථාව ලබාදෙන්න)
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව, ඔබේ කණ්ඩායමේ සියලු දෙනාට ඇසෙන පරිදි, එක් අයෙකු, ශබ්ද නගා කියවන්න. සෙසු අය එයට හොඳින් සවන් දෙන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු, තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කරගෙන, "එළිදරව් සාහිත්‍යය" පිළිබඳ ව ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (ඉදිරිපත් කිරීම සඳහා බුද්ධි මණ්ඩල සාකච්ඡා, නාට්‍ය, විරිඳු, පෝස්ටර් යනාදි ක්‍රම භාවිත කළ හැකි ය.)

## ඇමුණුම 2
## ශුද්ධ බයිබලයේ එළිදරව් සාහිත්‍යය

ශුද්ධ බයිබලයේ ග්‍රන්ථ දෙකක්, එළිදරව් සාහිත්‍යය තුළ ලියවී ඇත. ඒවා නම්, පුරාණ ගිවිසුමේ දානියෙල් පොත හා නව ගිවිසුමේ එළිදරව්ව පොතයි. පුරාණ ගිවිසුමේ එළිදරව් සාහිත්‍යය බිහි වූයේ, දිවැසිවරුන් ඉශ්‍රායෙලයේ නොසිටි යුගයක ය. දිවැසිවරුන්ගෙන් ඇති වූ පුරප්පාඩුව, එළිදරව් සාහිත්‍යය සම්පූර්ණත්වයට පත් කළේ ය. තව ද, විශ්වාසය කරන කොට ගෙන විවිධ පීඩනයන්ට ලක් වූ විශ්වාසකයින් දිරිමත් කිරීම, එහි අරමුණකි. දානියෙල් පොත හා එළිදරව්ව පොත ලිය වී ඇත්තේ, පීඩන සමයන් දෙකක දී ය.

මෙම සාහිත්‍යයේ ලක්ෂණ කීපයක් හඳුනාගත හැකි ය.

1. ද්විත්වවාදය
   ද්විත්වවාදය යනු යහපත හා අයහපත අතර ගැටුමයි; යහපත් අය හා අයහපත් අය අතර ගැටුමයි.
2. යුගාන්තවාදය
   පීඩා තුළ පවා, දෙවියන් වහන්සේට විශ්වාසවන්තව කටයුතු කරන අයට, ගැලවීම හිමි වේ.
3. සංකේත භාවිතය
   අයහපත් අය අතට මෙම කෘතියක් පත් වුව ද, ඒවා කියවා තේරුම් ගැනීමට නොහැකි කිරීම සඳහා, සංකේත භාවිත කර ඇත. එම නිසා, මෙම කෘතියක් විශ්වාසකයින්ට විරුද්ධ අය කියවනු ලැබුව ද. එය ඔවුන්ට නොතේරෙයි. යහපත් අයට හා එහි කතෘට, අයහපත් අයගෙන් උපද්‍රව පැමිණීම වැළැක්වීම ඉන් අරමුණු කරයි. මෙවැනි සංකේත කීපයක් හා ඒවායේ අර්ථ මෙසේ යː
   - බැටළුවා-ජේසුස් වහන්සේ (එළිදරව් 4)
   - මකරා-යක්ෂයා (එළිදරව් 13)
   - සුදු-ජයග්‍රහණය (එළිදරව් 6/2)
   - රතු-යුද්ධය (එළිදරව් 6/4)
   - කලු-සාගතය (එළිදරව් 6/5)
   - සුදුමැලි පාට-මරණය (එළිදරව් 6/8)
   - 4-විශ්වාසය
   - 7-පූර්ණත්වය
   - 10-පරිපූර්ණත්වය
   - 12-ඉශ්‍රායෙලය
4. ආරූඪ නාමයකින් ඉදිරිපත් කිරීම

මෙහි පරමාර්ථ වන්නේ කතෘගේ ආරක්ෂාව හා කෘතියේ පිළිගැනීම වැඩි කිරීම ය. උදාහරණයක් ලෙස, දානියෙල් පොත හා එළිදරව්ව ග්‍රන්ථය ලියවී ඇත්තේ, ආරූඪ නාමයන්ගෙන් විය හැකි ය.

**ගෙදර පරිසරයෙන් ː**

පවුලේ සියලු දෙනා ආශිර්වාද කරන ලද කුරුසියක් හෝ බොරලික්කමක් පළඳින්න.පරිසර හිතකාමී වන්නට ළමුන් යොමු කරන්න.

## 5 වන පාඩම

## ප්‍රඥා සාහිත්‍යය

**නිපුණතාව** 1.0 : ශුද්ධ බයිබලය පිළිබඳ අවබෝධය ලබා, එදිනෙදා ජීවිතයේ දී ඵලදායී ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 10.1.5: ප්‍රඥාවෙන් සපිරි දැහැමි ජීවිතයක් ගත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ප්‍රඥාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- යහපත් දෙය පමණක් තෝරා ගනිමින්, ප්‍රඥාවන්ත ව කටයුතු කළ යුතු බවට තර්ක කරයි.
- ගොනු කර ගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ප්‍රඥාවන්ත ව කටයුතු කරයි.
- ප්‍රඥාවන්ත ව කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

1 රාජාවලිය 3/4-14හි ඇති සිද්ධිය කතන්දරයක් ලෙස ඉදිරිපත් කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.

- සලමොන් රජතුමා දෙවියන් වහන්සේගෙන් ඉල්ලූ දේ
- ප්‍රඥාව යනු
- ප්‍රඥාව දෙවියන් වහන්සේගෙන් ලැබෙන තිළිණයක් බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සිසුන් කණ්ඩායම් 4කට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දි භාවිත කරන්න..

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව, විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- ප්‍රඥා සාහිත්‍යය යනු
- ප්‍රඥාවේ ප්‍රභේද

- ප්‍රඥාව ඉදිරිපත් කර ඇති ආකාර
- සාහිත්‍යමය ස්වරූපයන්
- ප්‍රඥා සාහිත්‍යයේ අරමුණු හා ආධ්‍යාත්මිකත්වය
- එදිනෙදා ජීවිතය තුළ යහපත පමණක් තෝරා ගෙන කටයුතු කිරීමේ අවශ්‍යතාව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය (1 රාජාවලිය 3/4-14)
- බ්‍රිසිල්බෝඩ් / ඩිමයි, ප්ලැටිග්නම්
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න. (පෙර ක්‍රියාකාරකමේ නායකත්වය නොගත් අයෙකුට අවස්ථාව ලබාදෙන්න)
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව, ඔබේ කණ්ඩායමේ සියලු දෙනාට ඇසෙන පරිදි, එක් අයෙකු, ශබ්ද නගා කියවන්න. සෙසු අය එයට හොඳින් සවන් දෙන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු, තේරෙන අයගෙන් විමසා, දැන ගන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කරගෙන, "ප්‍රඥා සාහිත්‍යය" පිළිබඳව ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (ඉදිරිපත් කිරිම සඳහා බුද්ධි මණ්ඩල සාකච්ඡා, නාට්‍ය, විරිඳු, පෝස්ටර් යනාදි ක්‍රම භාවිත කළ හැකි ය.)

## ඇමුණුම 2
## ප්‍රඥා සාහිත්‍යය

හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රධානතම අරමුණ වූයේ, ජීවිතය සාර්ථක ලෙසත්, දැහැමි ලෙසත් ගෙවීමට ජනතාව පෙළඹවීමයි. මේ අතර, සමාජ පරිපාලනය මෙන් ම, ජීවිතයේ අරුත හා සීමාවන් අවබෝධ කර දෙයි. දෙවියන් වහන්සේට ප්‍රිය මනාප දිවියක් ගත කිරීමට මෙම කරුණු පිටිවහලකි.

හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද හතරකිඃ

1. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව
   පවුල හා ගෝත්‍රය සංරක්ෂණය වීම සඳහා වූ සම්ප්‍රදායයන්, උපදේශනයන් හා නීතිරීතින් මෙයට අයත් වේ. (සිරාක් 3)

2. රාජ්‍ය සභා ප්‍රඥාව
   රාජ්‍ය පාලනය හා අනෙකුත් පරිපාලන ක්ෂෙත්‍රයන් ඉලක්ක කරගෙන යෞවනයන් පුහුණු කිරීම. මෙහි මුඛ්‍ය පරමාර්ථය විය. (සිරාක් 6/1-11)
3. අභිධාර්මික ප්‍රඥාව
   ජීවිතයේ හරය, එහි ගැටලු හා විශ්වය පිළිබඳ සංකල්පනා ආශ්‍රිත ව කෙරුණු විග්‍රහයකි. (ජෝබ් පොත)
4. එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව
   කෙනෙකු එදිනෙදා ජීවිතය තුළ මුහුණ දෙන අවස්ථා පිළිබඳ ව උපදේශනයන් මෙයට ඇතුළත් වේ. (හිතෝපදේශය 6 හා 25)

ප්‍රඥා සාහිත්‍යයට ග්‍රන්ථයන් 7ක් අයත් වේ. ඒවා නම්, ජෝබ්, ගීතාවලිය, හිතෝපදේශය, ධර්මදේශකයා, ප්‍රේම ගී, ප්‍රඥාව හා සිරාක් (උපදේශකයා) වේ.

පුරාණ ගිවිසුම තුළ ප්‍රඥාව ඉදිරිපත් කිරීමේ දී විවිධත්වයක් දක්නට ලැබේ. එනම්, ප්‍රස්තාව පිරුළු (හිතෝපදේශය), උපදේශ (සිරාක්), කතාන්දර (ජෝබ්), සංකලපනා (ධර්මදේශකයා) සහ ගීත (ප්‍රේම ගී) යනාදිය ඉන් සමහරකි.

**ගෙදර පරිසරයෙන් :**

දිනපතා යැදුමේ දී ප්‍රඥාව පතා දෙවියන් වහන්සේට පවුලක් ලෙස යාච්ඤා කරන්න.

## 6 වන පාඩම

## පාස්කු අභිරහස

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින්, විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.
**නිපුණතා මට්ටම 10.2.1**: එදිනෙදා ජීවිතය තුළින් පාස්කු අභිරහසට පංගුකාරවෙමින්, නව අහසක් හා නව පොළොවක් දිනා ගැනීමට කටයුතු කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- පාස්කු අභිරහස පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ක්‍රිස්තුන් වහන්සේ මෙන් අපත් යම් දිනක උත්ථාන වන බව පිළිගනියි.
- එම්මාවුස් ගමන පිළිබඳ ව තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- එදිනෙදා ජීවිත සිද්ධීන් තුළින් පාස්කු අභිරහසට පංගුකාරයෙක් වෙයි.
- අන් අයගේ දුකේ දී සහය වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

එදිනෙදා ජීවිතයේ දී ජනතාව අත්දකින විවිධ අභියෝගයන් ඇතුළත් පුවත්පත් ශීර්ෂ පාඨ සිසුවෙකු ලවා කියවා, පහත සඳහන් කරුණු ද ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.

- වර්තමාන ලෝකය තුළ මෙවැනි ම්ලේච්ඡ ක්‍රියා, සමාජ අසාධාරණයන් දිනපතා සිදුවන බව
- මෙවැනි ම වූ සිදුවීමක් දනට වසර දෙදහකට පෙර ද සිදු වූ බව
- එය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ කුරිරු මරණය බව

(මිනිත්තු 10)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ක.ස.ධ පාඨ හා ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම බැගින් ලබා දෙන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් හා ගුණාත්මක යෙදවුම්වල සඳහන් ද්‍රව්‍ය ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න.

(මිනිත්තු 40)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව, විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම කණ්ඩායමේ අනෙක් සිසුන්ට ද අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- අනෙක් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය (ලූක් 22/54 - 23/25)
- ජේසුස් වහන්සේගේ උකුත්වීම (ලූක් 23/26-56)
- ජේසුස් වහන්සේගේ උත්ථානය (ජුවාම් 20/1-18)
- ජේසුස් වහන්සේගේ දර්ශනයන්
  ශ්‍රාවකයන්ට (ජුවාම් 20/19-29)
  එම්මාවුස් ගමන (ලූක් 24/13-35)
- කතෝලික සභා ධර්මෝපදේශය 571-573, 595-597, 624-628, 631-635,
- නව අහස හා නව පොළොව (උත්පත්ති 1/1, එළිදරව්ව 21/1, 22/13 හා කතෝලික සභා ධර්මෝපදේශය 1042-1050)
- ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විදීම, මරණය හා උත්ථානය පාස්කු අභිරහස තුළින් සිහිපත් කරන බව
- ස්වර්ගයේ දොරටුව විවර කර එම ජීවිතය අපට ලබා දීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ දුක් විඳීම තෝරා ගත් බව
- දිව්‍ය පූජාව තුළින් අප ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහසට සම්බන්ධ වන බව
- පාපී ක්‍රියා අතහැර දේව රාජ්‍යයේ ගුණාංග අනුව ජීවත් වීම තුළින් ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනයට සූදානම් විය යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම (ලූක් 22/54, 23/25, 23/26-56, 24/13-35, ජොහාන් 20/1-18, 20/19-29, උත්පත්ති 1/1, එළිදරව්ව 21/1, 22/13)
- කතෝලික සභා ධර්මෝපදේශය (571-573, 595-597, 624-628, 631-635, 1042-105)
- පුවත්පත් ශීර්ෂ පාඨ (එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන ජීවිත අභියෝග)
- බ්‍රිසිල් බෝඩ්, ඩිමයි කොළ හා මාකර් පෑන්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න.
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති බයිබල් පාඨ, ඔබේ කණ්ඩායමේ සියලු දෙනාට ඇසෙන පරිදි, එක් අයෙකු, ශබ්ද නගා කියවන්න. සෙසු අය එයට හොඳින් සවන් දෙන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඔබ කණ්ඩායම කියවා ගොනු කරගත් කරුණු පදනම් කරගෙන පහත සඳහන් ඉදිරිපත් කිරීම සඳහා සූදානම් වන්න.

| | |
|---|---|
| **කණ්ඩායම් අංක 1** | ලූක් 22/54-23/25 කියවා, ක්‍රිස්තුන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය පිළිබඳ ව කතාවක් ඉදිරිපත් කරන්න. |
| **කණ්ඩායම්අංක 2** | ලූක් 23/26-56 කියවා, ක්‍රිස්තුන් වහන්සේගේ මරණය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්න. |
| **කණ්ඩායම් අංක 3** | ජුවාම් 20/1-18 කියවා, ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය පිළිබඳ තොරතුරු, නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න. |
| **කණ්ඩායම් අංක 4** | ජුවාම් 20/19-29 කියවා, ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයන්ට දර්ශනය වීම සම්බන්ධ සිද්ධීන් රඟ දක්වන්න. |
| **කණ්ඩායම් අංක 5** | ලූක් 24/13-35 කියවා, ක්‍රිස්තුන් වහන්සේගේ එම්මාවුස් ගමන නාට්‍යානුසාරයෙන් රඟ දක්වන්න. |

ගෙදර පරිසරයෙන් :

චතාරික කාලය තුළ පැවැත්වෙන භක්ති අභ්‍යාසවලට පවුලක් ලෙස සහභාගි වන්න.

## 7 වන පාඩම

## ජේසුස් වහන්සේගේ උපත

**නිපුණතාව** 2.0 : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින්, විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම** 10.2.2: ශුද්ධාත්ම වරමින් පූර්ණ ව කිතුනු දිවියට සාක්ෂි දරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- මුල් කිතුනු සභාවේ ලක්ෂණ විස්තර කරයි.
- ශුද්ධාත්මයාණන් අප ව නිවැරදි මාර්ගයේ ගෙන යන බව පිළිගනියි.
- ''උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරූ පළමු ප්‍රාණ පරිත්‍යාගීවරයා'' යන මැයෙන් නිර්මාණයක් ඉදිරිපත් කරයි.
- කිතුනු ජීවිතයට සාක්ෂි දරයි.
- තමන් සතු දේ දුප්පතුන් සමග බෙදා ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර** 1

මීසමේ කිතුනු ඒකකවල පැවැත්වෙන ජපමාල මෙහෙයයන් හෝ දිව්‍ය පූජාවන් ආදිය පිළිබඳව ද, ඒ මගින් සිසුන් ලබා ඇති අත්දැකීම් පිළිබඳ ව ද සාකච්ඡා කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡාවක් කරන්න.

- මෙවැනි ක්‍රියාකාරකම් ප්‍රේමයේ ක්‍රියාකාරකම් වන බව
- මුල් කිතුනු සභාව ද මෙලෙස කළ බව
- ශුද්ධාත්මයාණන්ගේ සහය ඇති ව ප්‍රේමයේ ජීවිතයක් ගත කළ හැකි බව

(මිනිත්තු 20)

**පියවර** 2

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම බැගින් ලබා දෙන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා ඇමුණුම 2 බැගින් හා ගුණාත්මක යෙදවුම්වල සඳහන් ද්‍රව්‍ය ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිතා කරන්න.

(මිනිත්තු 60)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව, විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම කණ්ඩායමේ අනෙකුත් සිසුන්ට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලින් ද සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කරගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- පෙන්තකොස්තය (ක්‍රියා 2/1-13)
  (ජුදා ජාතික අපෝස්තුලුවරුන්ට ශුද්ධාත්ම වරම් ලැබීම)
- පෙන්තකොස්ත දිනයේ පේදුරුතුමාගේ දේශනාව හා එහි ප්‍රතිඵල (ක්‍රියා 2/14-41)
- කොර්නේලියස්ගේ ගෙදර දී විජාතිකයන්ට ශුද්ධාත්ම වරම් ලැබීම (ක්‍රියා 10/1-8, 44-48)
- මුල් කිතුනු සභාවේ ලක්ෂණ (ක්‍රියා 2/42-47, 4/32-37)
- උපස්ථායකයින් පත්කිරීම (ක්‍රියා 6/1-7)
- ශුද්ධ වූ ස්තේපන් තුමාගේ සාක්ෂිය (පළමු ප්‍රාණ පරිත්‍යාගීවරයා) (ක්‍රියා 6/8-15, 7/54-60)
- ශුද්ධ වූ ජාකොබ් තුමා (අපෝස්තුලුවරුන් අතරින් පළමු ප්‍රාණ පරිත්‍යාගීවරයා) (ක්‍රියා 12/1-2)
- අපෝස්තුලුවරුන් වෙත ශුද්ධාත්මයාණන් වැඩම කිරීමත් සමග ම ඔවුන්ගේ ජීවිත වෙනස් වූ බව
- ඔවුන් නිර්භය ව ශුභාරංචිය දේශනා කළ බව
- එය වර්තමානයේ ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමට පසුබට වන්නන්ට අභියෝගයක් වන බව
- කිතු දහම සියල්ලන්ට ම පොදු දහමක් බව
- ජනතාවගේ සුබ සිද්ධිය උදෙසා කැපවීමෙන් ශුද්ධ වූ සභාව තුළ ක්‍රියා කළ යුතු බව උපස්ථායකයින් පත් කිරීමෙන් පැහැදිලි වන බව
- ක්‍රිස්තුන් වහන්සේගේ හේවා භටයින් ලෙස නිතර ම ඔවුන් වහන්සේට සාක්ෂි දැරිය යුතු බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම
  (ක්‍රියා 2/1-13, 2/14-41, 10/1-8, 44-48, 2/42-47, 4/32-37, 6/1-15, 7/54-60, 12/1-2)
- බ්‍රිසිල් බෝඩ්, ඩිමයි කොළ හා මාකර් පෑන්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න.
- ඔබ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව, ඔබේ කණ්ඩායමේ සියලු දෙනාට ඇසෙන පරිදි, එක් අයෙකු, ශබ්ද නගා කියවන්න. සෙසු අය එයට හොඳින් සවන් දෙන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඔබ කණ්ඩායම කියවා ගොනු කරගත් කරුණු, පදනම් කරගෙන පහත සඳහන් පැවරුම නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඇමුණුම 2
## ගවේෂණ පත්‍රිකා

**කණ්ඩායම්අංක 1** ක්‍රියා 2/1-13 කියවා, අපෝස්තුලුවරුන් මතට ශුද්ධාත්මයාණන් වැඩම කිරීමේ සිද්ධිය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම් අංක 2** ක්‍රියා 2/14-41 කොටසේ සඳහන් පේදුරු තුමාගේ දේශනය කියවා කථාවක් කරන්න.

**කණ්ඩායම් අංක 3** ක්‍රියා 10/1-18, 44-48 අනුව, කොරනේලියස්ගේ සිත්හැරීම නාට්‍යයකින් ගෙනහැර දක්වන්න.

**කණ්ඩායම් අංක 4** ක්‍රියා 2/42-47, 4/32-37 කියවා, මුල් කිතුනු සභාවේ ලක්ෂණ ගොනු කර, ප්‍රදර්ශනය කරන්න.

**කණ්ඩායම් අංක 5** ක්‍රියා 6/1-7 කියවා, වර්තමාන සමාජයේ ජනතා සුභ සිද්ධිය සඳහා කැප වී ක්‍රියා කළ යුතු ආකාරය පෝස්ටරයක් මගින් ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම් අංක 6** ක්‍රියා 6/8-15, 7/54-60 හා 12/1-2 කියවා, වර්තමානයේ කිතුනු සාක්ෂිකරුවන් ලෙස කෙලෙස ක්‍රියා කළ යුතු ද? යන්න නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

ගෙදර පරිසරයෙන් :

කිතුනු පවුලක් ලෙස ප්‍රේමයේ ක්‍රියාකාරකම්වලට සහභාගි විය යුතු බව පිළිගෙන ක්‍රියා කරන්න.

## 8 වන පාඩම

## ශුද්ධ වූ පාවුලු තුමා

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින්, විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 10.2.3**: සැබෑ සිත්හැරීම තුළ ශුභාරංචියේ පණිවිඩකරුවෙක් වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ශුද්ධ වූ පාවුලු තුමා පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ධර්මදූතවරයෙක් වීමට පරිත්‍යාගයක් අවශ්‍ය බව පිළිගනියි.
- ශුද්ධ වූ පාවුලු තුමා දමස්කයට යාමේ සිද්ධිය නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි.
- තම හැකියාවන් ශුද්ධ වූ සභාවේ දියුණුව සඳහා භාවිත කරයි.
- දිව්‍ය පූජාව හා දහම් පාසල් නොයන මිතුරන්ට එහි ඇති වැදගත්කම පහදා දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- ඇමුණුම 2ට අනුව, සිසුන් රවුමට සිටුවා, දක්වා ඇති ක්‍රීඩාව කරන්න.
  ශුද්ධ වූ පාවුලු තුමාගේ පින්තූරය පෙන්වා, පහත සඳහන් කරුණු ද ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
- කිතුනුවන්ට පීඩා කිරීම සඳහා සාවුල් දමස්කයට ගිය බව
- සත්‍ය දැන ගෙන එයට සාක්ෂි දැරීමේ දී සත්‍යය පැතිරෙන බව
- අප සැම විට ම දේව කැමැත්ත හඳුනා ගෙන එයට ප්‍රතිචාර දැක්විය යුතු බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි පන්තිය කණ්ඩායම් 2කට බෙදන්න.
- සැම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා ඇමුණුම 2 බැගින් හා ගුණාත්මක යෙදවුම්වල සඳහන් ද්‍රව්‍ය ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කර වන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දි භාවිත කරන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව, විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම කණ්ඩායමේ අනෙකුත් සිසුන්ට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලින් ද සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- ජුදා දහමට බෙහෙවින් ඇලුම් කළ හෙයින් සාවුල් ශුද්ධ වූ සභාවට පීඩා කළ බව
- කැඳවීමට පෙර පාවුලු තුමා ශුද්ධ වූ සභාවට පීඩා කළ බව (ක්‍රියා 8/1-3)
- ශුද්ධ වූ පාවුලු තුමාගේ කැඳවීම  (ක්‍රියා 9/1-19)
- ශුද්ධ වූ සභාව පැතිරවීම සඳහා ශුද්ධ වූ පාවුලු තුමා ව ජේසුස් වහන්සේ සූදානම් කළ ආකාරය
- ශුද්ධ වූ පාවුලුතුමාගේ ධර්මදූත චාරිකා
- පළමු ධර්මදූත ගමන
- දෙවන ධර්මදූත ගමන
- තෙවන ධර්මදූත ගමන (ශුද්ධ වූ පාවුලු තුමාගේ ධර්මදූත ගමන්වල දී ගමන් කළ වැදගත් නගර පමණක් දැන ගැනීම සෑහේ.)
- ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම තුළ ශුද්ධ වූ පාවුලු තුමා, ධර්මදූත චාරිකාවල නිරත වූ බව
- ශුද්ධ වූ පාවුලු තුමාගේ ජීවිතයේ අවසාන කාලය
- කිතුනු සභාව ස්ථාපිත කර ඔවුන් දැනුවත් කිරීම සඳහා හසුන් ලියූ බව
- අභියෝගයන්ට හා පීඩාවන්වලට නොපසුබට ව මුහුණ දී ජයග්‍රහණය ලැබූ බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම (ක්‍රියා 8/1-3, 9/1-19)
- ශුද්ධ වූ පාවුලු තුමාගේ පින්තූර
- ශුද්ධ වූ පාවුලු තුමාගේ තොරතුරු ඇතුළත් CD තැටි
- ශුද්ධ වූ පාවුලු තුමාගේ තොරතුරු ඇතුළත් සඟරා
- හුවමාරු කළ හැකි දෙයක් (උදාහරණ : පන්දුවක් වැනි)
- ශුද්ධ වූ පාවුලු තුමාගේ ධර්මදූත ගමන් ඇතුළත් සිතියම්
- බ්‍රිසිල් බෝඩ්, ඩිමයි කොළ හා මාකර් පෑන්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න.
- ඔබ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව, ඔබේ කණ්ඩායමේ සියලු දෙනාට ඇසෙන පරිදි, එක් අයෙකු, ශබ්ද නගා කියවන්න. සෙසු අය එයට හොඳින් සවන් දෙන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැන ගන්න.

ඔබ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන, පහත සඳහන් පැවරුම් නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

- **කණ්ඩායම් අංක 1:** ක්‍රියා 8/1-3, 9/1-19 කියවා, ශුද්ධ වූ පාවුලු තුමාගේ කැඳවීම නාට්‍යයානුසාරයෙන් ඉදිරිපත් කරන්න.

- **කණ්ඩායම්අංක 2:** ශුද්ධ වූ පාවුලු තුමාගේ පළමු ධර්මදූත ගමන දැක්වෙන සිතියම හොඳින් අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් එතුමා ගිය නගර පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්න.

- **කණ්ඩායම් අංක 3:** ශුද්ධ වූ පාවුලු තුමාගේ දෙවන ධර්මදූත ගමන දැක්වෙන සිතියම හොඳින් අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් එතුමා ගිය නගර පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්න.

- **කණ්ඩායම් අංක 4:** ශුද්ධ වූ පාවුලු තුමාගේ තෙවන ධර්මදූත ගමන දැක්වෙන සිතියම හොඳින් අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් එතුමා ගිය නගර පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්න.

## ඇමුණුම 2
## නියුක්තිකරණය සඳහා උපදෙස්

- සිසුන් රවුමට සිටුවන්න.
- හුවමාරු කළ හැකි ද්‍රව්‍යයක් සූදානම් කරගන්න. (නිදසුනක්: පන්දුවක්)
- පහත සඳහන් ක්‍රියාකාරකම් අඩංගු පත්‍රිකාව තම භාරයේ තබාගන්න.
  i. තෙරේසා මව්තුමිය රෝගියෙකු ඔසවාගෙන යාම
  ii. ශුද්ධ වූ ස්තේපන්තුමාගේ අවසාන ඉල්ලීම
  iii. ශුද්ධ වූ පේදුරුතුමා ජේසුස් වහන්සේ ව ප්‍රතික්ෂේප කළ සිද්ධිය
  iv. සාවුල් දමස්කයට යාම, බිම වැටීම
- හුවමාරු කෙරෙන භාණ්ඩය සිසුන් අතරේ හුවමාරු වන විට, යම් වාදනයක් නිකුත් කර, එය නවත්වන්න. එම අවස්ථාවේ දී එම භාණ්ඩය අතැති තැනැත්තා පළමු වන සිද්ධිය රඟපෑ යුතුය.
- අඛණ්ඩව මෙම ක්‍රීඩාව සිදු කර සාවුල්ගේ සිද්ධිය සමඟ එය නවතා, නියුක්තිකරණ කොටුවේ සඳහන් කරුණු පදනම් කර ගෙන සාකච්ඡාව ගොඩනගන්න.

**ගෙදර පරිසරයෙන්** :

ශුද්ධ වූ පාවුලු තුමා පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ කියවා තොරතුරු දැනගන්න.

## 9 වන පාඩම

## ශුද්ධ වූ පේදුරු තුමා

**නිපුණතාව 2.0** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින් විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 10.2.4**: ශුද්ධ වූ සභාවේ ශ්‍රේෂ්ඨයන්ට ගරු කරයි; කීකරු වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ශුද්ධවූ සභාවේ නායකත්වය අඛණ්ඩ ව පවතින ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දේව කැඳවීමට ප්‍රතිචාර දැක්විය යුතු බව පිළිගනියි.
- ගොනු කර ගත් කරුණු නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි.
- ශුද්ධ වූ සභාවේ ශ්‍රේෂ්ඨයන්ට කීකරු වෙයි.
- ශුද්ධ වූ සභාවේ ශ්‍රේෂ්ඨයන්ට ගරු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

වර්තමාන ශුද්ධෝත්තම පියතුමන්ගේ පින්තූරය පෙන්වා, ඒ පිළිබඳව විමසා, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.

- වර්තමාන ශුද්ධෝත්තම පියතුමන්ගේ නම ෆ්‍රැන්සිස් වන බව
- කතෝලික සභාවේ ප්‍රථම ශුද්ධෝත්තම පියා ශුද්ධ වූ පේදුරු තුමන් වන බව

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා ඇමුණුම 2 බැගින් හා ගුණාත්මක යෙදවුම්වල සඳහන් ද්‍රව්‍ය ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මඟ පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිතා කරන්න.

(මිනිත්තු 40)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව, විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම කණ්ඩායමේ අනෙකුත් සිසුන්ට අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- ශුද්ධ වූ පේදුරු තුමාගේ කැඳවීම (ලූක් 5/1-11)

- ශුද්ධ වූ පේදුරු තුමා සියල්ල අතහැර දේව වචනය විශ්වාස කළ බව
- ශුද්ධ වූ පේදුරු තුමාගේ මහා ප්‍රකාශනය (මතෙව් 16/13-20)
- කිසිඳු පැකිලීමකින් තොර ව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දේව පුත්‍රයාණන් යන්න ප්‍රකාශ කළ බව
- පේදුරු තුමාට නායකත්වය පැවරීම  (මතෙව් 16/18)
- පේදුරු තුමාට පැවරූ තුන් ප්‍රකාර භාරය
  (ජුවාම් 21/15-19, ක.ස.ධ 551-553, 765, 816 හා 862 )
- ශුද්ධ වූ පේදුරු තුමන්ගෙන් පසු ව අඛණ්ඩ ව එම තනතුරට ශුද්ධෝත්තම පියවරුන් පත් වූ බව
- වර්තමාන ශුද්ධෝත්තම පියතුමන් 266 වන ශුද්ධෝත්තම පියතුමන් වන බව
- ශුද්ධෝත්තම පියවරුන් දේව අනුග්‍රහයෙන් ශුද්ධාත්ම මඟ පෙන්වීම අනුව තේරී පත්වන බව
- ශුද්ධ වූ සභාවේ ශ්‍රේෂ්ඨයන්ට ගරු කිරීම හා කීකරුවීම අපේ වගකීම වන බව
- අති උතුම් පළමුවන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් පිළිබඳ කෙටි විස්තරයක්
- අප දුබලයන් වුවත් දෙවියන් වහන්සේ අපට පැවෙරෙන වගකීම් ඉටු කිරීමට අපට ශක්තිය ලබාදෙන බව

(මිනිත්තු 25)

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම (ලූක් 5/1-11, මතෙව් 16/13-20, ජුවාම් 21/15-19)
- කතෝලික සභා ධර්මෝපදේශය 551-553, 765, 816 හා 862
- වර්තමාන ශුද්ධෝත්තම පියතුමන් වන අතිඋතුම්  පළමුවන ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාගේ පින්තූරයක්
- ලිවීම සඳහා කොළ, ඩිමයි කොළ හා මාකර් පෑන්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න.
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති කියවීම් ද්‍රව්‍ය, ඔබේ කණ්ඩායමේ සියලු දෙනාට ඇසෙන පරිදි, එක් අයෙකු, ශබ්ද නගා කියවන්න. සෙසු අය එයට හොඳින් සවන් දෙන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඔබ කණ්ඩායම කියවා ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති බයිබල් පාඨය කියවා, එය නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරන්න.

**කණ්ඩායම් අංක 1** ලූක් 5/1-11

**කණ්ඩායම් අංක 2** මතෙව් 16/13-20

**කණ්ඩායම් අංක 3** ජුවාම් 21/15-19

**කණ්ඩායම් අංක 4** ඇමුණුම 2 කියවා අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරන්න.

## ඇමුණුම 2

## අති උතුම් පළමුවන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

අති උතුම් පළමුවන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ශුද්ධ වූ කතෝලික සභාවේ 266වන ශුද්ධෝතම පියතුමන් ලෙස 2013 මාර්තු මස 15වන දින තෝරා පත්කරනු ලැබුණි. මෙතුමා දකුණු ඇමරිකාවේ ආර්ජන්ටිනාවේ අගනුවර වන බුවනස් අයිරිස් (මෙහි අරුත පිරිසිඳු සුළඟ) අගරදගුරු පදවියේ අගරදගුරු ලෙස සේවය කළේ ය. මෙතුමාගේ නම හොර්හේ ජෝර්ජ් මාරියෝ බර්ගොලියෝ වන අතර, පාප්ධුරයෙන් පිඳුම් ලැබූ පසු මෙතුමා තෝරාගත් නම ෆ්‍රැන්සිස් වේ. මෙතුමා 1936 දෙසැම්බර් මස 17වන දින උපත ලැබුවේය. ජේසු නිකායික ප්‍රථම පාප්වහන්සේය. එමෙන් ම යුරෝපයෙන් පරිබාහිරව තෝරා ගනු ලැබූ පළමු පාප් වහන්සේ මෙතුමන් ය. මෙතුමන්ගේ මව රෙජිනා මාරියා වූ අතර පියා ජෝසේ බර්ගොලියෝ විය. පාප්ධුරයට පත්කරනු ලබන විට මෙතුමන්ගේ වයස අවුරුදු 76ක් විය.

- අයිරිස් නගරයේ විල්ලා ඩෙවෝට්ටා නමැති දෙව්සත්හලේ ඉගෙනුම ලැබූ මෙතුමා 1969 දී පූජකවරය ලැබුවේ ය. පසු ව දේව ධර්මය පිළිබඳ මහාචාර්යවරයෙකු ලෙස සේවය කළේ ය.
- 1973 සිට 1979 දක්වා ආර්ජන්ටිනාවේ ජේසු නිකායික ප්‍රාදේශාධිපති ලෙස පත්කරනු ලැබුවේ ය.
- 1986 තමා අධ්‍යාපනය ලැබූ දෙව්සත්හලේ අදියුරු ලෙස පත්කරනු ලැබී ය.
- 1988 දී කාර්දිනල් ධුරයට පත් කරනු ලැබිණි.

**ගෙදර පරිසරයෙන්** :

ශුද්ධෝත්තම පියතුමන්ගේ ඡායාරූපයක් නිවසේ තබාගන්න.

## 10 වන පාඩම

## ශුද්ධ වූ සභාවේ ලක්ෂණ

**නිපුණතාව** 2.0 : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින්, විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම** 10.2.5: අපෝස්තුලුවරුන්ගෙන් පැවත එන එක ම ශුද්ධ වූ කතෝලික සභාවේ ක්‍රියාකාරී සමාජිකයෙක් වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ශුද්ධ වූ සභාවේ ලක්ෂණ ගොනු කරයි.
- ශුද්ධ වූ සභාවේ සාමාජිකයන් කිසිදු භේදයකින් තොර ව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.
- ශුද්ධ වූ සභාව අති ඉන්ද්‍රීය ක්‍රිස්තු දේහය ලෙස ක්‍රියා කළ යුතු ආකාරය නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි.
- අති ඉන්ද්‍රීය ක්‍රිස්තු දේහයේ සාමාජිකයන් ලෙස තම වගකීම් ඉටු කරයි.
- අසල් වැසියන්ගේ අවශ්‍යතාවල දී උදව් කිරීමට ඉදිරිපත්වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

රතු කුරුස හමුදාවේ ධජය පෙන්වා, ඒ පිළිබඳව සාකච්ඡා කරමින් පහත සඳහන් කරුණු ද ඉස්මතු වන සේ සාකච්ඡාවක් කරන්න.

- ශුද්ධ වූ සභාව අන් සියලු ම සංවිධානවලට වඩා වෙනස් බව
- එය දේව රාජ්‍යය කරා වන්දනා ගමනක යෙදෙන බව
- ප්‍රසාද ස්නාපනය තුළින් ලැබූ ශුද්ධ වූ සභාවේ සාමාජිකත්වය මඟින් දෙව් මිනිස් සබඳතාව ඇති කරන බව

(මිනිත්තු 05)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් හා ගුණාත්මක යෙදවුම්වල සඳහන් ද්‍රව්‍ය ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මඟ පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න.

(මිනිත්තු 20)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව, විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කරගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- ශුද්ධ වූ සභාවේ ලක්ෂණ
  - ඒකත්වය (ක.ස.ධ 813 - 822)
  - ශුද්ධත්වය (ක.ස.ධ 823 - 829)
  - කතෝලිකත්වය (ක.ස.ධ 830 - 831)
  - අපෝස්තලිකත්වය (ක.ස.ධ 857, 861 හා 862)
- ශුද්ධ වූ සභාව ක්‍රිස්තුන් වහන්සේගේ අති ඉන්ද්‍රිය ක්‍රිස්තු දේහය බව (1 කොරින්ති 12/12-30, ජාතීන්ගේ ආලෝකය අංක 9)
- ක්‍රිස්තුන් වහන්සේ ශුද්ධ වූ සභාවේ හිස වන අතර, ප්‍රසාද ස්නාපනය ලැබූ සියලු දෙනාම එහි අවයවයන් වන බව
- ශුද්ධ වූ සභාවේ සාමාජිකයන් වන අප සියලු දෙන ම ප්‍රේමයෙන් එකමුතුකමින් හා සහයෝගයෙන් ක්‍රියා කළ යුතු බව
- ශරීරයේ සෑම අවයවයකට ම අනන්‍ය වූ කාර්යභාරයක් ඇති බැවින් එය ශරීරයට අත්‍යවශ්‍ය බව
- එලෙස ම ශුද්ධ වූ සෑම සාමාජිකයෙකුට ම අනන්‍ය වූ කාර්යභාරයක් ඇති බවත්, ඔහු ශුද්ධ වූ සභාවට අත්‍යවශ්‍ය බව

(මිනිත්තු 15)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම (1 කොරින්ති 12/12-30)
- කතෝලික සභා ධර්මෝපදේශ පාඨ - (ක.ස.ධ 813, 831, 857, 861 හා 862)
- දෙවන වතිකාන ප්‍රකාශනය (ජාතීන්ගේ ආලෝකය - අංක 09)
- ජාත්‍යන්තර රතු කුරුස හමුදාවේ ධජය
- ඩිමයි කොළ හා මාකර් පෑන්
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න.
- 1 කොරින්ති 12/12-30, ක.ස.ධ පාඨ - 813, 831, 857, 861 හා 862 හා ජාතීන්ගේ ආලෝකය අංක 9 කියවා එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඔබ කණ්ඩායම කියවා ගොනු කරගත් කරුණු පදනම් කරගෙන පහත සඳහන් ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

**කණ්ඩායම් අංක 1** ශුද්ධ වූ සභාවේ ලක්ෂණ දෙකක් වන ''ඒකත්වය හා ශුද්ධත්වය'' යන මැයෙන් රචනාවක් ලියන්න.

**කණ්ඩායම්අංක 2** ''කතෝලිකත්වය හා අපෝස්තලිකත්වය'' යන ලක්ෂණ පිළිබඳ ව ඔබ මීසමේ සඟරාවකට ලිපියක් ලියන්න.

**කණ්ඩායම් අංක 3** ශුද්ධ වූ සභාව අති ඉන්ද්‍රීය ක්‍රිස්තු දේහය ලෙස ක්‍රියා කළ යුතු ආකාරය නාට්‍යානුසාරයෙන් රඟ දැක්වීමට සූදානම් වන්න.

ගෙදර පරිසරයෙන් :

මීසමේ සමිති සමාගම්වලට බැඳී සේවය කරන්න.

## 11 වන පාඩම

## ශ්‍රී ලාංකික කතෝලික සභාව

**නිපුණතාව 2.0 :** දේව අනාවරණයට ප්‍රතිචාර දක්වමින්, විශ්වාසයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 10.2.6:** ශ්‍රී ලාංකික කතෝලික අනන්‍යතාව සුරකිමින්, ක්‍රියාශීලී ජාතික ඒකාබද්ධතාව, අනන්‍යතාව හා ජාතික සමගිය ගොඩ නැගීමට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- ශ්‍රී ලංකාවේ කතෝලික සභාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ශ්‍රී ලංකාවේ කතෝලික අනන්‍යතාවය සුරැකිය යුතු බව පිළිගනියි.
- ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- විවිධ අභියෝග හමුවේ කතෝලික විශ්වාසය සුරකියි.
- ජාතික සමගිය ගොඩනැගීමට දායක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පියවර 1**

- ඇමුණුම 2ට අනුව භාග්‍යවන්ත ජුසේ වාස් පිය ගීතිකාව ගුරුවරයා පන්තියේ දී සිසුන් සමග ගායනා කරන්න. (හැකි නම් CD තැටි මගින් ශ්‍රවණය කිරීමට ද අවස්ථාව දෙන්න.)

මෙම ගීතිකාව තුළින් පවසන්නේ කා පිළිබඳ ව ද යන්න විමසමින්, පහත සඳහන් කරුණු ද ඉස්මතු කරමින්, සාකච්ඡාවක් කරන්න.

- භාග්‍යවන්ත ජුසේවාස් පියතුමා
- උපත - ඉන්දියාවේ
- සේවය - ශ්‍රී ලංකාවේ
- කාලය - ලන්දේසි සමය
- කතෝලික පියවරුන් සාතනය කරන යුගයක ශ්‍රී ලංකාවට පැමිණි බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් හා ගුණාත්මක යෙදවුම්වල සඳහන් අදාළ ද්‍රව්‍ය ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න.

(මිනිත්තු 60)

පියවර 3

- එක් එක් කණ්ඩායමට ලැබී ඇති ක්‍රියාකාරකමේ අවසාන නිමැවුම පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කරගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- පෘතුගීසීන් පැමිණීමට පෙර යුගය
    - ශුද්ධ වූ තෝමස් අපෝස්තුලුවරයා හා ශ්‍රී ලංකාව
    - නෙස්ටෝරියන් කිතුනුවන්
    - සීගිරි කාශ්‍යප රාජ සමයේ කිතුනුවන් සිටි බවට සාක්ෂි
    - ක්‍රි.ව. 1912 දී අනුරාධපුරයෙන් ලැබුණු කුරුසිය
- පෘතුගීසී යුගය
    - ක්‍රි.ව. 1505 දී පෘතුගීසීන් ලංකාවට පැමිණීම
    - ක්‍රි.ව. 1543 දී හත්වන බුවනෙක බාහු රජතුමාගේ ආරාධනයෙන් ෆ්‍රැන්සිස්කාන ධර්මදූතවරු ලංකාවට පැමිණීම
    - ක්‍රි.ව. 1602 දී ජේසු නිකායික ධර්මදූතවරු ලංකාවට පැමිණීම
    - ක්‍රි.ව. 1605 දී දොමිනිකාන නිකායික ධර්මදූතවරු ලංකාවට පැමිණීම
    - ක්‍රි.ව. 1606 දී අගුස්තීනු නිකායික ධර්මදූතවරු ලංකාවට පැමිණීම
    - ඉහත ධර්මදූත කණ්ඩායම්වල සේවය කෙටියෙන්
- ලන්දේසි යුගය
    - ලන්දේසි යුගයේ දී කතෝලිකයන්ට පීඩා කිරීම
    - භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමා - එතුමාගේ සේවය කෙටියෙන්
    - ගෞරවනීය ජාකොමෙ ගොන්සාල්වේස් පියතුමා - එතුමාගේ සේවය කෙටියෙන්
- බ්‍රිතාන්‍ය යුගය
    - කතෝලිකයන්ට ආගමික නිදහස ලැබීම
    - විවිධ පැවිදි නිකායන්ගේ පැමිණීම හා ඔවුන්ගේ සේවය
- නිදහස් යුගය - කෙටියෙන් විස්තර කරන්න
- ශ්‍රී ලංකාවේ රදගුරු පදවි හා රදගුරුතුමන්ලා

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම් :**

- ශ්‍රී ලංකාවේ ශුද්ධ වූ සභා ඉතිහාසය පිළිබඳ ලියැවුණු පත-පොත
- භාග්‍යවන්ත ජුසේ වාස් හා ගෞරවනීය වූ ජාකොමේ ගොන්සාල්වේස් යන පියතුමන්ලාගේ පින්තූර
- රදගුරු පදවි දක්වෙන ලංකා සිතියමක්
- ශ්‍රී ලංකාවේ රදගුරු පදවි හා රදගුරුවරුන්ගේ නම් දක්වෙන ලිත
- බ්‍රිසිල් බෝඩ්, ඩිමයි කොළ හා මාකර් පෑන්
- ඇමුණුම 1, 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න.
- ඔබේ පෙළපොතේ 11 වන පාඩමෙන් ඔබේ කණ්ඩායමට අයිති කොටස, කණ්ඩායමේ සියලු දෙනාට ඇසෙන පරිදි, එක් එක්කෙනා අවස්ථාව ගනිමින්, මාරුවෙන් මාරුවට, ශබ්ද නගා කියවන්න. සෙසු අය එයට හොඳින් සවන් දෙන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයන් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඒ ඇසුරෙන් ඔබේ කණ්ඩායමට ලැබී ඇති මාතෘකා පිළිබඳ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

| | |
|---|---|
| **කණ්ඩායම්අංක 1** | පෘතුගීසීන් පැමිණීමට පෙර යුගය |
| **කණ්ඩායම් අංක 2** | පෘතුගීසී යුගය |
| **කණ්ඩායම් අංක 3** | භාග්‍යවන්ත ජුසේවාස් පියතුමා |
| **කණ්ඩායම් අංක 4** | ගෞරවනීය ගොන්සාල්වේස් පියතුමා |
| **කණ්ඩායම් අංක 5** | බ්‍රිතාන්‍ය යුගය හා නිදහස් යුගය |

## ඇමුණුම 2
## ජුසේ වාස් පිය ගීතය

වන්දනීය වූ පූජනීය වූ
ජුසේ වාස් ධම්ම දූත පුදුදුරාණනේ
ධීර වීර වූ ඔබේ
දහම් සේවයේ අනුහසින්
මෙ ලක්බිම අපේ එළිය වේ

විපත් වළේ වැටී පෙළි සිටියවුන් සොයා
එදා ගියේ ඔබයි පියේ නොබා රෑ දිවා
දහම් සිසිල පොවා ඔවුන් පවස නිවා
නවෝදයක් උදා කළේ මහා පිනක් ලබා//

කැලෑ මැදින් දෙපා වැරෙන් ගියේ දුර ගමන්
දුගී වෙසින් සැදී ගතින් දරා දැඩි ගිමන්
කුසට අහර පවා නැතිවැ දවස ගෙවා
එදා දෙසූ දහම් අමා රසේ බසී ගලා//

මිනිස් සිතුම් පැතුම් ලොව් සැපට නැඹුරු වී
මිලේ නිලේ බලේ කෙරේ සිටින වහල් වී
දනන් කෙලෙස් නසා දෙලෝ සැපත් දිනා
දෙවන් වරම් කිතුන් දහම් රකින්න පෙම් පුදා//

**ගෙදර පරිසරයෙන්** :

ගෞරවනීය ජාකොමේ ගොන්සාල්වේස් පියතුමන්ගේ නිර්මාණ ඇතුළත් ගී තැටි (CD) සොයා ගෙන නිවසේ දී ශ්‍රවණය කරන්න.

## 12 වන පාඩම

## සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී, පූර්ණ කිතුනු ජීවිතයකට සාක්ෂි දරයි..

**නිපුණතා මට්ටම** 10.3.1 : ක්‍රිස්තු ජීවයෙන් පෝෂණය වීම සඳහා නිතර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේව ලබා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- දිව්‍ය සත්ප්‍රසාදයීය ලක්ෂණ විස්තර කරයි.
- දිව්‍ය සත්ප්‍රසාදය තුළ ක්‍රිස්තුස් වහන්සේ ජීවමාන ව වැඩ සිටින බව පිළිගනියි.
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ ගොනු කර ගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දිව්‍ය පූජාවට උනන්දුවෙන් සහභාගි වෙයි.
- දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමාන ව වැඩ සිටින ක්‍රිස්තුස් වහන්සේට තම මිතුරන් හා එක් ව යාච්ඤා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්යයන් අඩංගු DVD පටය ප්‍රදර්ශනය කරන්න. (ලන්චියානෝ නුවර ප්‍රාතිහාර්ය අඩංගු කොටස)
- එසේ කිරීමට නොහැකි අවස්ථාවල 2 ඇමුණුමෙහි ඇති ලන්චියානෝ නුවර ප්‍රාතිහාර්ය කතන්දරයක් ආකාරයෙන් කියන්න.

ඒ ඇසුරෙන්, පහත දැක්වෙන කරුණු ඉස්මතු වන සේ, සාකච්ඡාව මෙහෙයවන්න.

- ලන්චියානෝ නුවර ප්‍රාතිහාර්ය
- එම ප්‍රාතිහාර්ය තුළින් කියැවෙන දේ
- තවත් සිසුන් දන්නා එවැනි ප්‍රාතිහාර්යයන් පිළිබඳ ව

(මිනිත්තු 20)

**පියවර 2**

- සිසුන් කණ්ඩායම් 3කට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ඇමුණුම 1 හා 2 බැගින් ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය විටෙක ගුරු මග පෙන්වීම ලබා දෙන්න

(මිනිත්තු 60)

පියවර 3

- එක් එක් කණ්ඩායමට ලැබී ඇති ක්‍රියාකාරකමේ අවසාන නිමැවුම පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- පළමු ව, විස්තාරණය සඳහා ඉදිරිපත් කිරීම කළ කණ්ඩායමේ සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- දිව්‍ය සත්ප්‍රසාදයීය ලක්ෂණ
- දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම්
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම
- දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්යයන් අඩංගු DVD පටය
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව කියවන්න
- ඒවා තුළින් මතුවන කරුණු පිළිබඳව කණ්ඩායමේ අනෙක් අය හා සාකච්ඡා කරන්න
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති නිර්මාණය පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න
  - **කණ්ඩායම් අංක 01** - දිව්‍ය සත්ප්‍රසාදයීය ලක්ෂණ ඇතුළත් කර විරිඳුවක් තනන්න.
  - **කණ්ඩායම් අංක 02** - දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම් ඇතුළත් කර පෝස්ටරයක් නිර්මාණය කරන්න
  - **කණ්ඩායම් අංක 03** - දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සළකුණු ඇතුළත් බිත්ති පුවත්පතක් නිර්මාණය කරන්න

## ඇමුණුම 2

### ගවේෂණ පත්‍රිකාව

- දිව්‍ය සත්ප්‍රසාදයීය ලක්ෂණ
  1. දේව ප්‍රසාද නිධානයක්
  2. භෝජනයක් (ජුවාම් 6/53-56)
  3. යාගයක් (ලූක් 22/19-20)
  4. ගිවිසුමක්
     (ජෙරමියා 31/31-34, නික්මයාම 24/4-8, හේබ්‍රෙව් 9/14-22 හා 1 කොරින්ති 11/25)
  5. ස්තුති කිරීමක්(ලූක් 22/17, 22/19)
  6. පරිශ්‍රමණයක් (අත් දකීමට ඇතලුවීම) (ලූක් 22/19, 1 කොරින්ති 11/24)
- දිව්‍ය පූජාව සඳහා නව ගිවිසුමේ සඳහන් නම්
  1. පූප කැඩීම (ලූක් 24/35, ක්‍රියා 2/42)
  2. ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය (1 කොරින්ති 11/20)
  3. නව පාස්කු මංගල්‍යය (1 කොරින්ති 5/8)
  4. ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ සහභාගිකම (1 කොරින්ති 10/16)
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සළකුණු
  1. මෙල්කිසදෙක්ගේ යාගය (උත්පත්ති 14/18-20)
  2. මන්නා භෝජනය (නික්මයාම 16 )
  3. නුමුහුන් පූප අනුභවය හා කුසලානයෙන් පානය කිරීම (නික්මයාම 12/15-20)
  4. පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්ය (ලූක් 9/12-14)
  5. ජීවනදායක භෝජනය පිළිබඳ ඉගැන්වීම් (ජුවාම් 6/26-27,35)

### ලන්චියානෝ නුවර ප්‍රාතිහාර්යය

ක්‍රි.ව. 800 දී පමණ ඉතාලියේ ලන්චියානෝ නුවර ශුද්ධ වූ ලෙගොන්ෂියන් මුනිතුමාට කැප කරන ලද කුඩා දෙව්මැදුරේ සේවය කළ එක්තරා තාපස පියතුමෙක් දිව්‍ය පූජාව පවත්වන විට, පූප හා මිදි යුෂ ජේසුස් වහන්සේගේ ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරයට හැරෙන්නේදැයි සැක කළේ ය. දිනක් එතුමා දිව්‍ය පූජාවේ දිව රහස් කරන මොහොතේ පූපය මස් කැබැල්ලක් බවටත්, මිදි යුෂ රුධිරය බවටත් පත්වන බව දිටී ය. එම මස් කැබැල්ල හා රුධිරය ලන්චියානෝ නුවර විශේෂ දිව්‍ය සත්ප්‍රසාද කරඬුවක තැම්පත් කර ඇත.

1574 දී මෙම මස් කැබැල්ල හා රුධිරය පිළිබඳ ව විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කරන ලදී. එම විද්‍යාත්මක පර්යේෂණයේ දී කැටි ගැසී තිබූ විවිධ හැඩයෙන් හා විවිධ ප්‍රමාණයෙන් යුත් අසමාන රුධිර කොටස් 5හි බර කිරන ලදී. එහි දී අනාවරණය වූයේ, සෑම අසමාන කොටසක ම බර සමාන වනවා පමණක් නොව, එක් එක් කොටසෙහි බර, සියලු කොටස් එකට ගෙන බර කිරන විට ලැබෙන බරට ද සමාන වන බවයි.

1970 දී මෙම මස් කැබැල්ල පිළිබඳ ව තවත් විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කරන ලදී. මෙම පර්යේෂණයේ දී පහත සඳහන් කරුණු අනාවරණය විය.

- මෙම මස් කැබැල්ල හා රුධිරය සැබැවින් ම මනුෂ්‍යයෙකුගේ වේ.
- එම මස් කැබැල්ල මිනිස් හදවතකින් ගත් එකකි.
- මෙම මස් කැබැල්ලෙත්, රුධිරයෙත් ඇත්තේ එකම රුධිර වර්ගයකි. එනම් AB පොසිටිව් වේ.
- මෙම රුධිරයේ දැන් ශරීරයකින් ලබා ගත් රුධිරයක මෙන්, ප්‍රෝටීන් හා ඛනිජ වර්ග ඇත. (ශරීරයෙන් ඉවත් කළ රුධිරයේ ප්‍රෝටීන් හා ඛනිජ වර්ග පවතින්නේ විනාඩි 20-30 ක් පමණක් වන නමුත්, මෙවැනි දෑ මෙම රුධිරයෙන් ඉවත් නොවී, දිගින් දිගට ම පැවතෙයි.)
- මෙම මස් කැබැල්ලට හා රුධිරයට කිසි ම කල් තබා ගැනීමේ ද්‍රව්‍යයක් යොදා නොමැත.
- පාරිසරික හා භෞතික සාධකවලට මෙම මස් කැබැල්ල හා රුධිරය ශතවර්ෂ 12කට අධික කාලයක් නිරාවරණව පැවතුණ ද, මෙම මස් කැබැල්ල හා රුධිරය නරක් වී නොමැත.

1978 වර්ෂයේ දී නාසා ආයතනය ටියුරින් නුවර ශ්‍රී සළුව පිළිබඳ ව පර්යේෂණයක් සිදු කළේ ය. එහි දී අනාවරණය වූයේ ශ්‍රී සළුවේ තැම්පත්ව ඇති ලේ වර්ගය AB පොසිටිව් බව ය. ටියුරින් නුවර සළුවේත් මස් කැබැල්ලේත් එක ම ලේ වර්ගයක් තිබීම වැදගත් අනාවරණයක් විය.

**ගෙදර පරිසරයෙන් :**

පවුලක් ලෙස ඉරුදින දිව්‍ය පූජාවට නොකඩවා සහභාගි වන්න.

## 13 වන පාඩම

## දසපණත

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධ වී, පූර්ණ කිතුනු ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 10.3.2: ස්වාමීන් වහන්සේගේ සේවකත්වයේ භෝජනයට පංගුකාරවෙමින්, ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- පුරාණ ගිවිසුමේ පාස්කු භෝජනය පිළිබඳ ව විස්තර කරයි.
- නිසි සූදානමකින් යුතු ව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ව ලබා ගත යුතු බව පිළිගනියි.
- අන්තිම රාත්‍රී භෝජනය අවස්ථාව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- බැහැපත් නායකයෙකු ලෙස, පන්තිය තුළ ක්‍රියා කරයි.
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ආත්මික ව හා ශාරීරික ව සූදනම් වීමට මිතුරන්ට උදව් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- පෙර පුහුණු කළ සිසුන් කණ්ඩායමක් මගින් අන්තිම රාත්‍රි භෝජන අවස්ථාව රඟ දක්වන්න.

ඒ ඇසුරෙන් පහත දැක්වෙන කරුණු ඉස්මතු වන සේ, සාකච්ඡාව මෙහෙයවන්න.

- අන්තිම රාත්‍රි භෝජනය හා පාද දෝවනය
- සහභාගි වූ අය
- පැවැත් වූ දිනය
- භෝජන සංග්‍රහය පැවැත් වූ ස්ථානය
- එහි දී සිදු කළ දේවල්
- අන්තිම රාත්‍රි භෝජන අවස්ථාවේ ස්ථාපිත කළ සක්‍රමේන්තු දෙක

(මිනිත්තු 15)

**පියවර 2**

- සිසුන් කණ්ඩායම් 4කට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ඇමුණුම 1 බැගින් ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය විටෙක ගුරු මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 35)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය ) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- පුරාණ ගිවිසුමේ පාස්කු භෝජනය
- අන්තිම රාත්‍රි භෝජනය හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ආත්මික හා ශාරීරික සුදානම
- පාද දෝවනය හා ප්‍රේමයේ පණත

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය
  (නික්මයාම 12/1-14, ජොහාන් 13/1-20, 34, ලූක් 22/19-20, 1 කොරින්ති 11/23-30)
- ඇමුණුම 1

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- පහත සඳහන් බයිබල් පාඨ කියවන්න
  - නික්මයාම 12/1-14
  - ජොහාන් 13/1-20, 34
  - ලූක් 22/19-20
  - 1 කොරින්ති 11/23-26, 11/27-30

- ඒවා තුළින් මතු වන කරුණු පිළිබඳ ව කණ්ඩායමේ අනෙක් අය හා සාකච්ඡා කරන්න
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති නිර්මාණය පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

- **කණ්ඩායම් අංක 01** - පුරාණ ගිවිසුමේ පාස්කු භෝජනය සිදුකළ ආකාරය රඟ දක්වන්න.
- **කණ්ඩායම් අංක 02** - අන්තිම රාත්‍රි භෝජනය අවස්ථාව පෙන්වන සිද්ධි සිතියමක් (තොරණක ආකාරයක්) නිර්මාණය කරන්න.
- **කණ්ඩායම් අංක 03** - දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමට සූදානම් විය යුතු ආකාරය දෙබසකින් ඉදිරිපත් කරන්න.
- **කණ්ඩායම් අංක 04** - ප්‍රේමයේ පණිත ජීවත් වන ආකාරය භූමිකා රංගනයකින් ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්** :

වසරකට වරක් වත් පවුලේ සියලු දෙනා සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලැබීමට යොමු කරන්න .

## 14 වන පාඩම

## කල්වාරි යාගය

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුන් වහන්සේට සම්බන්ධ වී, පූර්ණ කිතුනු ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 10.3.3: එදිනෙදා ජීවිතය තුළ අන් අය වෙනුවෙන් යාග වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- පුරාණ ගිවිසුමේ විවිධ යාග වර්ග විස්තර කරයි.
- එදිනෙදා ජීවිතයේ දී යාග විය යුතු බව පිළිගනියි.
- පුරාණ ගිවිසුමේ යාග හා කල්වාරි යාගය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි
- පාපයක් කළ විට තම වරද වටහා ගෙන පාප පූජාවක් ලෙස පාපොච්චාරණය කරයි
- අන් අයගේ වේදනාවේ දී සංවේදී වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පියවර 1

- ගුණාත්මක යෙදවුමේ දක්වා ඇති පින්තූරය පෙන්වන්න.
- ඇමුණුම 3 හි ඇති ගීතිකාව, සිසුන් හා එක් ව ගායනා කරන්න.

ඒ ඇසුරෙන්, පහත දැක්වෙන කරුණු ඉස්මතු වන සේ, සාකච්ඡාව මෙහෙයවන්න.

- පින්තූරයෙන් පිළිඹිබු වන කරුණු
- ගීතිකාවෙන් කියැවෙන අදහස්

(මිනිත්තු 15)

පියවර 2

- සිසුන් කණ්ඩායම් 3කට බෙදන්න.
- සෑම කණ්ඩායමකට ම ශුද්ධ බයිබලය හා ඇමුණුම 1 හා 2 බැගින් ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය විටෙක ගුරු මග පෙන්වීම් ලබා දෙන්න

(මිනිත්තු 35)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින් පාඩම සාරාංශ කරන්න.

- පුරාණ ගිවිසුමේ විවිධ යාග හා යාගවල පරමාර්ථ
- යාග වර්ග
  - දවන පූජා
  - නොදවන පූජා
- දවන යාග පූජා කොටස් 4
  1. සම්පූර්ණයෙන් දවන
  2. සහභාගිකමේ පූජා
  3. පාප පූජා
  4. වන්දි ගෙවීමේ පූජා
- දවන පූජාවට භාවිතා කළ සතුන්
  - ගවයන්
  - බැටලුවන් හා එළුවන්
  - කුරුල්ලන්
- කල්වාරි යාගය

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය (ලෙවි 1/3-17)
- කුරුසියේ ඇණ ගැසූ ක්‍රිස්තුන් වහන්සේගේ පින්තූරයක්
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ගවේෂණ පත්‍රිකාව හොඳින් කියවන්න.
- ඒවා තුළින් මතුවන කරුණු පිළිබඳ ව කණ්ඩායමේ අනෙක් අය හා සාකච්ඡා කරන්න.
- පහත සඳහන් පැවරුමේ නිරත වී ඔබේ නිර්මාණය පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.
  - **කණ්ඩායම් අංක 01** - පුරාණ ගිවිසුමේ යාගවල පරමාර්ථ හා යාග වර්ග ඇතුළත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
  - **කණ්ඩායම් අංක 02** - දවන යාග සඳහා භාවිත කළ සතුන් රූප සටහනකින් පෙන්වන්න.
  - **කණ්ඩායම් අංක 03** - පුරාණ ගිවිසුමේ යාග හා කල්වාරි යාගයේ සමාන අසමානකම් වගුගත කරන්න.

## ඇමුණුම 2

### ගවේෂණ පත්‍රිකාව

### පුරාණ ගිවිසුමේ විවිධ යාග

පුරාණ ඉශ්‍රායෙලයේ වන්දනාවේ කේන්ද්‍රීය ක්‍රියාවලිය යාග පූජා පුද කිරීමයි. යාග පූජා සඳහා සතුන් හා ආහාර-පාන යොදා ගත්ත ද ඉන් වඩාත් වැදගත් වූයේ, සත්ව පූජාවයි. එයට හේතුව, සත්වයාගේ රුධිරය තුළ ජීවිතය අන්තර්ගත වීම නිසා ය. ජීවිතය අයත් වන්නේ, දෙවියන් වහන්සේටය. යාග පුදන්නා සතාගේ අයිතිකරු විය යුතු ය. යාග සඳහා භාවිතා වූයේ, හීලෑ, කැළැල් රහිත, දින අටකට වඩා බාල නොවන පිරිමි සතුන් ය.

- යාග ප්‍රධාන කොටස් 2කට බෙදිය හැකි ය.
  1. දවන යාග පූජා
  2. නොදවන යාග පූජා
- දවන යාග පූජා කොටස් 4කි.

1. සම්පූර්ණයෙන් දවන පූජා

යාග දැවීමේ දී සුම්හිරි දුම ඉහළට ගමන් කරයි. එමගින් යාගය පුදන්නාගේ යැදුම් දෙවියන් වහන්සේ වෙත ගමන් කිරීම අදහස් වේ. මෙය දෙවියන් වහන්සේගේ ගෞරවය සඳහා කළ හැකි උතුම් ම පූජාවයි.

ඉශ්‍රායෙල්වරු දවන පූජා ඔප්පු කළ අවස්ථා :

- උදේ හා සවස දේව මාළිගයේ දී
- දරු ප්‍රසූතියෙන් පසු ස්ත්‍රියක් පවිත්‍ර කිරීමට
- ලාදුරු රෝගයෙන් සුවය ලැබූ පසු
- පූජකයන් හා නසරීයයන් කැප කිරීමේ දී

2. සහභාගිකමේ පූජා (සාම පූජා)

මෙයින් අදහස් කළේ, දෙවියන් වහන්සේ හා යහපත් සබඳතාවයි. ඒවායින් දැනට පවතින සුහදතාව පිළිඹිබු කළා පමණක් නොව, එය වඩාත් ගැඹුරු කරන ලදී. මෙම පූජාවල දී පඬුරෙන් කොටසක් දෙවියන් වහන්සේට ද, කොටසක් පූජකයාට ද, කොටසක් පඬුර රැගෙන ආ තැනැත්තාට ද, ලැබෙන්නට සලස්වන ලදී. පූජකයාගේ හා රැගෙන ආ තැනැත්තාගේ කොටස්, දේව මාලිගයේ ශුද්ධස්ථානය තුළ, සහභාගි වූ අන් අය හා බෙදා ගෙන අනුභව කරති. පූජාවේ භෝජනය හැඳින්වූයේ, ''දෙවි සමිඳාණන් ඉදිරියේ කමින් බොමින් ප්‍රීති ප්‍රමෝද වීම'' යනුවෙනි. සහභාගිකමේ පූජා ප්‍රීතිදායක වාතාවරණයක සිදු විය.

3. පාප පූජා

පාප පූජා දෙවර්ගයකි.

I. පිරිසිදුවීමේ පූජා

අපවිත්‍ර ව සිටි කෙනෙකු පිරිසිදු වීම සඳහා සිදු කරන ලද පූජාව, මේ නමින් හැඳින්වේ.

උදාහරණ:

දරු ප්‍රසූතියකින් පසු

බෝවන චර්ම රෝගයකින් පසු

II .පාප පූජා

මෙම පූජා මගින් පාපවලින් නිදහස් කිරීමක් හෝ පිරිසිදු කිරීමක් සිදු වේ.

4. වන්දි ගෙවීමේ පූජා

මෙම පූජා ඔප්පු කරන ලද්දේ, සිතාමතා නොකරන ලද දේව දූෂණයෙන් පසු හෝ නොදැනුවත්කමින් දෙවියන් වහන්සේට හෝ යම්තාක් දුරට අවබෝධයෙන් සහෝදරයාට විරුද්ධ ව සිදු කරන ලද පාප වෙනුවෙනි.

- දවන යාග පූජාවට භාවිතා කළ සතුන්
  1. ගවයන් (ලෙවී 1/3-9)
  2. බැටළුවන් හා එළුවන් (ලෙවී 1/10-13)
  3. කුරුල්ලන් (ලෙවී 1/14-17)
- නොදවන යාග පූජා සඳහා
  1. පිටි
  2. ධාන්‍ය
  3. මිදියුෂ
  4. තෙල් වර්ග
  5. පූප

  භාවිත විණි.

මෙම යාග ඔප්පු කරන්නේ, බොහෝ විට දෙවියන් වහන්සේට තුති පිදීම සඳහා ය.

**ඇමුණුම 3**

**කුරුසේ නැග අත් විහිදා**

කුරුසේ නැග අත් විහිදා
මුළු ලෝ තුරුළට වඩලා
සිටිනා දෙව් පුත් රඳුනේ
ඔබෙ පා සිඹිමින් වඳිමු

සිරසේ කිරුළේ මිණි සේ
බැබළේ බිඳුවැල් සිරි ලේ
කුරුසේ සිටිනා දෙවිඳේ
ඔබෙ පා සිඹිමින් වඳිමු

ඔබ හා කුරුසේ නැගලා
ඔබෙ දෑසින් ලොව බල ලා
ඔබසේ කරුණා පාලා
ඔබෙ පා සිඹිමින් වඳිමු

හිඳිනා ලෙස මා කැඳවා
කල්වාරිය මත නංවා
ඔබ හා මා හා සිටිමු
කුරුසේ හිඳිනා සමිඳේ

**ගෙදර පරිසරයෙන්** :

පවුලේ අන් අයගේ කාර්යයන් සඳහා සහය වන්න.

## 15 වන පාඩම

## පරිත්‍යාගශීලී ජීවිතාදර්ශයන්

**නිපුණතාව** 3.0 : දේව ප්‍රසාද නිධාන මගින් ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධ වී, පූර්ණ කිතුනු ජීවිතයකට සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** 10.3.4: පරිත්‍යාගිශීලී ආදර්ශවත් ජීවිත චරිතායනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- නම් කර ඇති පුද්ගලයින්ගේ ජීවිත කතා පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් සකසයි.
- තම දෙමව්පියන් ද පරිත්‍යාගිශීලී ජීවිතයක් ගත කරන බව පිළිගනියි
- සකස් කරන ලද වාර්තාව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි
- අන් අයගේ අභිවෘද්ධිය සඳහා පරිත්‍යාගිශීලී ව කටයුතු කරයි.
- සැමට ප්‍රේම කරයි

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර** 1

- ඇමුණුම 2හි සඳහන් සිද්ධිය ගුරුවරයා මතකයෙන් කියන විට, සිසුන් එයට සාවධාන ව සවන් දෙයි.

ඒ ඇසුරින්, පහත දක්වෙන කරුණු ඉස්මතු වන සේ, සාකච්ඡාව මෙහෙය වන්න.

- එම සිද්ධිය තුළ සිදු වූ දෑ
- මිතුරන් වෙනුවෙන් තම ජීවිතය පුද කළ පූජා උදව් වන සමිතියේ සිසුවා පිළිබඳ ව
- තවත් සිසුන් අසා ඇති එවැනි සිද්ධීන් පිළිබඳ ව

(මිනිත්තු 15)

**පියවර** 2

- සිසුන් කණ්ඩායම් 4 කට බෙදන්න.
- සැම සිසුවෙකුටම ඇමුණුම 1 ලබා දෙන්න.
- පහත නම් සඳහන් අයගේ ජීවිත කතාව බැගින් සැම කණ්ඩායමකට ම ලබා දෙන්න.
    - භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා
    - භාග්‍යවන්ත තෙරේසා මව්තුමිය
    - ශුද්ධ වූ මැක්ෂිමිලියම් කෝල්බේ මුනිතුමා
    - ගරු මයිකල් රුද්‍රිගු පියතුමා
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

(මිනිත්තු 35)

පියවර 3

- කණ්ඩායම් නිර්මාණ ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් නිර්මාණ පිළිබඳ ව අනෙකුත් කණ්ඩායම්වලට සංවර්ධනාත්මක යෝජනා හා අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න

පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සමාලෝචනයේ යෙදෙමින්, හුණු පුවරුවේ පාඩම සාරාංශ කරන්න.

- භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා
  - උපත
  - කළ සේවය
  - ජීවිතයේ වැදගත් සිදුවීම්
  - අපට උගත හැකි පාඩම්
- භාග්‍යවන්ත තෙරේසා මව්තුමිය
  - උපත
  - කළ සේවය
  - ජීවිතයේ වැදගත් සිදුවීම්
  - අපට උගත හැකි පාඩම්
- ශුද්ධ වූ මැක්ෂිමිලියම් කෝල්බේ මුණිතුමා
  - උපත
  - කළ සේවය
  - ජීවිතයේ වැදගත් සිදුවීම්
  - අපට උගත හැකි පාඩම්
- ගරු මයිකල් රුද්‍රිගු පියතුමා
  - උපත
  - කළ සේවය
  - ජීවිතයේ වැදගත් සිදුවීම්
  - අපට උගත හැකි පාඩම්
- අපගේ දෙමව්පියන් අප වෙනුවෙන් කරන පරිත්‍යාගයන්
- අපට ද එවැනි පරිත්‍යාගශීලී ජීවිත ගත කළ හැකි බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන්ගේ ජීවිත කතාව
- භාග්‍යවන්ත තෙරේසා මව්තුමියගේ ජීවිත කතාව
- ශුද්ධ වූ මැක්සිමිලියන් කොල්බේ මුනිතුමන්ගේ ජීවිත කතාව
- ගරු මයිකල් රුද්‍රිගු පියතුමන්ගේ ජීවිත කතාව
- ඇමුණුම 1, 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබට ලැබී ඇති කතාව කියවන්න
- පහත සඳහන් ශීර්ෂ යටතේ වාර්තාවක් සකස් කරන්න.
  - උපත
  - කළ සේවය
  - ජීවිතයේ වැදගත් සිදුවීම්
  - අපට උගත හැකි පාඩම්
    - **1 වන කණ්ඩායම**
      - භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා
    - **2 වන කණ්ඩායම**
      - භාග්‍යවන්ත තෙරේසා මව්තුමිය
    - **3 වන කණ්ඩායම**
      - ශුද්ධ වූ මැක්ෂිමිලියම් කෝල්බේ මුණිතුමා
    - **4 වන කණ්ඩායම**
      - ගරු මයිකල් රුද්‍රිගු පියතුමා
- සකස් කළ වාර්තාව පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ඇමුණුම 2**
**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

**පරිත්‍යාගශීලී ජීවිතයක් පිළිබඳ සිද්ධියක්**

දිනක් එක්තරා පාසලක 9 ශ්‍රේණියේ සිසුන් පිරිසක් ගුරුවරුන් හා එක් ව තම පාසලේ උත්සවයක් අවසන් කර, නිවෙස්වලට යාමට පිටත් වූහ. නමුත් මෙම සිසුන්ගෙන් තිදෙනෙක් තම මිතුරෙකුගේ නිවසට ගියහ. එහි ගිය ඔවුන්, දිය නෑමට අසල වූ ඇලකට ගියහ. ඔවුන් හා එක් ව දේවස්ථානයක පූජා උදව් වන සමිතියේ සිසුවෙක් ද සිටියේ ය. මෙම සිසුවා පිහිනීමට දක්ෂයෙකු වූ අතර, දිය නෑමට නොගියේ ය. ඔහු අසල වූ ගලකට නැගී තම මිතුරන් දෙස බලා සිටියේ ය. තම මිතුරන් තිදෙනා දියේ ගිලෙනු දුටු ඔහු, එකවර ම දියට පැන ඔවුන් බේරා ගැනීමට තැත් කළේ ය. තම එක් මිතුරෙකුගේ කෙස් වැටියෙන් අල්ලා ඔහු ව ගොඩට ගෙනැවිත් තැබීය. ඉන්පසු නැවත තම අනෙක් මිතුරන් දෙදෙනා ව බේරා ගැනීමට ගිය ඔහු ව, එම මිතුරන් දෙදෙනා මරණ බියෙන් වැළඳ ගත් හෙයින්, ඔහු ද දිය රකුසාට බිළි වී තම මිතුරන් වෙනුවෙන් දිවි පිදුවේ ය.

(සත්‍ය සිදුවීමකි)

**ගෙදර පරිසරයෙන්** :

ශුද්ධවන්ත ජීවිත කථා පිළිබඳ ග්‍රන්ථ කියවීමට ද, DVD පට නැරඹීමට ද යොමු කරන්න.

## 16 වන පාඩම

## සහෝදර ප්‍රේමය

**නිපුණතාව 4.0** : දේව පණත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 10.4.1**: මුළු හෘදයෙන් ද, මුළු ආත්මයෙන් ද, මුළු වීර්යයයෙන් ද, මුළු බුද්ධියෙන් ද දෙවියන් වහන්සේට ප්‍රේම කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- දේව ප්‍රේමය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දේව නාමය ගෞරවයෙන් භාවිත කළ යුතු බව පිළිගනියි.
- දේව ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දක්වන ආකාරය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි
- මුළු හෘදයෙන් ද, මුළු ආත්මයෙන් ද, මුළු වීර්යයයෙන් ද, මුළු බුද්ධියෙන් ද දෙවියන් වහන්සේට ප්‍රේම කරයි.
- කොන් වූ අය දේව ප්‍රේමයෙන් පුරවාලීමට පියවර ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

පියවර 1

ඇමුණුම 2 ක්‍රියාත්මක කර, ෆ්‍රැන්සිස් හා මිලින්ද අතර වෙනස සාකච්ඡා කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡාවක් කරන්න.

- දෙවියන් වහන්සේගේ ප්‍රේමය අසීමිත බව
- ප්‍රේමයේ උල්පත දෙවියන් වහන්සේ බව
- දේව ප්‍රේමය සදාතනික බව
- දේව ප්‍රේමයට කොන්දේසි නොමැති බව
- දේව ප්‍රේමය නිසා, මිනිසා උතුම් තත්ත්වයෙන් මවා ඇති බව
- ක්‍රිස්තුන් වහන්සේ ව ද මෙලොවට එවන ලද්දේ දේව ප්‍රේමය නිසා බව
- මිනිස් අවශ්‍යතා සියල්ල දෙවියන් වහන්සේ ප්‍රේමයෙන් සපුරාලන බව
- කිතුනු ජීවිතයේ පදනම දේව ප්‍රේමය මත රඳා පවතින බව
- මිනිසා දේව ප්‍රේමයෙහි සදාකාලික ව පැවතිය යුතු බව

(මිනිත්තු 20)

පියවර 2

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා 3 ඇසුරින් සකස් කරන ලද ගවේෂණ පත්‍රිකාව බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කරවන්න
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දි භාවිතා කරන්න.

(මිනිත්තු 55)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- දේව ප්‍රේමය හා දේව ධර්මගුණ
    1. විශ්වාසය
    2. බලාපොරොත්තුව
    3. ප්‍රේමය
- දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම සඳහා කළ යුතු දේ
    1. වන්දනාව
    2. යාච්ඤාව
    3. යාගය
    4. පොරොන්දු හා බාරහාර
- දේව නාමය ගෞරවයෙන් භාවිතය හා කිතුනු නම් භාවිතයේ වැදගත්කම
- ඉරුදින දිව්‍ය පූජාවේ වැදගත්කම
- දෙවියන් වහන්සේ මට ප්‍රේම කළාක් මෙන්, මම ද ප්‍රේමයෙහි පැවතිය යුතු බව
- දේව ප්‍රේමයේ පැවතීමට නම් දේව පණත් ඉටු කළ යුතු බව
- එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය
- කතෝලික සභාවේ ධර්මෝපදේශය අංක 2087-2103 , 2150-2159, 2178-2179
- බ්‍රිසිල් බෝඩ්/ඩිමයි ,ප්ලැටිග්නම්
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කරගන්න. (පෙර ක්‍රියාකාරකමේ නායකත්වය නොගත් අයෙකුට අවස්ථාව ලබා දෙන්න)
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව කියවන්න
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයින් සමග සාකච්ඡා කරන්න
- නොතේරෙන කරුණු, තේරෙන අයගෙන් විමසා, දැනගන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කරගෙන, ප්‍රේමයේ පළමු පණත පිළිබඳ ව පහත සඳහන් කරුණුවලට අදාළ ව ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.
    - දේව ප්‍රේමය හා දේව ධර්ම ගුණ (විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය )
    - දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම සඳහා කළ යුතු දේ (වන්දනාව, යාච්ඤාව, යාගය, පොරොන්දු හා බාරහාර)
    - දේව නාමය ගරුත්වයෙන් භාවිතය හා කිතුනු නම් භාවිතයේ වැදගත්කම
    - ඉරුදින දිව්‍ය පූජාවේ වැදගත්කම

## ඇමුණුම 2
## නියුක්තිකරණය සඳහා දෙබසක්

(පෙර සූදානමකින් පසු මෙම දෙබස ඉදිරිපත් කිරීමට සිසුන් දෙදෙනෙකු සූදානම් කරන්න.)

| | | |
|---|---|---|
| මිලින්ද | : | ෆ්‍රැන්සිස්, වෙන වැඩක් නැද්ද, නිතර ම දිව්‍ය පූජාවට දුවන්නේ, හැමදාම ගෙදර යාච්ඤා කරනව ඇහෙන්නේ |
| ෆ්‍රැන්සිස් | : | අනේ මහත්තයා, අනික් වැඩ ඔක්කොම කරන්නේ ඒ බලයෙන් නේ |
| මිලින්ද | : | එහෙම කොහොම ද කියන්නේ? මාව බලන්නකෝ, මම හරියට ජීවත් වෙනවනේ. අනිත් අයට කරදරයක් නැතිව. පල්ලියට දුවන වෙලාවත්, මගේ වැඩට ම යොදනවා. |
| ෆ්‍රැන්සිස් | : | දේව ආදරය නැතිව මහත්තයා මට නම් මොකුත් හරියට කරන්න බැහැ. මම කොච්චර දුප්පත් වුනත් සතුටින් ඉන්නේ දෙවියන් වහන්සේ මා තුළ සිටින නිසයි. |
| මිලින්ද | : | එහෙනම් කියන්න බලන්න පාප් වහන්සේගේ නම මොකක්ද කියලා |
| ෆ්‍රැන්සිස් | : | අනේ, මම දන්නේ නැහැ මහත්තයා |
| මිලින්ද | : | අපේ රටේ රදගුරු පදවි කීය ද? |
| ෆ්‍රැන්සිස් | : | ඒකත් මම දන්නේ නැහැ, මහත්තයෝ |
| මිලින්ද | : | එහෙම නම්, කියන්න බලන්න, අපේ රදගුරුතුමාගේ නම මොකක් ද කියලා. |
| ෆ්‍රැන්සිස් | : | අනේ මහත්තයෝ, ඕවා මුකුත් මම දන්නේ නෑ |
| මිලින්ද | : | ආගම ගැන ඔයා මොනව ද දන්නේ. ඔයාව කතෝලිකයෙක් කියලා කියන්නේ කොහොම ද? |
| ෆ්‍රැන්සිස් | : | ඔය මොනවත් මම දන්නේ නැහැ. හැබැයි මම එකක් හොඳට ම දන්නවා. |

මිලින්ද : මොකක් ද ෆ්‍රැන්සිස් ඒ, මටත් වැඩිය ඔයා දන්න දේ?

ෆ්‍රැන්සිස් : මරණාසන්න ව හිටිය මගේ පුතා ව සනීප කළේ දේව තාත්තා. මට හැමදා ම කුලී වැඩක් හරි ලබලා දෙන්නේ දේව තාත්තා, අපේ බඩගින්න නිවන්නෙත් දේව තාත්තා, අපට සතුටින් සමගියෙන් ඉන්න වරම් දෙන්නෙත් දේව තාත්තා. මම හැම මොහොතෙ ම ඒ ආදරය අත්දකිනවා. මම දරුවන්ට කතෝලික නම් තියලා තියෙන්නෙත් ඒ නිසයි. ඒ නමෙත් ලොකු බලයක් තියෙනවා. මම හොඳට ම දන්න දේ. ඒ දේව ආදරයයි.

මිලින්ද : ෆ්‍රැන්සිස්, මම ඔයාගෙන් මම දන්නේ නැති ගොඩක් දේවල් දැනගත්තා. බොහොම ස්තුතියි. මට නැති සතුට සොයා ගන්නට කියල දුන්නට

**ඇමුණුම 3**
**ගවේෂණ පත්‍රිකාවක් සැදීම සඳහා උපදෙස්**

"කතෝලික සභා ධර්මෝපදේශය'' නමැති ග්‍රන්ථයේ අංක 2087-2103, 2150-2159, 2178 හා 2179 කියවා, එහි අඩංගු කරුණු සිසුවාට ගැළපෙන පරිදි සරල බසින් ලියා, ගවේෂණ පත්‍රිකාවක් සකස් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

- නිවසේ යාච්ඤා කරන ස්ථානය ගෞරවාන්විත ව පවත්වා ගන්න.
- ''මුළු හෘදයෙන් ද, මුළු ආත්මයෙන් ද, මුළු වීර්යයයෙන් ද, මුළු බුද්ධියෙන් ද දෙවියන් වහන්සේට ප්‍රේම කරමු.'' යන්න ලියන ලද පත්‍රිකාවක් සැමට පෙනෙන සේ එහි රඳවන්න.

## 17 වන පාඩම

## ප්‍රේමයේ සමාජයක්

**නිපුණතාව** 4.0 : දේව පණත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම** 10.4.2: එකිනෙකා කෙරෙහි අඛණ්ඩ වූත්, ගැඹුරු වූත්, සැලකිල්ලක් දක්වමින් ප්‍රේමයේ සමාජයක් ගොඩ නගයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- හතරවන පණතට අනුව එක් එක් පුද්ගලයන්ගේ වගකීම් හා යුතුකම් ගොනු කරයි.
- තම යුතුකම් නිසියාකාර ව ඉටු කළ යුතු බවට තර්ක කරයි.
- හතරවන පණතට අනුව ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි
- එකිනෙකා කෙරෙහි අඛණ්ඩ වූත්, ගැඹුරු වූත් සැලකිල්ලක් දක්වයි.
- නායකයා සේවකයා වී ක්‍රියා කිරීමට අන් අය ව ද යොමු කරවයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

ඇමුණුම 2 ක්‍රියාත්මක කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡාවක් කරන්න.

- දෙමව්පියන් දරුවන් වෙනුවෙන් කළ යුතු දේවල්
- දරුවන් දෙමව්පියන් වෙනුවෙන් කළ යුතු දේවල්
- හතරවන පණත නම් කිරීම

(මිනිත්තු 15)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා 3 ඇසුරින් සකස් කරන ලද ගවේෂණ පත්‍රිකාව බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මඟ පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දි භාවිත කරන්න.

(මිනිත්තු 35)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- ප්‍රේමයේ සමාජයක් ගොඩ නැගීම සඳහා අන් අය වෙනුවෙන් අඛණ්ඩ වූත්, ගැඹුරු වූත් සැලකිල්ලක් දැක්වීමේ වැදගත්කම

- දරුවන්ගේ වගකීම් හා යුතුකම්
- කිතුනු දෙමව්පියන්ගේ වගකීම් හා යුතුකම්
- රාජ්‍ය පාලකයින්ගේ වගකීම් හා යුතුකම්
- පුරවැසියන්ගේ වගකීම් හා යුතුකම්

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- කතෝලික සභාවේ ධර්මෝපදේශය අංක 2214-2231, 2235-2243
- නව කිතු බැති ගී අංක 134 හා එය අඩංගු CD පටය
- පෝස්ටරයක් (ලේ කිරි කරලා ගීතිකාව ලියන ලද)
- බ්‍රිසිල් බෝඩ්/ඩිමයි, ප්ලැටිග්නම්
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න. (පෙර ක්‍රියාකාරකමේ නායකත්වය නොගත් අයෙකුට අවස්ථාව ලබා දෙන්න)
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව හොඳින් කියවන්න
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයින් සමඟ සාකච්ඡා කරන්න
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැනගන්න.

ඔබේ කණ්ඩායම කියවා ගොනු කරගත් කරුණු පදනම් කරගෙන, දස පණතේ හතරවන පණත පිළිබඳ ව පහත සඳහන් කරුණුවලට අදාළ ව ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (රචනා, දැනුම මිනුම තරග, පෝස්ටර්, නාට්‍ය, විරිඳු, නිසදැස් යනාදි ක්‍රම භාවිත කළ හැකිය.)

- දරුවන්ගේ වගකීම් හා යුතුකම්
- දෙමව්පියන්ගේ වගකීම් හා යුතුකම්
- රාජ්‍ය පාලකයින්ගේ වගකීම් හා යුතුකම්
- පුරවැසියන්ගේ වගකීම් හා යුතුකම්

## ඇමුණුම 2
## නියුක්තිකරණය සඳහා ගීතිකාව

(පහත සඳහන් ගීතිකාව අඩංගු පෝස්ටරයක්, කැසට් පටයක් හෝ CD තැටියක් භාවිත කරමින්, නිවැරදි ව වචන උච්චාරණය කරමින්, නිවැරදි තාලයට අනුව ගීතිකාව සිසුන් සමඟ ගායනා කරන්න.)

ලේ කිරි කරලා මට පෙව් අම්මා
මා ලෙඩ වූ විට නිදිමරමින් ළඟ ඉන්නා
මගේ විපතෙ දී මා අත් නොහරිනා
අනේ සමිඳුනේ මගෙ අම්මා රැකදේවා//

ඩාදිය හෙළලා වෙහෙසක් නොබලා
මා වෙනුවෙන් ජීවිතය ම පුදන තාත්තා
මගේ සැප පතා සැප අත් හරිනා
අනේ සමිඳුනේ මාගේ තාත්තා රැක දේවා//

සුවපත් වේවා මව්පියෝ දෙදෙනා
ඔවුන් විඳින දුක හිරු දුටු පිණි මෙන් වේවා
විඳ නිම නොවෙනා සැපත ලබන්ටා
අනේ සමිඳුනේ මගේ මව්පියෝ රැකදේවා

## ඇමුණුම 3
## ගවේෂණ පත්‍රිකාවක් සැදීම සඳහා උපදෙස්

"කතෝලික සභා ධර්මෝපදේශ" නමැති ග්‍රන්ථයේ අංක 2114-2231 හා 2235-2243 කියවා, එහි අඩංගු කරුණු සිසුවාට ගැළපෙන පරිදි සරල බසින් ලියා, ගවේෂණ පත්‍රිකාවක් සකස් කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

දිනපතා උදෑසන 'ජේසු පිහිටයි' කියමින් දෙමාපියන්ට වැඳීමටත්, එවිට දෙමාපියන් දරුවන් ව සිප වැළඳ ගැනීමටත් යොමු වන්න.

## 18 වන පාඩම

## ශුද්ධ වූ සභාවේ පණත්

**නිපුණතාව 4.0** : දේව පණත් පිළිපදිමින් ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 10.4.3**: දේව ස්වරූපය හා සමානකම දරන මිනිස් ජීවිත සුරැකීමට කැපවෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- පස්වන පණතට අනුව ඉටු කළ යුතු හා පිටුදැකිය යුතු දෑ වගුගත කරයි.
- මිනිස් දිවිය දෙවියන් වහන්සේට පමණක් අයිති බව පිළිගනියි.
- පස්වන පණතට අනුව ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි
- මිනිස් දිවිය සුරකියි.
- අන් අයගේ ජීවිතවලට ගරු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

ඇමුණුම 2 ක්‍රියාත්මක කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.

- ගීතිකාවෙන් ලබන පණිවුඩය
- මැවිලි අතර උතුම් ම මැවිල්ල මිනිසා බව
- මිනිසා ව දේව ස්වරූපය ඇති ව මවා ඇති බව
- ඒ නිසා ම මානව සම්පත සුරකිය යුතු බව
- ''ජීවිතය විනාශ නොකරන්න'' යනුවෙන් පස්වන පණතින් ද නියම වී ඇති බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා 3 ඇසුරින් සකස් කරන ලද ගවේෂණ පත්‍රිකාව බැගින් සපයන්න.
- සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිතර කරවන්න
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දි භාවිතා කරන්න.

(මිනිත්තු 50)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම් සඳහා අවස්ථාව ලබා දෙන්න
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටුපෙරලන, කට්ට පුවරුව යනාදිය ) භාවිත කරමින් පාඩම සාරාංශ කරන්න.

- මිනිසාගේ උතුම්කම
  1. දේව ස්වරූපය හා සමානකම අනුව මවා තිබීම (උත්පත්ති 1/27-28)
  2. ජීවන හුස්ම ලැබීම (උත්පත්ති 2/7)
- ජීවිතයට ගරු කිරීමේ වැදගත්කම (ක.ස.ධ 2259-2262)
- තම ජීවිතය සුරැකීම සඳහා මත්ද්‍රව්‍ය, මත්පැන්, දුම්වැටි යනාදිය පිටුදැකිය යුතු ය. (ක.ස.ධ 2288-2291)
- පස්වන පණතට විරුද්ධව ක්‍රියා කරන අවස්ථා
  1. මිනිස් ඝාතන, වාර්ගික සමූල ඝාතන, ගබ්සාව, සියදිවි නසා ගැනීම, මානසික හා ශාරීරික වදහිංසා, සිරගත කිරීම, රටින් පිටුවහල් කිරීම, දරුවන් හා ස්ත්‍රීන් විකිණීම, ගණිකා වෘත්තිය, වහල්භාවය, ශ්‍රමය සූරාකෑම, චරිත ඝාතනය
- ගබ්සාව (ක.ස.ධ 2270-2275)
- සිය දිවි නසා ගැනීම (ක.ස.ධ 2280-2283)
- මිනිස් දිවිය දෙවිඳුන්ට අයිති බව
- සියල්ල විඳ දරා ගෙන දේව කැමැත්තට අවනත විය යුතු බව
- මානව සම්පත සුරැකීමට නම්, සැබෑ කිතුනුවෙකු ලෙස කැප වී ක්‍රියාකාරී විය යුතු බව (මිනිත්තු 50)

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය (උත්පත්ති 1/27-28, 2/7)
- කතෝලික සභාවේ ධර්මෝපදේශය
  අංක 2259-2262, 2270-2275, 2280-2283, 2288-2291
- කිතුනු ගී අංක 100 හා එම ගීතිකාව අඩංගු CD තැටිය
- පෝස්ටරයක් (ජීවිතේ මට දුන්න දෙවිතුමනේ ගීතිකාව ලියන ලද)
- බ්‍රිසිල් බෝඩ්/ඩිමයි, ප්ලැටිග්නම්
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කරගන්න.
  (පෙර ක්‍රියාකාරකමේ නායකත්වය නොගත් අයෙකුට අවස්ථාව ලබා දෙන්න)
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව හොඳින් කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයින් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැනගන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන, දස පණතේ පස්වන පණත පිළිබඳ ව ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (රචනා, දැනුම මිනුම තරග, පෝස්ටර්, නාට්‍ය, විරිඳු, නිසඳැස් යනාදි ක්‍රම භාවිතා කළ හැකි ය.)

## ඇමුණුම 2

### නියුක්තිකරණය සඳහා ගීතිකාව

(අදාළ පෝස්ටරය ප්‍රදර්ශනය කර, කැසට් පටයක් හෝ CD තැටියක් භාවිත කරමින්, ගීතිකාව තාලයට අනුව නිවැරදි ව ගායනා කරන්න.)

**ජීවිතේ මට දුන්නු දෙවිතුමනේ**

ජීවිතේ මට දුන්නු දෙවිතුමනේ
මගේ පණ නල ඔබ අතේ රැඳුනේ
රැක ගන්න සමිඳුනි මා //

හිරු උදාවී දවස ඇරඹෙන්නේ
දිවිය ගෙවුමට මා වෙහෙස වන්නේ //
රැක ගන්න සමිඳුනි මා //

සතුරු අනතුරු මා වටේ එන්නේ
රුදුරු බියකරු සතුන් විලසින්නේ //
රැක ගන්න සමිඳුනි මා//

අඳුරු සිතුවිලිවලින් වට වෙන්නේ
දුක් සුසුම් පැරදුම් වෙළා ගන්නේ
රැක ගන්න සමිඳුනි මා //

## ඇමුණුම 3

### ගවේෂණ පත්‍රිකාව

දේව මැවිලි අතර උතුම් ම මැවිල්ල වන්නේ, මිනිසා ය. මන්දයත්,

1. මිනිසා දේව ස්වරූපයට හා සමානකමට දෙවියන් වහන්සේ මැවූ සේක. (උත්පත්ති 1/27-28)
2. ඔහු තුළට දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ ජීවන හුස්ම හෙලූ සේක. (උත්පත්ති 2/7)

අන් කිසිඳු මැවිල්ලකට මෙවැනි ගෞරවාන්විත තත්ත්වයක් නොමැත.

එබැවින් අපි සැවොම දෙවියන් වහන්සේගේ උසස් ම මැවිල්ල වන මිනිසා ව සුරැකිය යුතු ය, ඔහුට ගරු කළ යුතු ය.

පළමු කොට, අපි අපගේ ජීවිත සුරැකිය යුතු ය. දුම්පානය, මත්ද්‍රව්‍ය භාවිතය තුළින් අපගේ ජීවිත ක්‍රම ක්‍රමයෙන් විනාශ මුඛය කරා ගමන් කරයි. එමගින් අප තුළ ඇති දේව ස්වරූපය හා සමානකම විනාශ කර ගනිමු. ජීවන හුස්ම අපි අපගෙන් ඉවත් කර ගනිමු. මත්ද්‍රව්‍ය භාවිතය තුළින්, මත්පැන් හා දුම්වැටියට වඩා ඉක්මනින් අපි අපේ ජීවිතය විනාශ කර ගනිමු. මත්පැන්වලට හා දුම්වැටිවලට එක්වර ම ඇබ්බැහි නොවුන ද, මත් ද්‍රව්‍යවලට එක වරම ඇබ්බැහි වීම සිදු වේ. එක් වතාවක් මත්ද්‍රව්‍ය භාවිතා කළ අයෙකුට, දිගින් දිගට ම එය අවශ්‍ය වේ. එබැවින් මත්පැන් හා දුම්වැටි මෙන් ම මත් ද්‍රව්‍ය ද සම්පූර්ණයෙන් ම පිටුදැකිය යුතු ය.

කුලියට ගත් නිවසක අයිතිය ඇත්තේ කුලීකරුවාට නොව ගෙහිමියාට ය. එබැවින් කුලීකරුවාට නිවස අලංකාර ව, ක්‍රමවත් ව පවත්වාගෙන යාමට මිස එය කඩා බිඳ දැමීමට අයිතියක් නොමැත.

එලෙස ම අපේ ජීවිතය ද කුලියට ගත් නිවසක් වැනි ය. එහි උරුමය ඇත්තේ දෙවියන් වහන්සේට ය. දෙවියන් වහන්සේට අයත් මෙම ජීවිතය අප විසින් සුරක්ෂිත කර, වර්ධනය කර, නැවත ඔවුන් වහන්සේට බාර දිය යුතු ය. එමෙන් ම ජේසුස් වහන්සේ අපට වදාරා ඇත්තේ, ''ඔබ ඔබට ප්‍රේම කරන්නාක් මෙන් ම, අන්‍යයට ද ප්‍රේම කළ යුතු''බව ය. ඒ අනුව තම ජීවිතයට ප්‍රේම කිරීම පළමු කොන්දේසියයි. එම කොන්දේසිය උල්ලංඝනය කරමින්, සහෝදරයාට ප්‍රේම කිරීමට අපට නොහැකි ය. එම නිසා අපගේ ජීවිත විනාශ කර ගැනීමට අපට කිසිඳු අයිතියක් නැත.

දෙවියන් වහන්සේ ජෙරමියා දිවැසිවරයා කැඳවීමේ දී ප්‍රකාශ කරන්නේ, ''මා නුඹ කුසෙහි පිළිසිඳ ගැනීම ඇති කරන්නටත් පෙර පටන්, මම නුඹ හඳුනා ගතිමි. නුඹේ උපතට පෙර මම නුඹ කැප කළෙමි'' (ජෙරමියා 1/5)යනුවෙන් ය. ඒ අනුව, දෙවියන් වහන්සේ විසින් මව් කුසේ පිළිසිඳ ගැනිමටත් පෙර සිට ම සෑම කෙනෙක් ම හඳුනා ගෙන, කැප කර ඇත. එබැවින් මව් කුස පිළිසිඳ ගත් කළලයක් පවා, ගබ්සා කර විනාශ කිරීම, දේව අභිප්‍රායට පටහැනි වූ, තම පටු පරමාර්ථයන් ඉටු කර ගන්නා ක්‍රියාවක් වන්නේ ය.

පස්වන පණතට විරුද්ධ ව සිදු කරන ක්‍රියා ලෙස, මිනිස් ඝාතන, වාර්ගික සමූල ඝාතන, ගබ්සාව, සියදිවි නසාගැනීම, මානසික හා ශාරීරික වදහිංසා, අසාධාරණ ලෙස සිරගත කිරීම, රටින් පිටුවහල් කිරීම, දරුවන් හා ස්ත්‍රීන් විකිණීම, ගණිකා වෘත්තිය, වහල්භාවය, ශ්‍රමය සූරාකෑම, චරිත ඝාතනය හැඳින්විය හැකි ය.

**ගෙදර පරිසරයෙන් :**

දේව ස්වරූපය දරන මනුෂ්‍යයාගේ ජීවිතයට ගරු කරන්න; රැක ගන්න

## 19 වන පාඩම

## නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝය

**නිපුණතාව** 4.0 : දේව පණත් පිළිපදිමින්, ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.
**නිපුණතා මට්ටම** 10.4.4: සිතින් කයින් නිර්මල දිවි පෙවෙතක් ගතකරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- හය හා නවය පණත් අනුව ජීවත් වන ආකාරය ගොනු කරයි.
- හය හා නවය පණත් ආරක්ෂා කර ගැනීමට සිත පාලනය කර ගත යුතු බව පිළිගනියි.
- හය හා නවය පණත් අනුව ජීවත් වන ආකාරය නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- සිතින් හා ක්‍රියාවෙන් පිරිසිඳු ජීවිතයක් ගත කරයි.
- අන් අයට ශුද්ධවන්ත පිවිතුරු ජීවිතයක් ගත කිරීමට උදව් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර** 1

ඇමුණුම 2 ක්‍රියාත්මක කර, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.

- ශුද්ධ වු මරිය ගොරෙත්ති තුමියගේ ජීවිතය පිරිසිඳුකමේ ආදර්ශයක් බව
- ''නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝය.'' යනුවෙන් ශුද්ධ ලියවිල්ලේ සඳහන් වන බව
- කාමමිථ්‍යාචාරය නොකරන්න, පරදාර ආලය නොකරන්න යන හය හා නවය පණත් වලින්ද අණ කරන බව
- සිතින් හා කයින් නිර්මලව දිවි ගෙවීමට හැකි බව
- ශරීරය යහපත් දේ මිස අයහපත් දේ කිරීමට නොවන බව

(මිනිත්තු 15)

**පියවර** 2

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා 3 ඇසුරින් සකස් කරන ලද ගවේෂණ පත්‍රිකාව සපයන්න.
- සිසුන් ව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිතා කරන්න

(මිනිත්තු 35)

**පියවර** 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව, විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම් වලින් හා සිසුන්ගෙන් සංවර්ධනාත්මක යෝජනා ලබාගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කරගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- වෘත ශුද්ධිය
- වෘත ශුද්ධියට විරුද්ධ ක්‍රියාවන්
  1. රාගය
  2. ස්වයං වින්දනය
  3. කාම මිථ්‍යාචාරය
  4. ගණිකා වෘත්තිය
  5. ස්ත්‍රී දූෂණ
  6. සමලිංගික සේවනය
  7. විවාහ පොරොන්දු කඩ කිරීම
  8. අසභ්‍ය පතපොත කියවීම, අසභ්‍ය දර්ශන නැරඹීම හා අසභ්‍ය වචන භාවිතය
- භය හා නවය පණත් පිළිපැදීමෙන් නිර්මල සිතක් ඇතිවන බව
- ඒ තුළින් භාග්‍යවන්තයෙක් වන බව
- නිර්මල සිතක් පවත්වා ගැනීමට බාධා වන ක්‍රියාවන්
  1. අසභ්‍ය පතපොත කියවීම, නිල් චිත්‍රපට ඇතුලු අසභ්‍ය දර්ශන නැරඹීම
- පාපි සිතුවිලි ඇති අයව නිර්මල පිවිතුරු ජීවිත තත්ත්වයට වෙනස් කළ හැකි බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- **කතෝලික සභාවේ ධර්මෝපදේශය අංක 2337-2345, 2351-2359, 2364-2365**
- ශුද්ධවන්ත ජීවිත කථා ඇතුළත් පොතක් (ශුද්ධ වූ මරිය ගොරෙත්ති තුමිය)
- ඇමුණුම 1 , 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කරගන්න.
  (පෙර ක්‍රියාකාරකමේ නායකත්වය නොගත් අයෙකුට අවස්ථාව දෙන්න)
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයින් සමඟ සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කරගත් කරුණු පදනම් කර ගෙන, වෘත ශුද්ධිය හා වෘත ශුද්ධියට විරුද්ධ ක්‍රියාවන් පිළිබඳ ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (බුද්ධි මණ්ඩල සාකච්ඡා, පෝස්ටර්, බිත්ති පුවත්පතට ලිපි යනාදි ක්‍රම භාවිතා කළ හැකි ය.)

## ඇමුණුම 2
## නියුක්තිකරණය සඳහා ශුද්ධවර ජීවිත කථාවක්

(ශුද්ධ වූ මරිය ගොරෙත්ති තුමියගේ ජීවිත කථාව සිසුන්ට කතාන්දරයක් ආකාරයෙන් පවසන්න)

- ඉතාලියේ ආරකෝතා ප්‍රාන්තයේ කොරිනාල්ඩෝ ග්‍රාමයේ විසූ ලුවිජි ගොරෙත්ති හා අසුන්තා කර්ලිනිගේ තෙවන දියණිය ලෙස 1890 ඔක්තොම්බර් මස් 16වන දින උපත ලැබීම

- දුප්පත්කම නිසා ගම හැරදා රැකියාවක් පතා රෝමයට යාම, එහි දී ධනපති ඉඩම් හිමියකු යටතේ වැඩකිරීම, ඔහුගේ ම නිවසේ යාබද ගොඩනැගිල්ලේ ජීවත්වීම, එක ම මුළුතැන්ගෙයක ආහාර පිස ගැනීම, ටික කලකින් මැලේරියා රෝගයෙන් පියා මිය යාම.

- පාසල් යාම ද අතහැර මවට උදව් වීමට ගොරෙත්තිට සිදු වීම, ගෙදර තනි වූ මොහොතක ගෙවල් හිමියාගේ පුතා වන ඇලෙක්සැන්ඩර් ඇය ව පාපයට පොළඹවා ගැනීමට උත්සාහ කිරීම.

- වයස අවුරුදු 12 දී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගත් ඇය, අපිරිසිදුකමේ පාපයට වැටී, මුළු ආත්මය ම විනාශ කරගන්නවාට වඩා ජීවිතය නැතිවීම යහපත් යැයි තීරණය කර තිබූ නිසා ඔහුගේ පෙළඹවීමට අවනත නොවූ අතර, ඒ නිසා ම ඇයට මරණය හිමි විය.

- පිහි පහර දාහතරක් අණිනු ලැබ, සිහිසුන්ව සිටි මොහොතේ, අසල්වාසීන් ඇය ව වටකර ගත්හ. එවිට ඇය පවසා ඇත්තේ, ''මං ඇලෙක්සැන්ඩර්ට සමාව දෙනවා'' යනුවෙනි.

- මරණ මොහොතේ ඇයට අන්තිම ආලේපය හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගැනීමේ වරය ද ලැබුණු අතර, 1802 ජූලි මස 06වන දින, ඇය ස්වර්ගස්ථ වූවාය. ඇයගේ සිරුර නොදිරා ඇති අතර 1950 ජූනි මස 25වන දින ඇය ව සාන්තුවර තත්ත්වයට ඔසවන ලදී.

## ඇමුණුම 3

## ගවේෂණ පත්‍රිකාවක් සැදීමට උපදෙස්

''කතෝලික සභාවේ ධර්මෝපදේශය'' නමැති ග්‍රන්ථයේ අංක 2337-2345, 2351-2359 හා 2364-2365 කියවා, එහි අඩංගු කරුණු සිසුන්ට ගැළපෙන සරල භාෂාවකින් ලියා, ගවේෂණ පත්‍රිකාව සකස් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

අසභ්‍ය පොත පත හා චිත්‍රපට පිටුදකින්න. විවාහ පොරොන්දුවලට විශ්වාසවන්ත ව ජීවත්වන්න.

# 20 වන පාඩම

## පෞද්ගලික දේපළ ස්වර්ගීය සම්පත් සඳහා

**නිපුණතාව** 4.0 : දේව පණත් පිළිපදිමින්, ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම** 10.4.5: ජාතියේ, සමාජීය හා ආර්ථික වර්ධනයට රුකුලක් වන මානව සම්පත් සංවර්ධනයේ දී පෞද්ගලික දේපල කාර්යක්ෂම ව භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- පෞද්ගලික දේපල පිළිබඳ ව ශුද්ධ වූ සභා ඉගැන්වීම් ගොනු කරයි.
- මිනිසා දේපල සඳහා නොව දේපල දෙවියන් වහන්සේ ලබාදී ඇත්තේ, මිනිසාට සේවය කිරීම සඳහා බව පිළිගනියි.
- ශුද්ධ වූ සභා ඉගැන්වීම් අනුව, පෞද්ගලික දේපල නිවැරදි ව පරිහරණය කිරීම හා එහි ආදීනව පිළිබඳ නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- පෞද්ගලික දේපල පරිහරණය කිරීමේ දී පරාර්ථකාමී ව ක්‍රියා කරයි.
- පෞද්ගලික දේපලවලින් අන් අයට උදව් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

ඇමුණුම 2 ප්‍රදර්ශණය කර, ඒ එක් එක් සිරස්තලය එක් එක් සිසුවා ලවා ශබ්ද නගා කියවන්නට අවස්ථාව ලබා දෙන්න. අනතුරු ව, එක් එක් සිරස්තලයෙන් කඩවන පණත් ගැන විමසමින්, පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- හත් වන පණත - සොරකම් නොකරව
- දහවන පණත - අන්වස්තු ආශා නොකරව
- එම පණත් අනුව කළ යුතු හා නොකළ යුතු දෑ

(මිනිත්තු 10 )

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා 3 ඇසුරින් සකස් කරන ලද ගවේෂණ පත්‍රිකාව බැගින් සපයන්න.
- සිසුන් ව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මඟ පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න

(මිනිත්තු 15)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව, විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වලින් හා සිසුන්ගෙන් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කරගෙන හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින් පාඩම සාරාංශ කරන්න.

- පෞද්ගලික දේපළ පිලිබඳ ශුද්ධ වූ සභා ඉගැන්වීම්
- අන් අයගේ දේපල සුරැකිය යුතු බව
- දුගී අයට උදව් කිරීම කිතුනු ණය යුක්තියක් බව

**ගුණාත්මක යෙදවුම්** :

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම (1 ජොහාන් 3/17)
- කතෝලික සභාවේ ධර්මෝපදේශය අංක 2402-2406, 2408-2414 ,2443-2449,2534
- බ්‍රිසිල් බෝඩ්/ඩිමයි, ප්ලැටිග්නම්
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කරගන්න.
  (පෙර ක්‍රියාකාරකමේ නායකත්වය නොගත් අයෙකුට අවස්ථාව දෙන්න.)
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව හොඳින් කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයින් සමග සාකච්ඡා කරන්න.
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැනගන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කරගත් කරුණු පදනම් කර ගෙන, දසපණතේ දහවන පණත පිළිබඳ ව පහත සඳහන් ශීර්ෂ පාඨවලට අනුව ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.
- පෞද්ගලික දේපල පිළිබඳ ශුද්ධ වූ සභා ඉගැන්වීම්
- අන් අයගේ දේපල සුරැකීම
- දුප්පතුන්ට ප්‍රේම කිරීම

## ඇමුණුම 2
## නියුක්තිකරණය සඳහා පෝස්ටරය

හත හා දහ වන පණත් කඩකිරීම සම්බන්ධ පුවත්පත් සිරස්තල සහිත පෝස්ටරයක්

## ඇමුණුම 3

## ගවේෂණ පත්‍රිකාවක් සෑදීම සඳහා උපදෙස්

''කතෝලික සභාවේ ධර්මෝපදේශය'' නමැති ග්‍රන්ථයේ අංක 2402-2406, 2408-2414, 2443-2449, 2534 හා 1 ජොහන් 3/17 කියවා, එහි අඩංගු කරුණු සිසුන්ට ගැළපෙන සරල භාෂාවකින් ලියා, ගවේෂණ පත්‍රිකාව සකස් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

හැකි සෑම විට ම දුප්පතුන්ට උදව් කරන්න.

## 21 වන පාඩම
## ස්වාමිවාක් ආරාධනාව

**නිපුණතාව 4.0 :** දේව පණත් පිළිපදිමින්, ප්‍රේමයේ ජීවිතයක් ගත කරයි.
**නිපුණතා මට්ටම 10.4.6 :** සත්‍යයට සාක්ෂි දරමින්, සදාචාර සම්පන්න ජීවිතයක් ගත කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- සත්‍යගරුක සමාජයක් ගොඩනැගීම සඳහා දායක විය හැකි ආකාර පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- සැමවිට ම සත්‍යවාදී විය යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- සත්‍යයට සාක්ෂි දරයි.
- අන් අයගේ රහස් රකියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

**පියවර 1**

ඇමුණුම 2 පෙර පුහුණුවකින් යුතු ව පන්තිය ඉදිරියේ රඟ දැක්වීමට සලස්වන්න. පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ, සාකච්ඡාව මෙහෙය වන්න.

- අටවන පණත - බොරු සාක්ෂි නොකියව
- එම පණතට අනුව කළ යුතු හා නොකළ යුතු දෑ

(මිනිත්තු 10 )

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා 3 ඇසුරින් සකස් කරන ලද ගවේෂණ පත්‍රිකාව බැගින් සපයන්න.
- සිසුන් ව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න

(මිනිත්තු 15)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබාදෙන්න.
- පළමු ව, විස්තාරණය සඳහා ඉදිරිපත් කළ කණ්ඩායමේ සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අනෙක් කණ්ඩායම්වලින් සංවර්ධනාත්මක යෝජනා ලබා ගන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- සත්‍යය තුළ ජීවත්වීම
- සත්‍යයට සාක්ෂි දැරීම

- අටවන පණතට විරුද්ධ පාපයන්
- රහස් රැකීමේ අවශ්‍යතාව
- සත්‍යයට සාක්ෂි දැරීම සඳහා ධෛර්යවත් ව ඉදිරිපත් විය යුතු බව
- සත්‍ය හා සාධාරණත්වය පදනම් කර ගත් සමාජයක් තුළින් දේව රාජ්‍යය අත්දැකිය හැකි බව
- දේව වචනය තුළින් හා ශුද්ධ වූ සභාවේ ඉගැන්වීම් තුළින් අටවන පණත තවදුරටත් අර්ථකථනය කරන බව

(මිනිත්තු 15)

**ගුණාත්මක යෙදවුම් :**

- කතෝලික සභාවේ ධර්මෝපදේශය අංක 2465-2487, 2491
- බ්‍රිසිල් බෝඩ්/ඩිමයි, ජ්ලැටිග්නම්
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කරගන්න.
  (පෙර ක්‍රියාකාරකමේ නායකත්වය නොගත් අයෙකුට අවස්ථාව දෙන්න)
- ඔබේ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාව කියවන්න
- එහි ඇති කරුණු කණ්ඩායමේ සාමාජිකයින් සමග සාකච්ඡා කරන්න
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැනගන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කරගත් කරුණු පදනම් කර ගෙන, දස පණතේ අටවන පණත පිළිබඳ ව පහත සඳහන් කරුණුවලට අදාළ ව ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (බුද්ධි මණ්ඩල සාකච්ඡා, නාට්‍ය, විරිඳු, පෝස්ටර් යනාදි ක්‍රම භාවිත කළ හැකිය.)
  - සත්‍යය තුළ ජීවත්වීම
  - සත්‍යයට සාක්ෂි දැරීම
  - අටවන පණතට විරුද්ධ පාපයන්
  - රහස් රැකීමේ අවශ්‍යතාවය

## ඇමුණුම 2

## නියුක්තිකරණය සඳහා දෙබසක්

(උසාවියක දර්ශණයක්)

තෝල්කයා : නඩුකාර හාමුදරුවෝ පැමිණෙනවා, උසාවිය නිශ්ශබ්ද වෙනු. (නඩුකාරතුමා පැමිණේ, සියලුදෙනා නැගිට සිටිති.)

තෝල්කයා : නඩු අංක 210 පැමිණිල්ල හා විත්තිය ඉදිරියට පැමිණෙන්න

තෝල්කයා : පසුගිය දෙසැම්බර් මාසයේ 16 වන දින මැණික්හින්න ප්‍රදේශයේ සිදු වූ සිරිපාල නමැත්තාගේ ඝාතනය පිළිබඳ ව නඩු විභාගය මේ මොහොතේ යෙදී ඇත. (විත්තිකරුට චෝදනා පත්‍ර බාර දී, නඩුකාරතුමා විත්තියේ නීතිඥ මහතාගෙන් ප්‍රශ්න කරයි)

නඩුකාරතුමා : ඉහත ඝාතනයට තමා වැරදිකරු ද? නිවැරදිකරු ද?

විත්තියේ නීතිඥ : නිවැරදිකරු ස්වාමිනී

නඩුකාරතුමා : සාක්ෂි ඉදිරිපත් කරන්න.

තෝල්කයා : සාක්ෂිකරුවන් ඉදිරියට පැමිණෙන්න.

1 සාක්ෂිකරු : ස්වාමීනී, විත්තිකරු ඔය මේසය උඩ තියෙන පිහියෙන් අනිනවා මම මගේ ඇස් දෙකෙන් ම දැක්කා.

2 සාක්ෂිකරු : ස්වාමීනී, විත්තිකරු ඔය මේසය උඩ තියෙන පිහියෙන් අනිනවා මමත් මගේ ඇස් දෙකෙන් ම දැක්කා.

නඩුකාරතුමා : සාක්ෂි අනුව විත්තිකරු වරදකරු බවත්, ජනාධිපති තුමා විසින් නියම කරන දිනක දී මොහු එල්ලා මැරීමටත් නියෝග කරමි.

තෝල්කයා : උසාවියේ වැඩ කටයුතු අවසන්

(1 සාක්ෂිකරු 2 සාක්ෂිකරු අමතා උසාවියෙන් නික්මයන ගමන් මෙසේ පවසයි.)

1 සාක්ෂිකරු : අපි දෙන්නා දුන්න බොරු සාක්ෂිය නිසා අපිට රුපියල් ලක්ෂය ගානේ හම්බවෙනවනේ බං.

## ඇමුණුම 3

## ගවේෂණ පත්‍රිකාවක් සෑදීම සඳහා උපදෙස්

''කතෝලික සභාවේ ධර්මෝපදේශය'' නමැති ග්‍රන්ථයේ අංක 2465-2487, 2491 කියවා, එහි අඩංගු කරුණු සිසුන්ට ගැළපෙන සරල භාෂාවකින් ලියා, ගවේෂණ පත්‍රිකාව සකස් කරන්න

**ගෙදර පරිසරයෙන්** :

පවුල තුළ එකිනෙකාට අවංක වන්න.

## 22 වන පාඩම

## නමෝමරිය යාච්ඤාව

**නිපුණතාව 5.0** : යාච්ඤාවෙන් පෝෂණය ලබා, දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම 10.5.1**: ජනවන්දනා වර්ෂය තුළ සමරන දේව අභිරහස් ජීවත් කරවයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ජනවන්දනා වර්ෂය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ජනවන්දනා චක්‍රයේ ඇති මංගල්‍යයන් අර්ථවත් ව පැවැත්විය යුතු බව පිළිගනියි.
- ජනවන්දනා වර්ෂය තුළ අඩංගු මංගල්‍යයන් වගුගත කර, නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ජනවන්දනා වර්ෂය තුළ දේව අභිරහස් අර්ථවත් ව සමරයි.
- කණ්ඩායම් තුළ ප්‍රේමයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- කතෝලික ජනවන්දනා වසර දැක්වෙන පෝසටරය සියල්ලන්ට ම පෙනෙන සේ ප්‍රදර්ශනය කරන්න.
- එම පෝස්ටරයේ සඳහන් කරුණු පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

පහත සඳහන් අදහස් මතුවන සේ සාකච්ඡාව මෙහෙය වන්න.

- ජනවන්දනා වර්ෂය ශුද්ධ වූ සභාව විසින් ආගමන සමය, නත්තල් සමය, චතාරික සමය, පාස්කු සමය හා සාමාන්‍ය සමය ලෙස වෙන්කර ඇති බව
- ජනවන්දනා වර්ෂය තුළ ඒ ඒ සමයට නියමිත වර්ණ භාවිතයට ගන්නා බව (පියතුමාගේ ඇඳුම්, පූජාසන රෙදි වැනි දේ එම වර්ණයට අනුකූල බව)

(මිනිත්තු 08)

**පියවර 2**

- පන්තියේ සිසුන් කණ්ඩායම් 5කට බෙදන්න.
- ඇමුණුම 1 හා 2 හා ඩිමයි කඩදාසි හා මාකර් පෑන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- කාර්යය පවරා කුඩා කණ්ඩායම් ගවේෂණයේ යොදවන්න.
- සමස්ත කණ්ඩායම් ඉදිරිපත් කිරීමකට සූදානම් කරවන්න.

(මිනිත්තු 17)

පියවර 3

- කුඩා කණ්ඩායම් අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරවන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින්, සමාලෝචනයක යෙදෙන්න.

- ජනවන්දනාව යනු ක්‍රිස්තුන් වහන්සේ හිස වන්නා වූ ද, විශ්වාසකයින් අවයව වන්නා වූ ද, ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය දෙවි පියාණන් වහන්සේට පුදන පූර්ණ ප්‍රසිද්ධ වන්දනාවයි (දෙවන වතිකාන කතිකාවතේ පොදු ජනවන්දනාව පිළිබඳ ව්‍යවස්ථාව)
- ජනවන්දනා චක්‍රය තුළ ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ අභිරහස සිහිපත් කරන බව
- ජනවන්දනා වර්ෂයේ එක් එක් සමය පිළිබඳ කෙටි විස්තරයක්
- ශුද්ධ වූ සභාව විසින් ජනවන්දනා වර්ෂයේ සමයන් පහට ම දින වෙන්කර ඒ අනුව ජනවන්දනාව සැලසුම් කර ඇති බව
- ජනවන්දනා චක්‍රයේ ඇති මංගල්‍යයන් අර්ථවත් ව පැවැත්විය යුතු බව

(මිනිත්තු 15)

**ගුණාත්මක යෙදවුම් :**

- කතෝලික ජනවන්දනා වර්ෂය දැක්වෙන පෝස්ටරයක්
- කතෝලික සභා ධර්මෝපදේශය (අංක 1168 හා 1169)
- ජනවන්දනාව පිළිබඳ ව්‍යවස්ථාව අංක 07
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කරගන්න
- ඔබ කණ්ඩායමට ලැබී ඇති ගවේෂණ පත්‍රිකාවේ සඳහන් ශුද්ධ ලියවිලි පාඨය හා අනෙකුත් කරුණු හොඳින් කියවන්න
- එහි ඇති කරුණු කණ්ඩායමේ සමාජිකයින් සමග සාකච්ඡා කරන්න
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැන ගන්න.
- ඔබ කණ්ඩායම කියවා ගොනු කර ගත් කරුණු පදනම් කර ගෙන ''දේව මාතාවන් වහන්සේ'' පිළිබඳ ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (ඉදිරිපත් කිරීම සඳහා බුද්ධි මණ්ඩල සාකච්ඡා, නාට්‍ය, විරිදු, පෝස්ටර් යනාදි ක්‍රම භාවිත කළ හැකි ය.)

## ඇමුණුම 2
## ගවේෂණ පත්‍රිකාව

- ''ශුද්ධවූ සභා මාතාව පාස්කු අභිරහස සැමරීම සඳහා ජනවන්දනා ක්‍රියාකාරිත්වයේ දී උත්තම පූජකයාණන් වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තම පාස්කු අභිරහසට අපව මුළුමනින් ම සහභාගී කරවා ගන්නා සේක.'' (ජනවන්දනාව පිළිබඳ ප්‍රකාශය අංක 07)

- කතෝලික සභා ධර්මෝපදේශයේ අංක 1168 හා 1169 මඟින් ජනවන්දනා වර්ෂය පිළිබඳ සභා ඉගැන්වීම් ප්‍රකාශ කෙරේ.
- සාමාන්‍ය වසරකට මෙන් ජනවන්දනා වසරකට ද සති 52ක් ඇත. ජනවන්දනා වර්ෂය ආරම්භ වන්නේ ආගමන සමයේ පළමුවන ඉරුදින ය. එය අවසාන වන්නේ ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යයට පසු ව උදා වන සෙනසුරාදා දින ය.

| කාලවකවානුව සමය | භාවිත වන වර්ණය | අරමුණ | ආරම්භය | අවසානය |
|---|---|---|---|---|
| ආගමන සමය | දම් | ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මාංශගතවීමත් උන්වහන්සේගේ දෙවන ආගමනය සහ අප හදවත් තුළට නිරන්තර ආගමනයත් බලාපොරොත්තු-වෙන් සූදානම් වන කාලයයි | නොවැම්බර් මස අවසාන ඉරුදින හෝ දෙසැම්බර් මස පළමු ඉරුදින | නත්තල් මංගල්‍යයට පෙර දිනය (දෙසැම්බර් 24) |
| නත්තල් සමය | සුදු | ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උපත හා ළමා කාලය ද සිහිපත් කෙරේ. | ක්‍රිස්තෝත්පත්ති මංගල්‍යය දිනය (දෙසැම්බර් 25) | ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ස්නාපන මංගල්‍යය පවත්වන ඉරුදිනට පෙර දිනය දක්වා (රජුන්ට ප්‍රත්‍යක්ෂවීමේ මංගල්‍යයට පසු ව එන සෙනසුරාදා දින) |
| සාමාන්‍ය සමය 1 | කොළ | ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය, උන්වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්යය, සුවකිරීම් හා දේශනාවන් සිහිපත් කෙරේ. | ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ස්නාපන මංගල්‍යය | ගුරු අඟහරුවාදා |
| චතාරික සමය | දම් | ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නිරාහාරව ගෙවූ දින 40 සිහිපත් කරමින් උන්වහන්සේගේ පාස්කු අභිරහස සමරන්නට සූදානම් වෙයි. තවද වැඩිහිටි ප්‍රසාද ස්නාපනය සඳහා සූදානම් වන්නන්ගේ අවසාන සූදානම්වීමේ කාලපරිච්ඡේදය ද වෙයි. | අළු බදාදා | ශුද්ධවූ සතියේ සමිඳාණන්ගේ බොදුන් මගුල සමරන සන්ධ්‍යා පූජාවට පෙර (මහ බ්‍රහස්පතින්දා දිව්‍ය පූජාවට පෙර ) |
| පාස්කු සමය | සුදු | ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය, උන්වහන්සේ ශ්‍රාවකයන්ට දර්ශනයවීම් සහ උන්වහන්සේ ගේ ස්වර්ගාරෝහණය ද පෙන්තකොස්තය ද සීහිපත් කරයි. | පාස්කු ඉරිදා (ක්‍රිස්තෝත්ථාන මංගල මහෝත්සවය) | පෙන්තකොස්තය |
| සාමාන්‍ය සමය 11 | කොළ | ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය, උන්වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්යය▫ සුවකිරීම් හා දේශනාවන් සිහිපත් කෙරේ. | පෙන්තකොස්ත මංගල්‍යය දිනට පසු සඳුදා | ආගමන කාලයේ පළමුවන ඉරුදින ට පෙර සෙනසුරාදා දින |

**ගෙදර පරිසරයෙන්** :

ජනවන්දනා චක්‍රයේ ඇති මංගල්‍යයන් සඳහා අර්ථවත් ව සහභාගි වන්න.

## 23 වන පාඩම

## දිව්‍ය පූජාව

**නිපුණතාව 5.0** : යාච්ඤාවෙන් පෝෂණය ලබා, දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමඟ ගැඹුරු සම්බන්ධතාවයක් ගොඩ නගා ගනියි.

**නිපුණතා මට්ටම 10.5.2**: දිව්‍ය පූජාව කිතුනු දිවියේ කේන්ද්‍රය කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- දිව්‍ය පූජාවේ පිළිවෙත් හතර පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දිව්‍ය පූජාවට නිසි සූදානමකින් සහභාගිවීමට කැමැත්ත පළ කරයි.
- දිව්‍ය පූජාවේ එක් එක් පිළිවෙතේ අනු කොටස් පිළිබඳ ව සකස් කරන ලද වාර්තාව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දිව්‍ය පූජාවට භක්තියෙන් සහභාගි වෙයි.
- කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- ඉරුදින දිව්‍ය පූජාවට යන පවුලක පින්තූරය ප්‍රදර්ශනය කර, පින්තූරයේ දැක්වෙන්නේ කුමක්දැයි විමසමින්, පහත සඳහන් අදහස් ද ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
- ජනවන්දනාවේ උච්චතම පිළිවෙත දිව්‍ය පූජාව බව
- සෑම ඉරුදිනක ම හා ණය මංගල්‍ය දිනක ම නොවරදවා ම දිව්‍ය පූජාවට සහභාගි විය යුතු බව
- මුළු දිව්‍ය පූජාවට ම සහභාගි විය යුතු බව
- පවුලක් ලෙස දිව්‍ය පූජාවට සහභාගි වීමේ ඇති වැදගත්කම

(මිනිත්තු 18)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා 2 බැගින් සපයන්න.
- සිසුන් ව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න

(මිනිත්තු 32)

**පියවර 3**

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කර ගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- දිව්‍ය පූජාව දෙවියන් වහන්සේ ම ක්‍රිස්තුස් වහන්සේ මගින් ස්ථාපිත කරන ලද අතිසුවිශුද්ධ වූ අභිරහසකි
- එබැවින් එහි ශුද්ධත්වය, ගරුත්වය, නිරවද්‍ය බව, ගාම්භීර බව යනාදිය සුරැකීමට අප ණය යුක්තියෙන් බැඳී සිටින බව
- දිව්‍ය පූජාවේ ප්‍රධාන පිළිවෙත් 4කි.
  1. ආරම්භක පිළිවෙත
  2. දේව වාක්‍ය පිළිවෙත
  3. ස්තෝත්‍ර යාගික පිළිවෙත
  4. නිම කිරීමේ පිළිවෙත

  (ඉහත පිළිවෙත් හතරෙහි අනු පිළිවෙත් ගෙනහැර දක්වන්න)

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්**

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම (ලූක් 22/19-20)
- ඉරුදින දිව්‍ය පූජාවට යන පවුලක පින්තූරයක්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කරගන්න. (පෙර ක්‍රියාකාරකමේ නායකත්වය නොගත් අයෙකුට අවස්ථාව දෙන්න)
- ගවේෂණ පත්‍රිකාවේ ඇති කොටස් හොඳින් කියවා කණ්ඩායම තුළ සාකච්ඡා කරන්න
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැනගන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කරගත් කරුණු පදනම් කර ගෙන, ''දිව්‍ය පූජාව.'' යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (ඉදිරිපත් කිරීම සඳහා බුද්ධි මණ්ඩල සාකච්ඡා, නාට්‍ය, විරිඳු, පෝසටර් යනාදි ක්‍රම භාවිතා කළ හැකි ය.)

## ඇමුණුම 2

### ගවේෂණ පත්‍රිකාව

ජනවන්දනාව කිතුනු සංඝයේ ජීවනාලියයි. ජනවන්දනාවේ උච්චතම පිළිවෙත දිව්‍ය පූජාවයි. දිව්‍ය පූජාවට ක්‍රියාකාරී ලෙස හා භක්තියෙන් සහභාගි විය යුතු ය. දිව්‍ය පූජාවේ කොටස් පහත පරිදි පෙළගැස්විය හැකි ය.

1. ආරම්භක පිළිවෙත
   - i. ඇතුලුවීමේ ගීතිකාව
   - ii. ආචාරය
   - iii. හැඳින්වීම
   - iv. පශ්චත්තාපික පිළිවෙත
   - v. ස්වාමිනි කරුණා කළ මැනව
   - vi. සුරදූත ගීය
   - vii. පොදු යැදුම
2. දේව වාක්‍ය පිළිවෙත
   - i. පළමු දේව ප්‍රකාශනය
   - ii. පිළිතුරු ගීය
   - iii. දෙවන දේව ප්‍රකාශනය
   - iv. සාදුකාරය
   - v. සුබාරංචි ප්‍රකාශනය
   - vi. ධර්මානුශාසනාව
   - vii. විශ්වාස ලක්ෂණය
   - viii. විශ්වාසකයින්ගේ යැදුම්
3. පුදසුන සූදානම් කිරීමේ පිළිවෙත
   - i. පඬුරු පෙරහැර හා පඬුරු පිදීම
   - ii. පඬුරු මත යැදුම
4. ස්තෝත්‍ර යාගික පිළිවෙත
   - i. ස්තෝත්‍ර යාගික යැදුම
   - ii. ස්වාමිවාක් ආරාධනාව, සාමය පැතීම හා පූප කැඩීම
   - iii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම හා බොදුනෙන් පසු යැදුම
5. ධර්ම දූත කාර්ය සඳහා පිටත් කර යැවීමේ පිළිවෙත

**ගෙදර පරිසරයෙන්** :

දිව්‍ය පූජාව සංවිධානය කිරීමට කාර්යක්ෂම ව දායක වන්න.

## 24 වන පාඩම

## නිර්මාණාත්මක යාච්ඤා

**නිපුණතාව 50** : යාච්ඤාවෙන් පෝෂණය ලබා, දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවයක් ගොඩ නගා ගනියි.

**නිපුණතා මට්ටම 10.5.3**: කිතුනු සහා සමගිය වෙනුවෙන් කැපවෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- උත්තම පූජක යාච්ඤාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- කිතුනු සහා සමගිය වෙනුවෙන් කැපවිය යුතු බව පිළිගනියි.
- කිතුනු සහා සමගිය පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් එළිදක්වයි.
- පිළිගත් සහා සමග සමගියෙන් කටයුතු කරයි.
- එක ම සභාවක් ගොඩනැගීමට ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- ජේසුස් වහන්සේ යාච්ඤා කරන ආකාරය දක්වෙන පින්තූරය ප්‍රදර්ශනය කරල පින්තූරයේ දක්වෙන තැනැත්තා හා ඔහු කරන කාර්ය පිළිබඳ ව විමසමින්, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින්, සාකච්ඡාවක් කරන්න.
- දෙමාපියන් සමග දරුවන් කතා කරන්නා සේ, දෙවියන් වහන්සේගේ දරුවන් ලෙස අපට දෙවියන් වහන්සේ සමග කතා කළ හැකි බව
- දේව පුත්‍රයාණන් වූ ක්‍රිස්තුස් වහන්සේ හැකි සෑම අවස්ථාවක දී ම පියාණන් වහන්සේට යාච්ඤා කළ බව
- යාච්ඤාව කිතුණු ජීවිතයේ අනිවාර්ය ලක්ෂණයක් විය යුතු බව

(මිනිත්තු 18)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 හා 2 බැගින් සපයන්න.
- සිසුන් ව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මග පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිතා කරන්න

(මිනිත්තු 32)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කරගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- ජුවාම් 17 වන පරිච්ඡේදය තුළ උත්තම පූජක යාච්ඤාව සඳහන් වන බව
- උත්තම පූජක යාච්ඤාව තුළ ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර කැටිකර ඇති බව
- උත්තම පූජක යාච්ඤාව කොටස් 3කි
  - තමන් වහන්සේ වෙනුවෙන් යාච්ඤා කිරීම (ජුවාම් 17/1-5)
  - ශ්‍රාවකයන් වෙනුවෙන් යාච්ඤා කිරීම (ජුවාම් 17/6-9)
  - අනාගත සභාවේ එකමුතුව වෙනුවෙන් යාච්ඤා කිරීම (ජුවාම් 17/20-26)
- කිතුනු සභා එකමුතුව වෙනුවෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාව
- පිළිගත් සභා 7හි නම්
- දෙවන වතිකාන මන්ත්‍රණ සභා ප්‍රකාශන දෙකක් කිතුනු සභා සමගිය වෙනුවෙන් නිකුත් කර ඇති බව
- කිතුනු සභා සමගි සතිය (ජනවාරි 18-25)
- කිතුනු අපේ අරමුණ එක ම සභාවක් ගොඩනැගීම බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම (ජුවාම් 17 පරිච්ඡේදය)
- ජේසුස් වහන්සේ යාච්ඤා කරන ආකාරය දැක්වෙන පින්තූරයක්
- ඇමුණුම 1 හා 2

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්**

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කරගන්න
- ගවේෂණ පත්‍රිකාවේ ඇති කොටස් හොඳින් කියවා, කණ්ඩායම තුළ සාකච්ඡා කරන්න
- නොතේරෙන කරුණු තේරෙන අයගෙන් විමසා දැනගන්න.
- ඔබේ කණ්ඩායම කියවා ගොනු කරගත් කරුණු පදනම් කරගෙන, ''කිතුනු සභා සමගිය වෙනුවෙන් කැපවෙමු.'' යන මාතෘකාව යටතේ ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (ඉදිරිපත් කිරීම සඳහා බුද්ධි මණ්ඩල සාකච්ඡා, නාට්‍ය, විරිඳු, පෝස්ටර් යනාදි ක්‍රම භාවිතා කළ හැකි ය.)

## ඇමුණුම 2

### ගවේෂණ පත්‍රිකාව

උත්තම පූජක යාච්ඤාව ජොහාන් සුභාරංචියේ 17වන පරිච්ඡේදයේ සඳහන් වේ. එහි අභිමතාර්ථය වන්නේ, ඒකත්වයයි. ජේසුස් වහන්සේ තමන් වහන්සේ උදෙසාත් (ජුවාම් 17/1-5), තම ශ්‍රාවකයන් උදෙසාත් (ජුවාම් 17/6-9), අනාගත සභාවේ එකමුතුව උදෙසාත් (ජුවාම් 17/20-26) දෙවි පියාණන් වහන්සේට මෙම යාච්ඤාවේ දී යාච්ඤා කළ සේක. දේව රාජ්‍යය කරා යන ගමනේ දී කිතුනු සභා එකමුතුව වෙනුවෙන් කටයුතු කළ යුතු ය. පිළිගත් සභාවන් 7කි. ඒවා නම්,

1. ලංකා සභාව (එංගලන්ත සභාව/ ඇංග්ලිකන් සභාව)
2. මෙතෝදිස්ත සභාව
3. බැප්ටිස්ට් සභාව
4. ඕලන්ද රෙපරමාදු සභාව (ක්‍රිස්තියානි රෙපරමාදු සභාව)
5. ප්‍රෙස්බිටේරියන් සභාව
6. දකුණු ඉන්දියානු සභාව
7. ග්‍රීක ඕතඩොක්ස් සභාව

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ප්‍රකාශන 2ක් කිතුණු සභා සමගිය වෙනුවෙන් නිකුත් කර ඇත. සෑම වසරකම ජනවාරි 18 වන දින සිට 25 වන දින දක්වා ඉහත සඳහන් ප්‍රධාන සභා සියල්ල එකට එකතු වී කිතුනු සභා සමගිය වෙනුවෙන් යාච්ඤා කරති.

**ගෙදර පරිසරයෙන්** :

පිළිගත් සභා සමාජිකයින් සමඟ සහජීවනයෙන් කටයුතු කරන්න.

## 25 වන පාඩම

## භාවනාව

**නිපුණතාව** 50 : යාච්ඤාවෙන් පෝෂණය ලබාෆ දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමග ගැඹුරු සම්බන්ධතාවයක් ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම** 10.5.7: යාච්ඤාවෙන් සවිය ලබා දුර්පරීක්ෂා ජය ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- මල් උයනේ යාච්ඤාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤාව තුළින් අභියෝග ජය ගැනීමට ශක්තිය ලබාගත් බව පිළිගනියි.
- යාච්ඤාවෙන් සවිය ලබා දුර්පරීක්ෂාවෙන් ජයගන්නා ආකාරය පිළිබඳ ව නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් කරයි.
- ජීවිතයේ සෑම අවස්ථාවක දී ම යාච්ඤාවෙන් සවිය ලබා ගනියි.
- කණ්ඩායම් සහයෝගය තුළ ක්‍රියාකාරම්වල නිරත වේ.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

**පියවර 1**

- ඇමුණුම 2 ක්‍රියාත්මක කර, තෙරේසා දුටු සිහිනයෙන් මතු වන වැදගත් සිද්ධීන් ඇසුරෙන්, පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් කරන්න.
  - ජේසුස් වහන්සේ අපෝස්තුලුවරුන් සමග මල් උයනට ගොස්, තනිව ම යාච්ඤා කිරීම
  - ඔවුන් වහන්සේ තුන් වරක් අපෝස්තුලුවරුන්ට අවවාද කළ ද ඔවුන් යාච්ඤා නොකර නිදා සිටීම
  - තෙරේසා යාච්ඤාව අතපසු කොට නිදා ගැනීම
  - සිහිනය නිසා බියට පත් වී පසු ව අවදි ව යාච්ඤා කිරීම
  - හැකි සෑම අවස්ථාවක දී ම අතපසු නොකොට යාච්ඤාවේ නිරත වීම දේව දරුවෙකුගේ ලක්ෂණයක් බව

(මිනිත්තු 20)

**පියවර 2**

- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම කණ්ඩායමකට ම ඇමුණුම 1 බැගින් සපයන්න.
- සිසුන් ව කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
- අවශ්‍ය වූ විට කණ්ඩායම් සඳහා ගුරු මඟ පෙන්වීම් ලබා දෙන්න.
- කණ්ඩායම් ක්‍රියාකාරකම් තක්සේරු කර, තෙවන පියවරේ දී භාවිත කරන්න.

(මිනිත්තු 30)

පියවර 3

- එක් එක් කණ්ඩායමට තම ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න.
- පළමු ව විස්තාරණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

ගුරුවරයා පහත සඳහන් කරුණු පදනම් කරගෙන, හුණු පුවරුවේ ලියමින් හෝ වෙනත් ගුණාත්මක යෙදවුම් (පෝස්ටර්, පිටු පෙරළන, කට්ට පුවරුව යනාදිය) භාවිත කරමින්, පාඩම සාරාංශ කරන්න.

- මල් උයනේ යාච්ඤාව (මාක් 14/32-42) මගින් අපට ඉදිරිපත් කරන ප්‍රබල පණිවුඩය වන්නේ, ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවකට ම යාච්ඤාවෙන් සූදානම් විය යුතු බව
- ගෙත්සෙමනෙහි පිහිටීම
  (මෙය ජෙරුසලම් නගරයට මුහුණලා ඔලීව කන්දෙහි බටහිර බෑවුමෙහි පිහිටා තිබුණි.)
- මල් උයනේ යාච්ඤාවේ කරුණු 3ක් පෙන්නුම් කරයි.
  - i. ජේසුස් වහන්සේගේ සැබෑ මනුෂ්‍යත්වය
  - ii. දෙවියන් වහන්සේ හා ක්‍රිස්තුස් වහන්සේ අතර ඇති සබැඳියාව
  - iii. ඔවුන් වහන්සේගේ දුක්ප්‍රාප්තිය
- ජේසුස් වහන්සේ මල් උයනේ යාච්ඤාවෙන් ශක්තිය ලබා ගත් බව
- අපෝස්තුලුවරු යාච්ඤාවෙන් ශක්තිය ලබා නොගත් නිසා, පරීක්ෂාවට වැටීම (පලායාම, කණ කපා දැමීම, නාඳුනන බව පැවසීම)
- ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්ති විස්තරයෙහි ඇති වැදගත් ස්ථානයක් ගෙත්සමෙනි අත්දැකීමට හිමි වන බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :**

- ශුද්ධ බයිබලය හෝ නව ගිවිසුම (මාක් 14/32-42)
- බ්‍රිසිල් බෝඩ්, ඩිමයි කඩදාසි හා ජ්ලැටිග්නම්
- ඇමුණුම 1, 2 හා 3

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු වන ආකාරයට නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## කණ්ඩායම් ගවේෂණය සඳහා උපදෙස්

- ඔබේ කණ්ඩායමට නායකයෙකු පත් කර ගන්න.
- ඔබ එකිනෙකා අතැ'ති ශුද්ධ බයිබලයෙන් මාක් 14/32-42 කොටස හොඳින් කියවන්න.
- එහි ඇති කරුණු කණ්ඩායමේ සමාජිකයින් සමග සාකච්ඡා කරන්න.
- ''යාච්ඤාවෙන් සවිය ලබා දුර්පරීක්ෂාවෙන් ජය ගනිමු'' යන්න පිළිබඳ ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න. (ඉදිරිපත් කිරීම සඳහා බුද්ධි මණ්ඩල සාකච්ඡා, නාට්‍ය, විරිඳු, පෝසටර් යනාදි ක්‍රම භාවිතා කළ හැකි ය.)

**ඇමුණුම 2**

**නියුක්තිකරණ පත්‍රිකාව**

තෙරේසාට වයස අවුරුදු 15කි. දිනක් ඇය තම නිවස තුළ රාත්‍රී ආහාර ගැනීමෙන් අනතුරු ව රූපවාහිනිය නරඹමින් සිටියා ය. ඇයට එම ස්ථානයේ ම නින්ද ගියා ය. ඇය නින්දේ සිටින විට, සිහිනයක් දුටුවා ය. ඔලීව් ගස් වවන ලද පළතුරු වත්තක් දිස් විය. එය කඳු සහිත ප්‍රදේශයක් විය. එක්තරා කඳු ගැටයක් මතට ජේසුස් වහන්සේ මුණින් තලා වැටී යාච්ඤා කරමින් සිටි අතර, කන්ද අද්දර තැනින් තැන තිදෙනෙක් නිදා සිටින ආකාරය ද දක්නට ලැබිණි.

ඉන් එක් තැනැත්තෙක් පේදුරු ය. අනෙක් තැනැත්තන් දෙදෙනා ජාකොබ් හා ජොහාන් ය. පසු ව ඔවුන් වහන්සේ පැමිණ ඔවුන් නිදා සිටිනු දැක, පේදුරු අමතා, ''සීමොන් ඔබ නිදි ද? පැයක් වත් අවදිව සිටින්නට ඔබට නොහැකි වූයේ ද? පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න. හිත නම් කැමති ය, එහෙත් ගත දුබල ය'' යි වදාළ සේක. ඔවුන් වහන්සේ යළිත් ගොස්, යාච්ඤා කළ සේක. ඉන් පසු ව නැවතත් පැමිණ ඔවුන් නිදා සිටිනු දුටු සේක. ඔවුන්ගේ ඇස් නිදිබර ව තිබුණි. ඔවුන් තිදෙනා ම තුෂ්ණිම්භූතව එකිනෙකා දෙස බලා සිටියහ. ඔවුන් වහන්සේ නැවතත් ගොස්, පෙර සේ ම යාච්ඤා කළ සේක.

ඔවුන් වහන්සේ තෙවන වරටත් පැමිණ ඔවුන් අමතමින්, ''තවමත් නිදි ද? නැගිටින්න, අපි යමු'' යි වදාළ සේක. එකෙනෙහි ම ජුදාස් පැමිණ ජේසුස් වහන්සේ ව සිප වැළඳ ගනිමින්, ඔවුන් වහන්සේ ව සතුරන්ට පාවා දුන්නේය.

එකෙනෙහි ම තෙරේසා,'' අයියෝ, ජේසු'' යනුවෙන් පවසමින් අවදි වූවා ය. ඇය බියට පත් ව රූපවාහිනිය ක්‍රියා විරහිත කොට, ජේසුගේ ප්‍රතිමාව ඉදිරියේ දණ ගසා ''ශුද්ධ වූ පැය'' කිරීම ආරම්භ කළා ය.

**ගෙදර පරිසරයෙන්** :

දිනපතා පවුලක් ලෙස එකට යාච්ඤා කරන්න.

| | | |
|---|---|---|
| **පරිගණක වදන් සැකසුම** | : | මංගලිකා විජේරත්න මහත්මිය<br>කළමනාකරණ සහකාර 1<br>ජාතික අධ්‍යාපන ආයතනය |

**විවිධ සහය**

| | | |
|---|---|---|
| **කාර්යාලීය කටයුතු** | : | එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය<br>කළමනාකරණ සහකාර<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | ඩයස් අමරසිංහ මහතා<br>කාර්යාල ආධාරක<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | ගාමිණී රෝහණ විමලසේන මහතා<br>කාර්යාල ආධාරක<br>ජාතික අධ්‍යාපන ආයතනය |